# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1439— 2006 මාර්තු 31 වැනි සිකුරාදා — 2006.03.31

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

## තනතුරු ඇබෑර්තු

### විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය

සැපයුම් සහකාර තනතුරට බඳවා ගැනීම

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ සැපයුම් සහකාර තනතුරු 02 ක් සඳහා අදාල සුදුසුකම් සපුරා ඇති උපාධිධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

*වයස් සීමාව.*– වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රජයේ සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුක්තවූවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

*වැටුප් පරිමාණය.*– රු.1,26,600 – 6x1,560 – 8x2,220 – 5x3,480 – රු.1,71,120 රා.ප. ච. 9/2004 අනුව ටීඕ 2-5-2

*බඳවා ගැනීමේ ක්‍රමය.*– ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.

*අධ්‍යාපන සුදුසුකම් .*– පිළිගත් විශ්ව විද්‍යාලයක ගණකාධිකරණය, ව්‍යාපාර කළමණාකරණය, රාජ්‍ය පරිපාලනය, වාණිජ විද්‍යාව, රාජ්‍ය මූල්‍ය කළමණාකරණය හෝ සමාන විෂයයන් පිළිබඳ උපාධියක් ලබා තිබීම.

*වෘත්තීය හා වෙනත් සුදුසුකම් .*– පිළිගත් ආයතනයක සැපයුම් ක්‍රියාවලිය පිළිබඳව අවම වශයෙන් මාස 3ක පළපුරුද්ද හා පරිඝණක ක්ෂේත්‍රය පිළිබඳව ලබා ඇති නිපුණතාවය.

*සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.*– මෙම තනතුර ස්ථිරය, දායක විශ්‍රාම වැටුප් අරමුදල යටතේ දායක විශ්‍රාම වැටුපකට හිමිකම් ඇත. දැනටමත් විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරන අය තවදුරටත් එම විශ්‍රාම වැටුප් ක්‍රමය යටතේ ගැනෙනු ඇත. තෝරා පත් කරනු ලබන අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා බැඳී සිටියි.

*වෙනත් සුදුසුකම්.*–

1. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.
2. විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත විය යුතු ය.

*අයදුම්පත් ඉදිරිපත් කිරීම. .*– අයදුම්කරුවන් තම අයදුම්පත් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස්කර 2006.04.07 දින හෝ ඊට පෙර ලැබෙන සේ ධිලේකම්, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය, 561/3, අල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05බි යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම්පස ධිසැපයුම් සහකාර තනතුරබි යනුවෙන් සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන හෝ අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර නොමැති හෝ අසම්පූර්ණ හෝ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ. ඉල්ලුම්පත් ලද බව හෝ ප්‍රතික්ෂේප කළ බව හෝ දන්වා එවනු නොලැබේ.

එස්.රනුග්ගේ,
ලේකම්.

2006 මාර්තු මස 24 වැනි දින,
කොළඹ 5, අංක. 561/3,
ඇල්විටිගල මාවතේ,
විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

සැපයුම් සහකාර තනතුරට බඳවා ගැනීමේ අයදුම් පත්‍රය

1. i. මුලකුරු සමඟ නම :————.
   ii. සම්පූර්ණ නම :————.
2. ජාතික හැඳුනුම්පත් අංකය :————.
3. i උපන් දිනය ÷ අවුරුද්ද:————. මාසය:————. දිනය:————.
   ii 2006.04.07 දිනට වයස÷ අවුරුදු :————. මාස :————. දින :————.
4. i. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.
   ii. ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :————.
   iii. ස්ථිර ලිපිනය :————.
5. i. ජනවර්ගය :————.
   ii. ශ්‍රී ලංකා පුරවැසියෙක් ද යන වග :————.
   iii. ශ්‍රී ලංකා පුරවැසියෙක් වූයේ ලියාපදිංචි කිරීමෙන් නම් එහි අංකය÷
6. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
7. විවාහක /අවිවාහක බව :————.
8. අධ්‍යාපන සුදුසුකම් :————.
   i. උපාධියේ නම :————.
   ii. ලබාගත් වර්ෂය :————.
   iii විශ්ව විද්‍යාලයේ නම :————.
   iv ප්‍රධාන විෂයයන් :————.
   v පන්ති සාමාර්ථ ලබා ගත්තේ නම් විස්තර :————.
   vi භාෂා මාධ්‍යය :————.

................වන මම මෙහි සඳහන් කරන ලද සියලුම කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මා රජයේ සේවයෙන් පහකර හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් ආකර්යක්ෂමභාවය මත සේවයෙන් විශ්‍රාම ගන්වා හෝ නොමැති බවත් තනතුර අතහැර ගිය අයෙකුසේ සලකා හෝ නැති බවත් ප්‍රකාශ කරමි. මෙහි අන්තර්ගත කරුණු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට කලින් හෙලි වුවහොත් හා නුසුදුස්සෙකු කිරීමට යටත්වන බවත් තෝරා ගැනීමෙන් අනතුරුව එවැනි තත්ත්වයක් අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා තනතුරින් ඉවත් කිරීමට හැකි බවත් මම දනිමි.

————————,
අයදුම්කරු/කාරියගේ අත්සන.

දිනය :————.

*රජයේ සේවකයෙකු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*

--------මහතා/මහත්මිය /මෙනවියගේ අයදුම්පත්‍රය ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම අමාත්‍යාංශයේ /දෙපාර්තමේන්තුවේ ............. තාවකාලික/අනියම්/ සේවකයෙකු /සේවිකාවක ලෙස සේවය කරන බවත් මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ කළ හැකි බවත්/ නොහැකි බවත් දන්වමි.

————————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා.
(නිල මුද්‍රාව තබන්න)

03 – 615

---

### සෞඛ්‍ය අමාත්‍යාංශය

**සුහසාධක නිලධාරී තනතුරට බඳවා ගැනීම**

සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සුහ සාධක නිලධාරි තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුව පිළියෙල කරගත් අයදුම්පත් 2006.05.02 දිනට පෙර ලැබෙන සේ එවිය යුතුවේ. දැනට සේවයේ නියුතු අය තම ආයතනයේ ප්‍රධානියා මගින් තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

02. *වාර්ෂික වැටුප් ක්‍රමය* - රු. 1,83,960 - 15x3,600 - රු. 2,37,960 - සෞ. ලේ. පො. ච. 02/130/2005 අනුව.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි .*– මෙම තනතුර ස්ථිරය. දායක විශ්‍රාම වැටුප් අරමුදල යටතේ දායක විශ්‍රාම වැටුපකට හිමිකම් ඇත. 2003.01.01 දිනට පෙර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දැරූ අයෙකු මෙම තනතුරට බඳවා ගනු ලැබුවහොත්, එවැනි අයෙකුට තවදුරටත් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුපක් සඳහා හිමිකම් ඇති අතර, වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

04. *වයස් සීමාව.*– අවුරුදු 18ට නොඅඩු, අවුරුදු 40ට නොවැඩි විය යුතුය. දැනටමත් රජයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව බල නොපායි.

05. *අධ්‍යාපන සුදුසුකම් :*–

I. පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම ;

හෝ

II. සමාජ සේවා විද්‍යාලයකින් උපාධියක් ලබාතිබීම හෝ යටත් පිරිසෙයින් දෑවුරුදු පාඨමාලාවක් හදාරා සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා තිබීම ;

සහ

රජයේ දෙපාර්තමේන්තුවක හෝ රජයේ ව්‍යවස්ථාපිත ආයතනයක සමාජ සුහසාධක ක්ෂේත්‍රයේ පූර්ණ කාලීනව සේවය කිරීමෙන් ලත් වර්ෂ 05කට නොඅඩු පළපුරුද්දක් සහිත අයෙකු වීම ;

හෝ

III. භාෂාව හෝ සාහිත්‍ය, ගණිතය/අංක ගණිතය/වාණිජ අංක ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයයන් 04කින් සම්මාන සාමාර්ථයක් සහිතව, දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය/අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වීම ;

හෝ

පළමු භාෂාව, ගණිතය ඇතුළු විෂයයන් හතරකින් "බී" ශ්‍රේණියේ සාමාර්ථයක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර විභාගය සමත්වීම ;

සහ

රජයේ දෙපාර්තමේන්තුවක/රජයේ ව්‍යවස්ථාපිත ආයතනයක/සමාජ සුහ සාධක ක්ෂේත්‍රයේ තනතුරක පූර්ණ කාලීනව සේවය කිරීමෙන් ලත් වර්ෂ දොළහකට නොඅඩු පළපුරුද්දක් සහිත අයෙකු වීම.

06. *ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතු පිළිවෙල :*– අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ධිසුහ සාධක නිලධාරි තනතුරබි යනුවෙන් සඳහන් කර එය පහත සඳහන් ලිපිනයට එවිය යුතුවේ.

ඉල්ලුම්පත් හා ඊට සම්බන්ධ වෙනත් ලියුම් එවිය යුත්තේ සෞඛ්‍ය ලේකම් නමට පහත සඳහන් ලිපිනයට මිස, මෙම අමාත්‍යාංශයේ සේවයේ නියුතු වෙනත් නිලධාරියෙකු පෞද්ගලිකව අමතා නොවේ.

රංජිත් මලිගස්පේ,
ලේකම්,
සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය.

2006 මාර්තු මස 03 වැනි දින,
සෞඛ්‍ය, ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය,
සුවසිරිපාය,
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10.

ආදර්ශ අයදුම්පත්‍රය

*සෞඛ්‍ය අමාත්‍යාංශයේ සුහසාධක නිලධාරි තනතුර*

01. (අ) මුලකුරු සමග අගට යෙදෙන නම :————.
    (ආ) මුලකුරු වලින් හැඳින්වෙන නම් :————.
02. (අ) පෞද්ගලික ලිපිනය :————.
    (ආ) රාජකාරි ලිපිනය :————.
03. (අ) උපන්දිනය :————.
    (ආ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස:
    අවු. :————. මාස :————. දින :————.
04. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
05. විවාහක/අවිවාහක බව :————.
06. අධ්‍යාපන සුදුසුකම් :—.

| *විභාගය/උපාධිය* | *වර්ෂය හා ආයතනය* | *විෂයයන්* |
|---|---|---|
| | | |

අ.පො.ස. (සා. පෙළ)

| *විභාගය* | *වර්ෂය* | *විෂයයන්* |
|---|---|---|
| | | 1.<br>2.<br>3.<br>4.<br>5.<br>6. |

07. දැනට දරන තනතුරෙහි විස්තර (දැනට රාජ්‍ය සේවයේ නියුතු අය මේ කොටස සම්පූර්ණ කළ යුතුය)
    (අ) තනතුර :————. සේවය :————.
    (ආ) දෙපාර්තමේන්තුව/ආයතනය :————.
    (ඇ) පත්වීම් දිනය :————.
    (ඈ) ස්ථිර/තාවකාලික යන වග :————.
    (ඉ) තනතුරෙහි ස්ථිර කර තිබේ ද යන වග :————.
    (ඊ) තනතුරේ වැටුප් පරිමාණය හා දැනට ලබන වැටුප :————.

මෙම ඉල්ලුම්පතෙහි සපයා ඇති විස්තර සත්‍ය බව ද, නිවැරදි බව ද මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් කිසියම් විස්තරයක් අසත්‍ය බව හෝ වැරදි බව මා තනතුරෙහි පත්කිරීමෙන් පසු සොයා ගතහොත්, එයින් මා තනතුරට නුසුදුස්සෙකු වන බවත්, කිසිම වන්දියක් නොමැතිව තනතුරෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත්, මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

*අයදුම්පත් සහතික කිරීම*

..................මහතා/මහත්මිය/මෙනවිය පෞද්ගලිකව හඳුනන අයකු බවත්, මෙම ආයතනයේ ස්ථිර සේවයේ යෙදී සිටින අයකු බවත් සහතික කරමි. යම් ලෙසකින් මේ අය උක්ත තනතුර සඳහා තේරී පත්වුවහොත්, එම තනතුරෙහි වැඩ භාර ගැනීම සඳහා ඔහු/ඇය නිදහස් කිරීමට එකඟ බවත් දන්වමි. (රාජ්‍ය ආයතනයක සේවය කරන නිලධාරියෙකු නම් ඔහු නිදහස් කළ හැකි ද නැද්ද යන්න සඳහන් කළ යුතුය.)

————,
**සහතික කරන නිලධාරියාගේ අත්සන.**

නම :————.
තනතුර :————.
03-665

---

### අධ්‍යාපන අමාත්‍යාංශය

ගුරු විද්‍යාලයන්හි ගුරු අධ්‍යාපන පාඨමාලා හැදෑරීම සඳහා ගුරුවරුන් තෝරා ගැනීම – 2006

ගුරු විද්‍යාලයන්හි දෑවුරුදු ගුරු පුහුණු පාඨමාලා හැදෑරීම සඳහා සුදුසුකම් ඇති, විධිමත් පත්වීම් (අධ්‍යාපන සේවා කමිටුවේ ලේකම් හෝ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් අත්සන් කළ) ලබා රජයේ පාසල්වල සේවය කරන නුපුහුණු ගුරුවරුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අනුමත කර ඇති රජයේ අනුමත පෞද්ගලික පාසල්වල හා අනුමත පිරිවෙන් ගුරුවරුන්ට ද මේ සඳහා ඉල්ලුම් කළ හැකිය. පෞද්ගලික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සහතික කර ඇති පෞද්ගලික පාසල් නාම ලේඛනයේ ඇතුළත් පාසල් වීම අවශ්‍යය යි.

මහරගම ජාතික අධ්‍යාපන ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ දුරස්ථ/ප්‍රින්සෙට් ගුරු පුහුණු පාඨමාලා හදාරා අසාර්ථක වූ ගුරුවරුන්ට ද ගුරු විදුහල් පුහුණුව සඳහා ඉල්ලුම් කළ හැකිය. සම්මුඛ පරීක්ෂණයේ දී ඒ බව තහවුරු කිරීමේ ලිපියක් දුරස්ථ ගුරු පුහුණු බලධාරීන්ගේ අත්සනින් ඉදිරිපත් කළ යුතු වේ.

ගුරු විද්‍යාලයන්හි පවත්නා පුරප්පාඩු මත, පාසලේ වැඩ භාර ගැනීමේ ජ්‍යෙෂ්ඨතාවය පදනම් කරගෙන තෝරා ගැනීම් කෙරේ. ඉල්ලුම් නොකරන සියලු ම

---

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2006 අප්‍රේල් මස 07 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2006 මාර්තු මස 24 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

**ලක්ෂමන් ගුණවර්ධන**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.


රජයේ මුද්‍රණාලයාධිපති විසින් ප්‍රකාශ කරන ලදී.

නුපුහුණු ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා ඇති අවස්ථා අහිමි වීමට ඉඩ ඇති බව මෙයින් අවධාරණය කෙරෙන අතර ගුරු පුහුණුවට ඉල්ලුම් කිරීම සඳහා මෙයින් උනන්දු කරවනු ලැබේ. සිංහල මාධ්‍යයෙන් පුහුණුව ලැබීමේ සුදුසුකම් ලබන සංඛ්‍යාව අඩු වුවහොත් එක් ගුරු විදුහලක සියලු ම පාඨමාලා පැවැත්වීමට සලකා බලනු ඇත. එබැවින් පදිංචි ස්ථානයට ආසන්න ගුරු විදුහලක් අපේක්ෂා නොකළ යුතු ය.

මෙම පාඨමාලාව දෑවුරුදු කාලච්ඡේදයක් තුළ පැවැත්වෙන අතර, ශිෂ්‍ය ශිෂ්‍යාවන් එම අවුරුදු දෙක ගුරු විදුහලක පූර්ණකාලීනව නේවාසිකව ආයතනික පුහුණුව ලැබිය යුතු ය. නේවාසිකාගාර නොමැති නම් හෝ ඉඩකඩ ප්‍රමාණවත් නොවන්නේ නම් හෝ පමණක් ගුරු විදුහලට ඉතාම ආසන්නව නේවාසික පහසුකම් සලසා ගැනීමට ඉඩ දිය හැකිය. මේ සඳහා විදුහල්පතිගෙන් ලිඛිතව අනුමැතිය ලබා ගත යුතුය. ගුරු විද්‍යාලයන්හි පුහුණුව ලබන කාලය තුළදී වෙනත් පාඨමාලා හැදෑරීම හෝ බාහිර වෙනත් විභාගවලට පෙනී සිටීම හෝ නොකළ යුතු ය.

02. *ඇතුළත් කිරීම .*– (i) මෙම පාඨමාලා පහත සඳහන් වර්ගවලට අයත් ගුරුවරුන් සඳහා අදාළ නොවේ ;

(අ) කවර හෝ ගුරු විදුහලක දැනටමත් පුහුණුව ලබන හෝ පුහුණුව ලබා ඇති ගුරුවරුන් ;

(ආ) දුරස්ථ/ප්‍රින්සෙට් ගුරු පුහුණු පාඨමාලා හදාරමින් සිටින ගුරුවරුන් ;

(ඇ) උපාධිධාරී ගුරු පත්වීම් හෝ උපාධිධාරී අභ්‍යාසලාභී ගුරු පත්වීම් හෝ උපාධිධාරී කළමණාකරණ සහායක පත්වීම් හෝ ඒ හා සමාන කවර හෝ උපාධි පත්වීමක් ලබා ඇති ගුරුවරුන් ;

(ඈ) මෙහි අංක 7 හි සඳහන් සුදුසුකම් සපුරා නොමැති ගුරුවරුන් ;

ඉහත සඳහන් සුදුසුකම් සපුරා නොමැති අය පාඨමාලාවට ඇතුළත් වී ඇති බව දැන ගැනීමට ලැබුණු ඕනෑම අවස්ථාවක පුහුණු වන කාලය තුළ දී නම් පුහුණුව අවලංගු කරන අතර, පුහුණුවෙන් පසුව නම් ඔහුගේ හෝ ඇයගේ හෝ ගුරු පුහුණු සහතිකය අවලංගු කරනු ලැබේ.

(ii) සෑම අයදුම්කරුවෙකු විසින් ම පහත සඳහන් ලියකියවිලි ගුරු පුහුණුව සඳහා ලියාපදිංචි වීමට කැඳවන දිනයේ දී භාර දිය යුතු ය.

(අ) සම්පූර්ණ කරන ලද ඇප බැඳුම්කරය,

(ආ) ගුරු අධ්‍යාපන පාඨමාලා නිම කිරීමෙන් පසුව පත් කරනු ලබන පාසල්වල (රජයේ ගුරුවරුන් රජයේ පාසල්වල හා රජයේ නොවන ගුරුවරුන් අදාළ පාලක මණ්ඩලය යටතේ) නොකඩවා අවුරුදු 5 ක් සේවය කරන බවට රජය හෝ පාලක මණ්ඩලය සමග ඇති කරගත් ගිවිසුමක පිටපත.

(iii.) 1982 අප්‍රේල් මාසයෙන් පසුව දිස්ත්‍රික් සේවා ක්‍රමය යටතේ ගුරු පත්වීම් ලැබ පුහුණුවට ඇතුළත් වන අය ගුරු පුහුණුවෙන් පසුව ද මුල් පත්වීම ලද එම දිස්ත්‍රික්කවල ම සේවය කිරීමට යටත් වන බව ද සැලකිය යුතුය.

03. (i) ගුරු විදුහල්පති විසින් අපේක්ෂා කරනු ලබන තත්ත්වයට පැමිණීම, සාමාන්‍ය හැසිරීම හා ඉගෙනීම පිළිබඳ උද්‍යෝගිතාව දැක්වීමට අපොහොසත් වන පුහුණුව ලබන්නන් පාඨමාලාව හැදෑරීමෙන් නවතා දමනු ලැබේ. පුහුණුව ලබන ගුරුවරයකුගේ විෂය ක්‍රියාකාරකම්වලට සහභාගි වීම සහ පැමිණීම 90% කට අඩු වුවහොත් ගුරු විද්‍යාල අවසන් පරීක්ෂණයට පෙනී සිටීමට නුසුදුස්සකු වනු ඇත. එහෙත් යම් අවස්ථාවක දී විශේෂ කාරණයක් මත අධ්‍යාපන ලේකම්ගේ තීරණය අනුව මෙයට ඉඩ දිය හැකිය.

***නිවාඩු :***

(ii) ආයතනික පුහුණුව සඳහා වසර දෙකක සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු දෙනු ලැබේ. මෙම අධ්‍යයන නිවාඩු කාලය පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා සම්පූර්ණයෙන්ම යොදා ගැනීම අවශ්‍ය ය. එහෙත් ගුරු පුහුණුව ලබන්නාට අත්‍යාවශ්‍ය බවට විදුහල්පති සෑහීමකට පත් වේ නම් පමණක් සීමිත දින ගණනක් අනියම් නිවාඩු ලබාගත හැකිය. ඒ සඳහා විදුහල්පතිගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු බව අවධාරණය කරනු ලැබේ. මෙසේ ලබා ගන්නා නිවාඩුව වර්ෂයකට දින දහයක් නොඉක්මවිය යුතු ය.

අධික ලෙස නිවාඩු ගැනීමේ හේතුවෙන් පාඨමාලාව අධ්‍යයන කිරීමේ ප්‍රගතිය අසතුටුදායක බවට කිසියම් අභ්‍යාසලාභියකු පිළිබඳව විදුහල්පති වාර්තා කළහොත් පාඨමාලා අධ්‍යයනය අත්හිටුවා පාසල්වලට ආපසු යවනු ලැබේ. වෛද්‍ය නිවාඩු සඳහා රජයේ හෝ රජය පිළිගත් වෛද්‍යවරයකුගේ සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

පුහුණුවන කාලය තුළ යම් අභ්‍යාසලාභිනියක් ගර්භනී භාවයට පත්වීම ඇගේ පුහුණුවට බාධාවක් වේ යැයි ඒත්තු යන අවස්ථාවල දී ඇගේ පුහුණු කටයුතු කරගෙන යාම පිළිබඳ තීරණයක් ගැනීමේ අයිතිය අධ්‍යාපන ලේකම් සතු වනු ඇත.

04. විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන I වැනි වසර අවසාන පරීක්ෂණයෙන් සහ දෑවුරුදු ගුරු පුහුණු පාඨමාලාව සාර්ථකව නිම කිරීමෙන් පසු පවත්වනු ලබන අවසාන පරීක්ෂණයෙන් ද සමත් වන අයට ගුරු පුහුණු සහතිකය පිරිනමනු ලැබේ. මෙම සහතිකය මට්ටම් දෙකකින් නිකුත් කෙරේ :

(i) සම්මාන සාමාර්ථය,

(ii) සාමාන්‍ය සාමාර්ථය.

05. *වැටුප් පරිමාණය .*– පාඨමාලාවේ අවශ්‍යතා සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් පසු පුහුණු ගුරු සහතිකය වලංගු වන දින සිට රු. 1,09,140 – 9 x 1,320 – 8 x 1,560 – රු. 1,33,500 වැටුප් පරිමාණයෙහි (ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 වැනි පන්තියේ 1 වන ශ්‍රේණිය) පිහිටුවනු ලැබේ.

06. (i) සෑම අයදුම්කරුවකුම තමා පත්වීම ලද විෂයයෙන්ම ගුරු පුහුණුව ලැබිය යුතු ය. රජයේ පත්වීම් ලද ගුරුවරුන්ගේ පත්වීම් විෂයය, පත්වීම් ලිපියේ සඳහන් නොවන අවස්ථාවල දී තමා අ. පො. ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිට සමත්වූ විෂයයන් ගෙන් ගුරු පුහුණුව ලබා ගැනීමට ඉල්ලුම් කළ හැකි ය. ඒ සඳහා අදාළ විෂයයන් උගන්වන බවට අනුමත කාලසටහන් පිටපතක් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය. අ. පො. ස. (සාමාන්‍ය පෙළ) සුදුසුකම් මත බඳවා ගත් අයගේ පත්වීම් ලිපියේ පත්වීම් විෂයය සඳහන් නොවන විටක දී එම පත්වීම ප්‍රාථමික ගුරු පත්වීමක් ලෙස සලකා කටයුතු කරනු ලැබේ. පෞද්ගලික හා පිරිවෙන් ගුරුවරුන්ගේ, පත්වීම් ලිපිවල විෂයය සඳහන් නොවන අවස්ථාවල දී තමන් උගන්වනු ලබන විෂයය අනුව පුහුණුව සඳහා තෝරා ගැනේ. ආයතන ප්‍රධානියාගේ අත්සනින් යුත් අනුමත කාල සටහනේ පිටපතක් ඉදිරිපත් කිරීම අත්‍යාවශ්‍ය වේ.

(ii) යම් පාඨමාලාවක් සඳහා අයදුම්කරුවන් ප්‍රමාණවත් පිරිසක් ඉල්ලුම් නොකළහොත් එම පාඨමාලාව පැවැත්වීම හෝ නොපැවැත්වීම හෝ පිළිබඳව අධ්‍යාපන ලේකම් විසින් තීරණය කරනු ලැබේ.

පහත දැක්වෙන පාඨමාලාවලින් එක් පාඨමාලාවක් සඳහා පමණක් අයදුම් කළ යුතු ය. :

| *පාඨමාලාවේ අංකය* | | *පාඨමාලාවේ නම* |
|---|---|---|
| 01. | | සිංහල |
| 02. | | ප්‍රාථමික අධ්‍යාපනය |
| 03. | | සමාජ අධ්‍යයනය |
| 04. | | විද්‍යාව |
| 05. | | ගණිතය |
| 06. | | කෘෂි විද්‍යාව |
| 07. | | ගෘහ විද්‍යාව |
| 08. | | ඉංග්‍රීසි |
| 09. | | බුද්ධ ධර්මය |
| 10. | | ක්‍රිස්තියානි/රෝමානු කතෝලික ධර්මය |
| 11. | | හින්දු ධර්මය |
| 12. | | ඉස්ලාම් ධර්මය |
| 13. | | චිත්‍රකර්මය |
| 14. | | සංගීතය |
| 15. | | නැටුම් |
| 16. | | අරාබි |
| 17. | | විශේෂ අධ්‍යාපනය (සිංහල මාධ්‍යය) |
| | (අ) | ශ්‍රවණාබාධිත (බිහිරි) ළමයින්ට ඉගැන්වීමේ ක්‍රම |
| | (ආ) | දෘෂ්‍යාබාධිත (අන්ධ) ළමයින්ට ඉගැන්වීමේ ක්‍රම |
| | (ඉ) | මන්ද මානසික (බුද්ධිහීන) ළමයින්ට ඉගැන්වීමේ ක්‍රම |
| 18. | | හස්ත කර්මාන්තය හා තාක්ෂණය |
| 19. | | වාණිජ |
| 20. | | දෙමළ |
| 21. | | ශාරීරික අධ්‍යාපනය |

07. (i) *සුදුසුකම් .*– සෑම අයදුම්කරුවකුටම පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුය:–

(i) යහපත් චරිතයකින් යුක්ත වීම ;

(ii) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.

(iii) දෙවරකට නොවැඩි වාර ගණනක දී ගණිතය හා මව්බස ඇතුළුව විෂයයන් 6 කින් අ. පො. ස. (සා. පෙළ) හෝ ජා.පො.අ.ස. විභාගය සමත් වී සිටිය යුතු ය ;

(iv) රජයේ පාසල්වල සේවයේ නියුක්ත ගුරුවරුන් 2006.04.30 දින වන විට ගුරුවරුයකු ලෙස අවම වශයෙන් මාස තුනක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු ය ;

(v) සෑම අයදුම්කරුවකු ම තම පත්වීමේ ස්වභාවය මුල් පත්වීම් ලිපිය ඇසුරෙන් සනාථ කළ යුතුය.

(ii) පහත සඳහන් පාඨමාලා තෝරාගන්නා අයට ඉහත කී සුදුසුකම්වලට අමතරව මතු දැක්වෙන සුදුසුකම් ද තිබිය යුතු ය ;

(අ) *සිංහල පාඨමාලාව .*– අ.පො. ස. (උ. පෙළ) විභාගයේ දී සිංහල විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම,

*(ආ) විද්‍යා පාඨමාලාව .*–

(i) අ.පො.ස. (සා.පෙළ) පැරණි නිර්දේශයේ භෞතික විද්‍යාව, උද්භිද විද්‍යාව, ජීව විද්‍යාව, සත්ත්ව විද්‍යාව, රසායන විද්‍යාව, ගණිතය යන විෂයයන්ගෙන් දෙකකටවත් සම්මාන සාමාර්ථය හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී සම්මාන සාමාර්ථයක් ලබා තිබීම (උද්භිද විද්‍යාව හෝ සත්ත්ව විද්‍යාව හෝ සමග ජීව විද්‍යාව ගණන් නොගැනේ.); හෝ

(ii) නව නිර්දේශයේ විද්‍යාව, ගණිතය විෂයයන් සමත්වීම හා විද්‍යාවට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම ; හෝ

(iii) ඉහත සඳහන් විෂයයන්ගෙන් අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී විෂයයන් දෙකකින් සමත්වීම.

(ඇ) *ගණිතය පාඨමාලාව.*–(i) අ.පො.ස. (සා.පෙළ) පැරණි නිර්දේශයේ භෞතික විද්‍යාව, ව්‍යවහාරික ගණිතය, උසස් ගණිතය, මූලික ගණිතය.

(ii) ශුද්ධ ගණිතය, ගණිතය, විද්‍යාව යන විෂයයන්ගෙන් යටත් පිරිසෙයින් දෙකකටවත් හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී සම්මාන සාමාර්ථයන් දෙකක් ලබා තිබීම ; හෝ

(iii) අ.පො.ස. (සා.පෙළ) නව නිර්දේශයේ ගණිතය හා විද්‍යාව සමත්වීම හා ගණිතය විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම ; හෝ

(iv) ඉහත සඳහන් විෂයයන්ගෙන් අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී විෂයයන් දෙකකින් සමත්වීම.

(ඈ) *කෘෂි විද්‍යාව පාඨමාලාව.*– (i) පැරණි නිර්දේශයේ අ.පො.ස. (සා.පෙළ) හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී කෘෂිකර්මය, රසායන විද්‍යාව, උද්භිද විද්‍යාව, සත්ත්ව විද්‍යාව යන විෂයයන්ගෙන් එකකට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම ; හෝ

(ii) අ.පො.ස.(සා.පෙළ) නව නිර්දේශයේ විද්‍යාව හා කෘෂි විද්‍යාව සමත්වීම හා කෘෂි විද්‍යාවට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම ; හෝ

(iii) අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී කෘෂිකර්මය, රසායන විද්‍යාව, උද්භිද විද්‍යාව, සත්ත්ව විද්‍යාව යන විෂයයන් ගෙන් එකක් සමත්වී තිබීම ; හෝ

(iv) ජා.පො.අ.ස. විභාගයේ දී නම් ඉහත සඳහන් විෂයයකට "ඒ " හෝ " බී " සාමාර්ථයක් ලබා තිබීම (ප්‍රාග් වෘත්තීය විෂයයක් නම් විෂයය කුමක්දැයි විදුහල්පති සහතික කළ ලිපියක් අවශ්‍යයි); හෝ

(v) කෘෂිකර්මය සම්බන්ධයෙන් රජයේ ගොවිපළක මාස 06 කට නොඅඩු කාලයක පුහුණුවක් ලබා තිබීම.

(ඉ) *ගෘහ විද්‍යාව පාඨමාලාව .*– (i) අ.පො.ස.(සා.පෙළ) විභාගයේ දී හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී ගෘහ විද්‍යාව, මැහුම් වැඩ යන විෂයයන්ගෙන් එකකට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම ; හෝ

(ii) අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී ගෘහ විද්‍යාව විෂයය සමත්ව තිබීම ; හෝ

(iii) ජා.පො.අ.ස. විභාගයේ දී ඉහත කී විෂයයනට ඒ හෝ බී සාමාර්ථය ලබා තිබීම (ප්‍රාග් වෘත්තීය විෂයයක් නම් විෂය මොනවාදැයි විදුහල්පති සහතික කළ ලිපියක් අවශ්‍යයි) ; හෝ

(iv) රජයේ කාර්මික විදුහලක වසරකට නොඅඩු කාලයක් ගෘහ විද්‍යාව හදාරා ලබාගත් සහතිකයක් තිබීම.

(ඊ) *ඉංග්‍රීසි පාඨමාලාව .*–(i) දැනට ඉංග්‍රීසි ගුරු පත්වීමක් ලබා තිබීම ; හෝ

(ii) ඉංග්‍රීසි (i), (ii) හෝ (iii) පෙළ ගුරු සහතික පත්‍රය ලබා දැනට සේවයේ යෙදී සිටීම ; සහ

(iii) අ.පො.ස.(සා.පෙළ) හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ලන්ඩන් සාමාන්‍ය පෙළ විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට හෝ ඉංග්‍රීසි සාහිත්‍යයට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම ; හෝ

(iv) ඊට උසස් විභාගයකින් ඉංග්‍රීසි විෂයය සමත්ව තිබීම.

(උ) *ආගම පාඨමාලාව .*–(i) බුද්ධ ධර්මය, රෝමානු කතෝලික ධර්මය, හින්දු ධර්මය, ඉස්ලාම් ධර්මය යන පාඨමාලාවන් සඳහා ඉල්ලුම් කරන අය තමා හැදෑරීමට බලාපොරොත්තු වන ආගම විෂයයට අ.පො.ස.(සා.පෙළ) හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී සම්මාන සාමාර්ථයක් ලබා තිබීම ; හෝ

(ii) ජා.පො.අ.ස. විභාගයේ දී ආගම විෂයයට 'ඒ 'හෝ 'බී ' සාමාර්ථයක් ලබා තිබීම ; හෝ

(iii) ඉහත 1 හි සඳහන් විෂයයකින් හෝ ඊට අදාළ විෂයයකින් අ.පො.ස.(උ.පෙළ) විභාගයෙන් සාමාර්ථයක් ලබා තිබීම.

(ඌ) *චිත්‍රකර්ම පාඨමාලාව.*– (i) රජයේ ලලිත කලායතනයේ සහතික පත්‍රය (චිත්‍රකර්මය පිළිබඳ තුන් අවුරුදු පාඨමාලාව); හෝ

(ii)චිත්‍ර කර්ම (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) ගුරු සහතික පත්‍රය; හෝ

(iii) අ.පො.ස.(සා.පෙළ) හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී චිත්‍ර කර්ම විෂයය සඳහා සම්මාන සාමාර්ථයක්; හෝ

(iv) ජා. පො.අ.ස. විභාගයේ දී චිත්‍ර කර්මය විෂයයට "ඒ " හෝ "බී " සාමාර්ථය (සෞන්දර්ය විෂය කුමක්දැයි විදුහල්පති සහතික කළ ලිපියක් අවශ්‍යයි) ලබා තිබීම ; හෝ

(v)අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී චිත්‍ර කර්ම විෂයය සඳහා සාමාර්ථයක් ලබා තිබීම.

(එ) *සංගීතය පාඨමාලාව.*– (i) ලංකා ගාන්ධර්ව සභාවේ සංගීතය පිළිබඳ අවසාන/මධ්‍යම සහතික පත්‍රය හෝ පෙරදිග සංගීත විභාගයේ හෝ ජාතික සංගීත විභාගයේ ප්‍රථම විභාගය ; හෝ

(ii)රජයේ සංගීත විදුහලේ අන්තර් මාධ්‍ය සහතික පත්‍රය; හෝ

(iii) උත්තර ලංකා පෙරදිග සංගීත ගුරුවරුන්ගේ සංගමයේ සංගීතය පිළිබඳ සහතික පත්‍රය (5 වැනි ශ්‍රේණිය); හෝ

(iv) පිළිගත් ඉන්දීය සංගීත ආයතනයක සංගීතය පිළිබඳ අන්තර් මාධ්‍ය සහතික පත්‍රය; හෝ

(v)අ.පො.ස.(සා.පෙළ) හෝ ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයේ දී සංගීතය විෂයයට සම්මාන සාමාර්ථයක් ; හෝ

(vi) අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී සංගීත විෂයයට සාමාර්ථයක් ; හෝ

(vii) ජා.පො.අ.ස. විභාගයේ දී සංගීත විෂයයට "ඒ" හෝ "බී" සාමාර්ථය (සෞන්දර්ය විෂය කුමක්දැයි විදුහල්පති සහතික කළ ලිපියක් අවශ්‍යයි) ලබා තිබීම.

(ඒ) *නැටුම් පාඨමාලාව.*– (i) ලංකා ගාන්ධර්ව සභාවේ නැටුම් පිළිබඳ අවසාන/මධ්‍යම සහතික පත්‍රය හෝ පෙරදිග නැටුම් විභාගයේ හෝ ජාතික නැටුම් විභාගයේ ප්‍රථම විභාගය ; හෝ

(ii)රජයේ නැටුම් විදුහලේ අන්තර් මාධ්‍ය සහතික පත්‍රය; හෝ

(iii) පිළිගත් ඉන්දීය නැටුම් ආයතනයක අන්තර් මාධ්‍ය සහතික පත්‍රය ; හෝ

(iv) අ.පො.ස.(සා.පෙළ) හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී නැටුම් විෂයය සඳහා සම්මාන සාමාර්ථය; හෝ

(v) අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී නැටුම් විෂයය සඳහා සාමාර්ථයක් ; හෝ

(vi) ජා.පො.අ.ස. විභාගයේ දී නැටුම් විෂයය සඳහා 'ඒ 'හෝ 'බී ' සාමාර්ථයක් (සෞන්දර්ය විෂයය කුමක්දැයි විදුහල්පති සහතික කළ ලිපියක් අවශ්‍යයි) ලබා තිබීම.

(ඔ) *අරාබි පාඨමාලාව .*– (i) විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අල් ආලීම් ප්‍රාරම්භක පරීක්ෂණයේ I වැනි හා II වැනි පරීක්ෂණය සමත්වීම හෝ අ.පො.ස.(සා.පෙළ) විභාගයේ දී අරාබි විෂයයට සාමාර්ථයක් ලබා තිබීම ; හෝ

(ii)පිළිගත් මද්රසා ආයතනයක අවසාන පරීක්ෂණයෙන් සමත් වීම.

මේ සඳහා මද්රසා ආයතන පහත සඳහන් වේ :

01. බහිජතුල් ඊබ්‍රාහිමියා අරාබි විදුහල, කොටුව, ගාල්ල
02. ගෆූරියා අරාබි විදුහල, මහරගම
03. මද්රසතුල් බාරි අරාබි විදුහල, වැලිගම
04. කාසිමියා අරාබි විදුහල, පුත්තලම
05. නද්වතුල් උලමා අරාබි විදුහල, මුත්තූර්
06. නැගෙනහිර ලංකා අරාබි විදුහල, අඩ්ඩාලච්චේන
07. මදාසතුල්පුලා අරාබි විදුහල, කාත්තන්කුඩි
08. මුස්ලිම් කාන්තා අරාබි විදුහල, කල්එළිය
09. මද්රසතුල් ජිජ්රියා අරාබි විදුහල, ගාල්ල
10. හිදාදියා අරාබි විදුහල, මාදම්පේ
11. නද්වතුල් බුහාරි අරාබි විදුහල, කින්නියා
12. මද්රසතුල් නූර්නියා අරාබි විදුහල, කොටුවේගොඩ, මාතර
13. මක්කියා අරාබි විදුහල, ගාල්ල හෝ
14. වෙනත් පිළිගත් ආයතනයක් (සම්මුඛ පරීක්ෂණයේ දී පිළිගත් ආයතනයක් බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.)'

(iii) ඉහත දැක්වෙන (i) සහ (ii) හි සඳහන් සුදුසුකම් සහිතව වෙනත් ගුරු පත්වීම් ලබාසිටින ගුරුවරුනට ද මෙම පාඨමාලාව සඳහා ඉල්ලුම් කළ හැකිය.

(ඕ) *විශේෂ අධ්‍යාපන පාඨමාලාව (සිංහල මාධ්‍යය).*–මෙම පාඨමාලාවේ අංශ තුනකි :

(i) දෘෂ්‍යාබාධිත (අන්ධ) ළමයින්ට ඉගැන්වීම,

(ii)ශ්‍රවණාබාධිත (බිහිරි) ළමයින්ට ඉගැන්වීම,

(iii) මන්ද මානසික (මන්ද බුද්ධික) ළමයින්ට ඉගැන්වීම.

තමන් කැමති අංශය අයදුම්පතෙහි සඳහන් කළ යුතු ය. තෝරා ගැනීමේ දී ඉංග්‍රීසි දැනුම තිබෙන අය පිළිබඳව විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ.

(ක) *හස්ත කර්මාන්ත හා තාක්ෂණ කුසලතා පාඨමාලාව .*

(i) අ.පො.ස.(සා.පෙළ) හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී –

ලී වැඩ
ලෝහ වැඩ
විවීම්
මැටි ශිල්පය
මෝටර් කාර්මික ශිල්පය
ගුවන් විදුලි කාර්මික ශිල්පය
පෙදරේරු ශිල්පය

යන විෂයයන්ගෙන් එක් විෂයකට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම; හෝ

(ii) ජා.පො.අ.ස. විභාගයේ දී නම් අදාළ විෂයයෙන් 'ඒ 'හෝ 'බී ' සාමාර්ථයක් ලබා තිබීම (ප්‍රාග් වෘත්තීය විෂයය කුමක්දැයි විදුහල්පතිගේ සහතිකයක් අවශ්‍යය); හෝ

(iii) රජයේ කාර්මික විද්‍යාලයක හෝ රජයේ දෙපාර්තමේන්තුවක් යටතේ පවත්වන අවුරුද්දකට නොඅඩු පුහුණු පාඨමාලාවක් සාර්ථක ලෙස හදාරා ලබාගත් පුහුණු සහතිකයක් තිබීම.

(ග) *වාණිජ පාඨමාලාව .*– (i) අ.පො.ස.(සා.පෙළ) හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී ආර්ථික විද්‍යාව, වාණිජ විද්‍යාව, ගණකාධිකරණය, යතුරු ලියනය, ලඝු ලේඛනය, වාණිජ්‍යය හා මූල්‍ය, යන විෂයයන්ගෙන් දෙකකට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම ; හෝ

(ii)අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී ඉහත සඳහන් විෂයයන් දෙකක් සමත්ව තිබීම; හෝ

(iii) රජයේ කාර්මික විද්‍යාලයක එක් අවුරුදු වාණිජ්‍යය පාඨමාලා සහතිකය ලබා තිබීම.

*(ජ) දෙමළ පාඨමාලාව.-*

(i) අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී දෙමළ විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

*(ට) ශාරීරික අධ්‍යාපන පාඨමාලාව.-*

(i) දැනට ශාරීරික අධ්‍යාපනය පිළිබඳ ගුරු පත්වීමක් ලබා තිබීම.

*(ඩ) සමාජ අධ්‍යයන පාඨමාලාව.–*

(i) සමාජ අධ්‍යයනය විෂයයට අ.පො. ස. (සා.පෙ) විභාගයේ දී සම්මාන සාමාර්ථයක් ලබා තිබීම ; හෝ

(ii)ජා. පො. අ. ස. විභාගයේ දී සමාජ අධ්‍යයනය විෂයයෙන් 'ඒ 'හෝ ' බී' සාමාර්ථයක් ලබා තිබීම ; හෝ

(iii) භූගෝල විද්‍යාව, ඉතිහාසය, ආර්ථික විද්‍යාව, දේශපාලන විද්‍යාව යන විෂයයන් අතුරින් අවම වශයෙන් විෂයයන් දෙකක් සඳහාවත් අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී සාමාර්ථ්‍යතාව ලබා තිබිය යුතු ය.

08. අධ්‍යක්ෂ පාලිත පාසලක අනුමත ගුරු මණ්ඩලයක සේවය කරන හෝ පිළිගත් පෞද්ගලික පාසලක ස්ථිර ගුරු මණ්ඩලයක සේවයේ නියුක්ත සාමාන්‍ය පංතිවල සතියකට පැය 20 ක් ඉගැන්වීම් කරන ගුරු භවතුන් අතුරෙන් සීමිත සංඛ්‍යාවක් පුහුණුව සඳහා තෝරා ගනු ලැබේ.

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන පාසල් පෞද්ගලික පාසල් වශයෙන් සළකනු ලැබේ :

(i) 1951 වර්ෂයේ දී ගාස්තු අය කිරීමේ පාසල් බවට පත්වූ උපකෘත පාසල්.

(ii) 1960.12.01 වැනි දිනට ගාස්තු අය නොකරන පෞද්ගලික පාසල් බවට පත් වූ පාසල්.

(iii) අධ්‍යාපන අමාත්‍යාංශය විසින් (ප්‍රාදේශීය/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ නොවේ.) අනුමත කර ඇති පෞද්ගලික පාසල් හා පිරිවෙන්.

සියලුම පෞද්ගලික පාසල්වල සේවය කරන අයදුම්කරුවන්ට 2006.04.30 වැනි දිනට අවම වශයෙන් අවුරුද්දක අඛණ්ඩ සේවයක් තිබිය යුතු අතර, ඔවුන්ගේ පළමු පත්වීමේ ලිපිය හා අදාළ ගුරු භවතා අනුමත ගුරු මණ්ඩලයට අයත් බවට සහතික කරන ලද ලිපියක් අදාළ පළාත්/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබා ගෙන සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

පිරිවෙන්වලින් ඉදිරිපත් වන ගුරු භවතුන්ට 2006.04.30 වැනි දිනට අවම වශයෙන් අවුරුදු දෙකක (02) සේවයක් තිබිය යුතු ය. 1959 පිරිවෙන් පනත හෝ 1979 අංක 64 දරන පනත යටතේ අනුමත සේවය මේ සඳහා ගණන් ගනු ලැබේ.

දැනට පිරිවෙන්වලින් ඉදිරිපත් වන ගුරු භවතුන්ට ඉල්ලුම් කළ හැක්කේ සිංහල, විද්‍යාව, ගණිතය, ඉංග්‍රීසි හා බුද්ධ ධර්මය යන පාඨමාලාවන්ට පමණි. (පත්වීම ලද විෂයයෙන් ම ගුරු පුහුණුව ලැබිය යුතු ය.) විද්‍යායතන පිරිවෙන් වල උගන්වන අනුමත ගුරුවරුන්ට පමණක් මීට අමතරව සංගීතය, චිත්‍ර, නැටුම්, වාණිජ්‍ය, ශාරීරික අධ්‍යාපනය සහ කෘෂිවිද්‍යාව යන පාඨමාලා සඳහා ඉල්ලුම් කළ හැකි ය.

සියලුම පෞද්ගලික පාසල් ගුරුවරුන් පාලක මණ්ඩලයේ කළමණාකරුගෙන් ද, පිරිවෙන් ගුරුවරුන් කෘත්‍යාධිකාරීන්ගෙන් ද පහත සඳහන් කරුණුවලට අදාළ ප්‍රකාශ පත්‍රයක් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය :

(i) පුහුණුවන කාලයේ දී ගුරු භවතා සේවයෙන් නිදහස් කළ හැකි බවට,
(ii) පුහුණුවන කාලය තුළ ගුරු භවතාට වැටුප් ගෙවන බවට,
(iii) පුහුණුව අවසානයේදී පාලක මණ්ඩලය විසින් අදාළ ගුරු භවතා නැවත සේවයේ යොදවා ගන්නා බවට,
(iv) පුහුණුව සඳහා තෝරා ගන්නා පිරිවෙන් ගුරු භවතුන් වෙනුවට වෙනත් ගුරු භවතුන් නොඉල්ලන බවට හා ඔහුගේ වැඩ කොටස අනුමත ගුරු මණ්ඩලය අතර බෙදා දෙන බවට.

පෞද්ගලික පාසල් හා පිරිවෙන්වලින් තෝරා ගන්නා ගුරුවරුන් පුහුණුව සඳහා ලියාපදිංචි වීමට පෙර "පුහුණුවෙන් පසු රජයේ පාසල්වල රැකියා නොඉල්ලන බවට" පොරොන්දු පත්‍රයකට අත්සන් තැබිය යුතු ය.

පෞද්ගලික පාසල්වලින් ඉදිරිපත් වන ගුරුවරුන් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අත්සන් කළ මුල් පත්වීම් ලිපි ඉදිරිපත් කළ යුතු ය. වයස අවුරුදු 18 ට පෙර පත්වීම් ලබා සිටින ගුරුවරුන්ගේ පත්වීම් දිනය ගණන් ගැනෙනුයේ අවුරුදු 18 සම්පූර්ණ වූ දින සිටය. වෙනත් නිලධාරියකු මෙම පත්වීම් ලිපිය අත්සන් කර ඇත්නම් අදාළ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සත්‍ය බවට සහතික කර තිබිය යුතු ය.

09. *තෝරා ගැනීම සඳහා ඉල්ලුම් කිරීම :*

(i) මෙම *ගැසට්* නිවේදනයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව අපේක්ෂකයා විසින් පිළියෙල කරන ලද අයදුම්පතක් සම්පූර්ණ කොට එමගින් ඉල්ලුම් කළ යුතු ය.
 *(අ)* ගුරු අධ්‍යාපන පාඨමාලාව හැදෑරීමට අපේක්ෂා කරන මාධ්‍යයෙන් අයදුම්පත්‍රය ඉදිරිපත් කළ යුතු ය ;
 *(ආ)* ආකෘති පත්‍රය 8" × 12" කඩදාසියක දෙපැත්තේ පිළියෙල කළ යුතු ය;
 *(ඇ)* කිසිම කොටුවක් වෙනස් කිරීම හෝ ඉවත් කිරීම නොකළ යුතු ය. කොටු අතර ඉඩ ප්‍රමාණය සැලකිල්ලෙන් වෙන් කළ යුතු අතර එකිනෙකට ගොඩ ගැසෙන සේ පිළියෙල නොකළ යුතු ය.

(ii) අයදුම්කරු විසින් අයදුම්පත්‍රය නොඅඩුව හා නිවැරදිව පිරවිය යුතු ය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. පහත සඳහන් කරුණු කෙරෙහි අයදුම්කරුවන්ගේ අවධානය යොමු කරවනු ලැබේ:
 *(අ)* සෑම අයදුම්කරුවෙකුම තම නම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇති පරිදිම සඳහන් කළ යුතු ය;
 *(ආ)* තම පාසලේ ප්‍රධානියා මගින් අයදුම්පත්‍ර ඉදිරිපත් කළ යුතු ය. පාසලේ ප්‍රධානියකු ඉල්ලුම් කරන්නේ නම් කොට්ඨාස/කලාප භාර අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් ඉදිරිපත් කළ යුතු ය;
 *(ඇ)* යාපනය දිස්ත්‍රික්කයේ නුපුහුණු ගුරුවරුන්ගේ අයදුම්පත්‍ර (ඉංග්‍රීසි ද ඇතුළුව) විදුහල්පති, ගුරු විදුහල, කෝපායි යන ලිපිනයට ද, දෙමළ මාධ්‍යයෙන් ඉල්ලුම් කරන මඩකලපුව, ත්‍රිකුණාමලය, අම්පාර දිස්ත්‍රික්කවල නුපුහුණු ගුරුවරුන්ගේ අයදුම්පත්‍ර (ඉංග්‍රීසි හැර) විදුහල්පති, ගුරු විදුහල, මඩකලපුව ලිපිනයට ද, දෙමළ මාධ්‍යයෙන් ඉල්ලුම් කරන මන්නාරම, කිලිනොච්චිය, වව්නියාව, මුලතිව් දිස්ත්‍රික්කයන්හි නුපුහුණු ගුරුවරුන්ගේ අයදුම්පත්‍ර (ඉංග්‍රීසි හැර) පීඨාධිපති, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය, වව්නියාව ලිපිනයට ද යැවිය යුතු ය ;
 *(ඈ)* ඉහත සඳහන් දිස්ත්‍රික්කවල හැර අනෙකුත් දිස්ත්‍රික්කවල සියලුම දෙමළ මාධ්‍ය අයදුම් පත්‍ර හා සියලුම සිංහල මාධ්‍යය අයදුම්පත්‍ර (ඉංග්‍රීසි ද ඇතුළුව) හා මඩකලපුව, ත්‍රිකුණාමලය, මන්නාරම, කිලිනොච්චිය, වව්නියාව, මුලතිව් දිස්ත්‍රික්කවල අයදුම්කරු-වන්ගේ ඉංග්‍රීසි පාඨමාලාවේ අයදුම්පත්‍ර ද ප්‍රධාන කොමසාරිස්, ගුරු අධ්‍යාපන පරිපාලන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල යන ලිපිනයට එවිය යුතු ය;
 *(ඉ)* සියලුම අයදුම් පත්‍ර 2006.05.10 වැනි දින හෝ එයට පෙර ලියාපදිංචි තැපැලෙන් අදාළ ලිපිනයන්ට එවිය යුතු ය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ගුරු පුහුණුව සඳහා තෝරා ගැනීම – 2006, පාඨමාලාව:................, මාධ්‍යය:.........................., දිස්ත්‍රික්කය:......................සඳහන් කරන්න;
 *(ඊ)* ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලබන අතර,
  (i) අයදුම් පත්‍රය ලැබුණු බවට දන්වනු නොලැබේ.
  (ii) අයදුම් පත්‍රයට සෙසු ලියවිලි අමුණා නොඑවිය යුතු ය.
  (iii) සුදුසුකම් පරීක්ෂා කිරීමට පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතික හා ලිපි ලේඛනවල මුල් පිටපත් සහ සහතික කළ ඡායාපිටපත් ඉදිරිපත් කිරීමට සූදානම්ව සිටිය යුතු ය.

ආරියරත්න හේවගේ,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2006 මාර්තු මස 09 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

## ආදර්ශ අයදුම් පත්‍රය

(8" × 12" කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගන්න.)

***අධ්‍යාපන අමාත්‍යාංශය***

*ගුරු අධ්‍යාපන පාඨමාලා හැදෑරීම සඳහා ගුරුවරුන් තෝරා ගැනීම – 2006*

01. මාධ්‍යය :—
02. මුල් පත්වීමේ ලිපිය අනුව පාසලේ වැඩ භාරගත් දිනය:
03. පාඨමාලාව :
04. මුල් පත්වීමේ ස්වභාවය: (විෂයය සඳහන් කරන්න)
05. ඔබ දුරස්ථ ගුරු පුහුණුව ලැබුවේ නම්,
 (i) පාඨමාලාව :————————,
 (ii) වර්ෂය :————————,
 (iii) අවසාන විභාග ප්‍රතිඵල :————————,
06. සම්පූර්ණ නම :——————, (පෙළපත් නාමය මුලට)
07. මුලකුරු සමග නම :————, හිමි/මයා/මිය/මෙනවිය.
 (භාවිතා කරන ආකාරයට)
08. ස්ත්‍රී /පුරුෂ භාවය :
09. රාජකාරි ලිපිනය :————,
10. සේවය කරන පාසලේ වර්ගය: (රජයේ ද/වතු පාසල් ද/පිරිවෙන් ද/අනුමත පෞද්ගලික පාසල් ද යන වග)
11. පෞද්ගලික ලිපිනය :————,
 පෞද්ගලික දුරකථන අංකය/ඇමතුමක් දියහැකි දුරකථන අංකය
12. (i) උපන් දිනය :————,
 (ii) 2006.04.30 වැනි දිනට වයස :
  අවුරුදු :————, මාස :————, දින :————,
13. සේවය කරන පාසල අයත්,
 (i) දිස්ත්‍රික්කය :
 (i) කලාප අධ්‍යාපන කාර්යාලය :
14. අධ්‍යාපන සුදුසුකම්:
 (i) අ.පො.ස.(සා.පෙළ) / ජා.පො.අ.ස. විභාග ප්‍රතිඵල:

| | | |
|---|---|---|
| විභාග අංකය : | | |
| වර්ෂය : | | |
| *සාමාර්ථය ලත් විෂයයන්* | *ලබාගත් ශ්‍රේණිය* | |
| | *පළමුවර* | *දෙවැනි වර* |
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |
| 6. | | |
| 7. | | |
| 8. | | |

 (ii) අ.පො.ස.(උ.පෙළ) ප්‍රතිඵල :

| | | |
|---|---|---|
| විභාග අංකය : | | |
| වර්ෂය : | | |
| *සාමාර්ථය ලත් විෂයයන්* | *ලබාගත් ශ්‍රේණිය* | |
| | *පළමුවර* | *දෙවැනි වර* |
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |

 (iii) ඉල්ලුම් කරන පාඨමාලාවට අදාළ යම් අමතර අධ්‍යාපන සුදුසුකම් :

| *ආයතන* | *විෂයය* | *කාලසීමාව* | *සහතිකය* |
|---|---|---|---|
| | | | |

15. *සේවා විස්තරය :*

| *සේවය කළ පාසල* | *සේවා කාලය* | *දුෂ්කර ද නැද්ද යන වග* |
|---|---|---|
| | | |

මෙහි සපයා ඇති තොරතුරු සත්‍ය බව සහතික කරමි. අසත්‍ය තොරතුරු සපයා ඇති බව ඔප්පු වුවහොත් පුහුණුවන කාලයේ දී ඒ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් ගනු ලබන තීරණය පිළිගනිමි. පාසලේ ගුරු සහ සිසු සංඛ්‍යාව අනුව ද සේවයේ අවශ්‍යතාවය අනුව ද මා තෝරා ගැනීම හෝ නොගැනීම තීරණය වන බව ද මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

ගුරුවරයෙකු සම්බන්ධයෙන් විදුහල්පති විසින් ද විදුහල්පතිවරයෙකු සම්බන්ධයෙන් නම් කලාප භාර නි.අ.අ. විසින් ද පහත කොටස සම්පූර්ණ කළ යුතු ය:
 (i) දැනට ගුරු මණ්ඩලයේ සිටින ගුරුවරුන්ගේ සංඛ්‍යාව:————,
 (ii) ශිෂ්‍ය සංඛ්‍යාව :————,
 (iii) අයදුම්කරු ගුරු පුහුණුව සඳහා නිදහස් කළහොත් ශිෂ්‍ය සංඛ්‍යාව අනුව පාසලේ සිටින ගුරු භවතුන් සංඛ්‍යාව ප්‍රමාණවත් ද ? :————.

අයදුම්කරු මගේ පාසලේ/කලාපයේ ගුරුවරයෙකු/විදුහල්පතිවරයෙකු බවත්, ඔහු/ඇය ............................ දින මුල් පත්වීම අනුව ....................................දින වැඩ භාර ගෙන ඇති බවත් .................................... දින සිට .................................. මේ දක්වා මෙම පාසලේ සේවය කරන බවත් මෙම ඉල්ලුම් පත්‍රයේ සඳහන් විස්තර ම විසින් පරීක්ෂා කර බලන ලදුව සත්‍ය බවත් සහතික කරමි.

————,
විදුහල්පති/කලාප භාර නි.අ.අ.ගේ අත්සන.

නිල මුද්‍රාව :————.
දිනය :————.

03-668

---

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

### නිලධාරි පුරප්පාඩු (නිත්‍ය/ස්වේච්ඡා)

ශ්‍රී ලංකා නිත්‍ය/ස්වේච්ඡා ගුවන් හමුදාවේ පහත සඳහන් ශාඛාවන් හි ඉදුරාම අධිකාරියට පත්කොට බඳවා ගැනීම සඳහා පුරප්පාඩු පවතී :
 (*අ*) කාර්මික සංඥා ශාඛාව (නිත්‍ය),
 (*ආ*) උපකරණ ශාඛාව (නිත්‍ය/ස්වේච්ඡා),
 *(ඇ)* පරිපාලන රෙජිමේන්තු ශාඛාව තූර්ය වාදක නිලධාරි (නිත්‍ය),
 (*ඈ*) ගුවන් තොටුපල නිර්මාණ ශාඛාව (නිත්‍ය),
 (*ඉ*) වෛද්‍ය ශාඛාව (නිත්‍ය/ස්වේච්ඡා),
 (*ඊ*) දන්ත වෛද්‍ය ශාඛාව (නිත්‍ය/ස්වේච්ඡා).

2. පහත සඳහන් වෘත්තීය සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන්/ අපේක්ෂිකාවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ :

අ. *විද්‍යුත් හා විදුලි කාර්මික සංඥා ශාඛාව* :
 (1) *විද්‍යුත් හා විදුලි සංඥා ඉංජිනේරු නිලධාරීන්* .- විද්‍යුත්/විදුලි සංනිවේදන විද්‍යාවේදී උපාධියක් හෝ විද්‍යුත්/ විදුලි සංනිවේදන පිළිබඳව ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (එන්. ඩී. ටී.) හෝ ඒ හා සමාන සුදුසුකම් තිබීම ;
 (2) *පරිගණක විශ්ලේෂක/පරිගණක වැඩසටහන් සම්පාදක.–* පරිගණක විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් හෝ පරිගණක විද්‍යාව විෂය ඇතුළත් විද්‍යාවේදී උපාධියක් හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් තිබීම( පරිගණක විශ්ලේෂකයකු ලෙස හෝ පරිගණක වැඩසටහන් සම්පාදකවරයෙකු ලෙස ක්‍රියා කර ඇත්නම් එය විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.);

*හෝ*

එක් වතාවකදී අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් අතිරේක හා වෛකල්පික විෂයයන් හැර අවම වශයෙන් සම්මාන 04 ක් සහිතව විෂයයන් 06 ක් සමත් විය යුතු අතර ගණිතයට (1999-2000 වසරවල අයදුම්කරුවෙක් නම් ගණිතය 11) හා ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් සහ විද්‍යාව (1999-2000 වසර වල අයදුම්කරුවෙක් නම් විද්‍යාව 11) සිංහල/දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා සිටිය යුතුයි. තවද එක් වතාවකදී අ.පො.ස.((උ.පෙළ) විභාගයෙන් (පැරණි/නව නිර්දේශය ) භෞතික විද්‍යා විෂයයන් තුනකින් සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම;

*සහ*

ජාතික ආධුනිකත්ව මණ්ඩලයේ ඩිප්ලෝමාව/බී. සී. එස්. හි පළමු කොටස හෝ ඉහළ සුදුසුකම් (ඒ.සී.එස්) හි අදියර 04 ම සම්පූර්ණ කර තිබීම හෝ වැඩ සටහන් සම්පාදකයෙකු ලෙස වසර 02 ක අදාළ ක්ෂේත්‍රයන්හි සේවා පළපුරුද්දක් තිබීම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ. (Developer 2000 or Visual Basic for Oracle RDBMS or Java or C++ or any visual language ) යන විෂයයන් සමත් වීම ප්‍රමුඛත්වයට හේතු වේ.

*(ආ)* *උපකරණ ශාඛාව* :
 *භෝජනාගාර කළමණාකරු.–*
 (1) ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණය පිළිබඳ ආයතනයේ උපාධියක් (පැරණි ශ්‍රී ලංකා හෝටල් පාසල) හෝ ඒ හා සමාන දේශීය / විදේශීය ආයතනයක හෝටල් හා ආහාර කළමනාකරණය පිළිබඳ සහතිකයක්. තරු පංති හෝටලයක මුළුතැන්ගෙයි හෝ ආහාරපාන අංශයේ විධායක මට්ටමේ වසර දෙකක පූර්ණකාලීන පළපුරුද්දක් තිබිය යුතුය;

හෝ

 (2) හෝටල් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා සහතිකයක් හා දේශීය/විදේශීය ආයතනයක හදාරන ලද කාණ්ඩ 04 කින් සමන්විත පූර්ණකාලීන ආගන්තුක සත්කාර පිළිබඳ මූලික පාඨමාලාවක් හදාරා තිබීම හා තරු පංති හෝටලයක ආහාරපාන අංශයේ භෝජනාගාර හා ආහාර කළමනාකරණය පිළිබඳ වසර දෙකක පළපුරුද්දක් තිබිය යුතුය.

*(ඇ) පරිපාලන රෙජිමේන්තු ශාඛාව (තූර්ය වාදක නිලධාරි)*
 (1) තූර්ය වාදක නිලධාරි නර්තන කණ්ඩායම:
  *(අ)* එක් වතාවකදී අ.පො.ස(සා.පෙළ) විභාගයෙන් සංගීතය හා ඉංග්‍රීසි භාෂාව ඇතුළත්ව අවම වශයෙන් සම්මාන 04ක් සහිතව විෂයයන් 06 ක් සමත් විය යුතුය;
  *(ආ)* ශ්‍රී ලංකාවේ ලලිතකලා ආයතනයකදී ලබා ගත් නර්තන උපාධියක් හෝ ශ්‍රී ලංකාවේ ජාතික නැටුම් හා සංගීත (නර්තන) අවසාන විභාගය සමත් විය යුතුය;
  *(ඇ)* දේශීය හා විදේශීය නර්තන පිළිබඳ නව නිර්මාණ බිහිකිරීමේ හැකියාව තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සැලකේ ;
  *(ඈ)* දේශීය හා විදේශීය නව නර්තනයන් බිහි කිරීම හා පුහුණු කිරීමේ හැකියාව විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.
 (2) තූර්ය වාදක නිලධාරි - පෙරදිග සංගීත කණ්ඩායම:
  *(අ)* එක් වතාවකදී අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් සංගීතය හා ඉංග්‍රීසි භාෂාව ඇතුළත්ව අවම වශයෙන් සම්මාන 04 ක් සහිතව විෂයයන් 06 ක් සමත් විය යුතුය;
  *(ආ)* ශ්‍රී ලංකාවේ ලලිත කලා ආයතනයක දී ලබා ගත් සෞන්දර්ය උපාධියක් හෝ ශ්‍රී ලංකාවේ ජාතික නැටුම් හා සංගීත විභාගයේ (සංගීත ) අවසාන විභාගයේ හෝ ඉන්දියාවේ භාත්ඛණ්ඩ සංගීත පීඨයේ දෙවන පන්තියේ විශාරද විභාගය;
  *(ඇ)* පෙරදිග සහ අපරදිග වාද්‍යයන් පුහුණු කිරීමේ හැකියාව අතිරේක සුදුසුකමක් ලෙස සැලකේ;
  *(ඈ)* පෙරදිග සහ අපරදිග සංස්කෘතික සංගීත භාණ්ඩ වාදනය කිරීමේ හැකියාව මෙන්ම ස්වර ඥානය තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

*(ඈ)* *ගුවන් තොටුපළ නිර්මාණ ශාඛාව* :
 (*1*) *සිවිල් ඉංජිනේරු නිලධාරීන්.–* සිවිල් ඉංජිනේරු විද්‍යාවේදී උපාධියක් හෝ ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (එන්. ඩී. ටී.) හෝ ඒ හා සමාන සුදුසුකම් තිබිය යුතුය.
 (2) *විදුලි ඉංජිනේරු නිලධාරීන්* .– විදුලි ඉංජිනේරු විද්‍යාවේදී උපාධියක් හෝ ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (එන්.ඩී.ටී.) හෝ ඒ හා සමාන සුදුසුකම් තිබිය යුතුයි.
 (3) *කාර්මික ඉංජිනේරු නිලධාරීන්*.- කාර්මික ඉංජිනේරු විද්‍යාවේදී උපාධියක් හෝ ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (එන්.ඩී.ටී.) හෝ ඒ හා සමාන සුදුසුකම් තිබිය යුතුයි.
 (4) *මිනින්දෝරු*.- මිනින්දෝරු විද්‍යාවේදී උපාධියක් හෝ දියතලාව මැනීම් හා සිතියම් ගත කිරීමේ ආයතනයේ ඩිප්ලෝමා සහතිකයක් තිබිය යුතුයි.

*(ඉ)* *වෛද්‍ය ශාඛාව* :
 *වෛද්‍ය නිලධාරීන්*.- පිළිගත් විශ්වවිද්‍යාලයක වෛද්‍ය උපාධිය (එම්. බී. බී. එස්.) හෝ ඒ හා සමාන සුදුසුකම් තිබීම, සහ ශ්‍රී ලංකා වෛද්‍ය සභා මණ්ඩලයේ ලියාපදිංචි වී තිබීම, විශේෂඥ හෝ උසස් සුදුසුකම් තිබීම තෝරා ගැනීමේදී ප්‍රමුඛත්වය ගැනීමට හේතුවේ.

*(ඊ)* *දන්ත වෛද්‍ය ශාඛාව* :
 *දන්ත වෛද්‍ය නිලධාරීන්.–* පිළිගත් විශ්වවිද්‍යාලයක දන්ත වෛද්‍ය උපාධිය (බී. ඩී. එස්.) හෝ ඒ හා සමාන සුදුසුකම් තිබීම සහ වෛද්‍ය සභා මණ්ඩලයේ ලියාපදිංචි වී තිබිය යුතුය.

*3. අනෙකුත් සුදුසුකම්* :-

*(අ)* *පුරවැසි භාවය.–* ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
*(ආ)* *උස* - පිරිමි අඩි 5 අඟල් 5 ක් සහ ගැහැණු අඩි 5 අඟල් 2 ක් හෝ ඊට වැඩි විය යුතුය. (වෛද්‍ය හා දන්ත වෛද්‍ය නිලධාරීන් සඳහා අදාළ නොවේ)
*(ඇ)* *පපුව* - පිරිමි (අවමය) අඟල් 32
*(ඈ)* *වර්ණ දෘෂ්ටි තත්ත්වය* - CP 2
*(ඉ)* දෘෂ්ටි තීක්ෂණත්වය - වම් ඇස 6/6 සහ දකුණ ඇස 6/6(උපැස් සහිත සහ රහිත)
*(ඊ)* *සිවිල් තත්ත්වය හා වයස* :
 (1) කාර්මික සංඥා ශාඛාව - පිරිමි, 2006 ජුනි මස 30 වන දිනට වයස අවුරුදු 28ට නොවැඩි විය යුතුය.
 (2) උපකරණ ශාඛාව
  (අ) ජේද අංක 2 ආ(1) අනුව 2005 ජුනි මස 30 වන දිනට භෝජනාගාර භාරකරු පිරිමි සහ ගැහැණු වයස අවුරුදු 35 නොවැඩි විය යුතුය.
  (ආ) ජේද අංක 2 ආ(2) අනුව 2005 ජුනි මස 30 වන දිනට භොජනාගාර භාරකරු පිරිමි සහ ගැහැණු වයස අවුරුදු 30 නොවැඩි විය යුතුය.
 *(3)* *පරිපාලන රෙජිමේන්තු ශාඛාව* .– (පිරිමි) 2006 ජුනි මස 30 වන දිනට වයස අවුරුදු 35 නොවැඩි විය යුතු ය.

*(4) ගුවන් තොටුපල නිර්මාණ ශාඛාව*– (පිරිමි) 2006 ජුනි මස 30 වන දිනට වයස අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

*(5) වෛද්‍ය ශාඛාවන් .-* (පිරිමි/ගැහැණු) 2006 ජුනි මස 30 වන දිනට වයස අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

*(6) දන්ත වෛද්‍ය ශාඛාවන්.*– (පිරිමි/ගැහැණු ) 2006 ජුනි මස 30 වන දිනට වයස අවුරුදු 35 ට අඩු විය යුතුය.

4. යම් අයදුම්කරුවෙකුට වයස, හෝ උස, නියමිත සුදුසුකම් නොමැති වුවද, හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුනතාවයක් ඇත්නම් ගුවන් හමුදාධිපතිගේ මනාපය පරිදි ඔහු ගැන සලකා බලනු ලැබේ.

5. ගුවන් හමුදාධිපතිවරයා විසින් නියම කරනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් වීමට හැකි ආකාරයට මනා සෞඛ්‍ය තත්ත්වයකින් සිටිය යුතුය.

6. ක්‍රීඩා ක්ෂේත්‍රයේ වර්තමාන විශිෂ්ට දක්ෂතා ලබා තිබීම පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වනු ලැබේ.

7. තෝරාගනු ලබන අපේක්ෂකයින්ට ඔවුන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව ගුවන් හමුදාවේ ෆයිලට් ඔපිසර්/ෆ්ලයින් ඔපිසර්/ෆයිලට් ලෙප්ටිනන්ට් යන නිලයන්හි (නිත්‍ය/ස්වෙච්ඡා) අධිකාරියට පත්කරනු ලැබේ.

8. *රාජ්‍ය භාෂා අවශ්‍යතා.*– තෝරාගනු ලබන අපේක්ෂකයින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස විශේෂයෙන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත්, දැනට පවත්නා පනවා ඇති සහ මතු පනවනු ලබන්නාවූ ද ව්‍යවස්ථා පිළිපැදිය යුතුය.

9. තෝරා ගනු ලබන අපේක්ෂකයින් ගුවන් හමුදාපති විසින් තීරණය කරනු ලැබිය හැකි ස්ථානයකදී පුහුණුවක් ලැබිය යුතුය. පුහුණුවන අවස්ථාවේදී විෂමාචාරය නිසා හෝ තමාට පාලනය කරගත හැකිව තිබූ වෙනත් කරුණු නිසා හෝ නිලධාරියෙකු නුසුදුසු බවට වගකිව යුත්තන් විසින් වාර්තා කරනු ලැබුවහොත් එම නිලධාරියාට පිරිනමනු ලැබූ අධිකාරිය ආපසු ගැනීම සහ / හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විනය රෙගුලාසිවලට අනුකූලව වෙනයම් විනයානුකූල ක්‍රියාමාර්ගයන්ට යටත්වීමට හෝ බැඳී සිටින්නේය.

10. 1951 අප්‍රේල් මස 27 වන දින අංක 10,240 දරන *ගැසට්පත්‍රයේ* ප්‍රසිද්ධ කරනු ලැබූ කලින් කල සංශෝධනය කරන ලද, ශ්‍රී ලංකා ගුවන් හමුදා (නිත්‍ය හා නිත්‍ය උපසේවා) රෙගුලාසි අනුව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිලධාරියෙකුගේ සේවා කොන්දේසි වේ. සුදුසුකම් අනුව නියමු නිලධාරී හෝ උසස් නිලයක නිත්‍ය අධිකාරියක් පිරිනමනු ලැබේ. ගුවන් හමුදා පනතේ 10 වන වගන්තිය අනුව "සෑම නිලධාරියෙකුම සේනාධිනායක මනාපය පරිදි තම පත්වීමේ සිටිය හැක." කෙසේ වෙතත් තම අධිකාරියෙන් අස්වීමට නිලධාරියෙකුට බලයක් නැති අතර, ගුවන් හමුදා පනතේ 11 වන වගන්තිය අනුව සේනාධිනායක විසින් අස්වීමට ඉඩදිය හැක. ඇප/ගිවිසුම් බැඳී ඇත්නම් පුහුණු කාලය සහ පාඨමාලාවන් හදාරන්නේ නම් ඉහත සඳහන් පරිදි ගුවන් හමුදා පනතේ 11 වන වගන්තිය අනුව අස්වීමට නොහැක. ගුවන් හමුදාවේ විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික රෙගුලාසිවලට අනුව ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගැනීමට හැකි වනුයේ අවුරුදු 10 ක සේවා කාලයක් නිම කළ යුතුය.

11. ගුවන් හමුදා නිලධාරීන් රාජකාරි හෝ පුහුණුව සඳහා ඕනෑම අවස්ථාවක දී ලෝකයේ කවර තැනකට වුවද යවනු ලැබීමට යටත් වේ.

12. අවිවාහක නිලධාරීන්, නිලධාරී නිවස්නයේ විසිය යුතුය. ගෘහ භාණ්ඩ සහ නවාතැන් පහසුකම් හා ආහාරපාන ඔහුට සපයනු ලැබේ. බැට්මන් සේවය ද සපයනු ලැබේ. අවිවාහක නිලධාරීන්ගේ ආහාර දීමනාව සහ බැට්මන් දීමනාව භෝජනාගාරයට ගෙවනු ලැබේ.

13. විවාහක නිවාස තිබේ නම් ගෘහ භාණ්ඩ සහිත නිවාසයක් විවාහක නිලධාරීන්ට සපයනු ලැබේ. මේ සඳහා කුලිය අයකරනු ලබන්නේ රජයේ සේවකයන්ට අදාළ පරිදි ය. රජයේ නිවාසයක වාසය කරනු නොලබන්නේ නම් 15(ඈ) (17) ඡේදයේ පරිදි නිවාස කුලී දීමනාවන් හිමි වේ.

14. විටින් විට පනවනු ලබන ගුවන් හමුදා නියෝග අනුව ගුවන් හමුදා නිලධාරීන් පාලනය කරනු ලැබේ.

15. *(අ)* ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරිලත් නිලධාරීන්ගේ වැටුප් පහත සඳහන් පරිදි වේ :

ෆයිලට් ඔෆිසර් - රු. 1,33,380 වසරකට,
ෆලයින් ඔෆිසර් - රු. 1,57,500 - 9 x 3,780 = රු. 1,91,520 වසරකට,
ෆ්ලයිට් ලෙප්ටිනන් - රු. 1,80,180-9 x 3,780 = රු. 2,14,200 වසරකට,
ස්කොඩ්‍රන් ලීඩර් - රු. 2,02,860-7x3,780–1x4,200-2x6,300-
= රු. 2,46,120 වසරකට,
විංග් කමාන්ඩර් - රු. 2,14,980-2x7,740– 5x8,580 = රු.2,73,360වසරකට,
ගෲප් කැප්ටන් - රු. 2,76,540-7x11,880 =රු. 3,59,700 වසරකට.

(ආ) වෛද්‍ය නිලධාරි
ප්‍රාථමික ශ්‍රේණිය - රු. 1 x 86,060 - 1x 3,240 = රු. 1,89,300
2 වැනි ශ්‍රේණිය - රු. 2,06,880 - 3 x 4,920 - 5x 6,600 = රු. 2,54,640
1වන ශ්‍රේණිය - රු. 2,63,040 - 8 x 8,904 =රු. 3 x 34,272
ජ්‍යෙෂ්ඨ පරිපාලන ශ්‍රේණිය - රු. 2,79,120 - 10 x 8,904 =රු. 3,68,160
විශේෂ ශ්‍රේණිය.– රු. 3,45,600 – 8 x 12,360 = රු. 4,44,480

(ඇ) දන්ත වෛද්‍ය
2 වන ශ්‍රේණිය - රු. 1,29,240 - 3x 3,200 - 4x4,920 - 5x6,600–රු. 2,54,640
1 වන ශ්‍රේණිය - රු. 2,63,040 - 8x 8,904 - රු. 3,34,272

අනෙකුත් දීමනා.– වෛද්‍ය හා දන්ත වෛද්‍ය ශාඛාවේ නිලධාරින් සඳහා සේවා දීමනා 15 (ඈ) පරිදි වේ.

විශ්‍රාම වැටුප් දීමනා :

| | | |
|---|---|---|
| ප්‍රාථමික ශ්‍රේණිය | - | රු. 1,700 (මසකට) |
| ශ්‍රේණිය II | - | රු. 1,700 (මසකට) |
| ශ්‍රේණිය I | - | රු. 3,400 (මසකට) |
| විශේෂ ශ්‍රේණිය | - | රු. 3,400 (මසකට) |

විශ්‍රාම වැටුප් රහිත දීමනා :

| | | |
|---|---|---|
| ප්‍රාථමික ශ්‍රේණිය | - | රු. 2,125(මසකට) |
| ශ්‍රේණිය II | - | රු. 1,700 (මසකට) |
| ශ්‍රේණිය II | - | රු. 400 (මසකට) |

බාහිර රාජකාරී දීමනාව -රු. 5,000 (මසකට)
සේවා දීමනා මාසිකව -රු. 300, 400, 500 සුදුසු පරිදි වේ.
අමතර සේවා දීමනා - රු. 1,500 (මසකට)

අතිරේක රාජකාරී දීමනාව:

| | | |
|---|---|---|
| ප්‍රාථමික ශ්‍රේණිය | - | රු. 105 (පැයකට) |
| ශ්‍රේණිය II | - | රු. 105 (පැයකට) |
| ශ්‍රේණිය I | - | රු. 150 (පැයකට) |

(ඈ) අනෙකුත් දීමනා :

1. අතුරු දීමනා I මසකට මූලික වැටුපෙන් 10% ක් ගෙවනු ලැබේ.
2. අතුරු දීමනා II මසකට රු. 1,200 ක් ගෙවනු ලැබේ.
3. ජීවනාධාර දීමනාව මසකට රු. 1,000 ක් ගෙවනු ලැබේ.
4. සේවා කාලය වසර පහක් සම්පූර්ණ කළ පසු දිරි දීමනාව වශයෙන් මසකට රු. 250 ගෙවනු ලැබේ.
5. දුෂ්කර දීමනා මසකට රු. 600ක් ගෙවනු ලැබේ.
6. ක්‍රියාන්විත සේවයේ සේවය කරන්නන් හට රු. 2,400 ක් ගෙවනු ලැබේ.
7. විශේෂ දීමනාව මසකට රු. 3,000 යාපන අර්ධද්වීපයේ සේවය කරන්නන් සඳහා ගෙවනු ලැබේ,
8. නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව මසකට රු. 255ක් ගෙවනු ලැබේ.
9. බැට්මන් දීමනාව මසකට රු. 637.50ක් ගෙවනු ලැබේ. (කඳවුරෙන් පිටත වාසය)
10. ආහාර දීමනාව මසකට රු. 6,213.64 ක් ගෙවනු ලැබේ,(කඳවුරෙන් පිටත වාසය)
11. සුදුසුකම් වේතනය අදාළ පරිදි මසකට උපරිමය රු. 637.50ක් ගෙවනු ලැබේ,
12. නොමිලේ ගමන් කළ හැකි දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (නිලධාරියාට සහ පවුලේ සහ පවුලේ සාමාජිකයින්ට අදාළ නම්), දෙනු ලැබේ.
13. කඳවුර තුළ වාසය කරන නිලධාරීන් මසකට වරක් නිලධාරී නිවස්නයේ සිට තම නිවාසයට යෑම සහ ඒමට අතිරේක දුම්රිය ගමන් බලපත්‍ර කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ,
14. නිල ඇඳුම් හා ඊට අදාළ අනෙකුත් භාණ්ඩ නොමිලයේ සපයනු ලැබේ,
15. නොමිලයේ වෛද්‍ය පහසුකම් (තම පවුල්වලට සාමාජිකයින්ට අදාළ නම්),
16. පිටත වාසය කිරීමට බලය දී ඇති විවාහක නිලධාරීන්ට සැතපුම් 30ක් (කි. මී. 48)තුළ රාජකාරි ස්ථානයකට නොමිලේ ගමන් කිරීම සඳහා මධ්‍යම ගමනා ගමන මණ්ඩලයේ බලපත්‍රයක් දෙනු ලැබේ.
17. රජයේ නිවාසවල වාසය නොකරන විවාහක නිලධාරීන්හට පහත සඳහන් පරිදි නිවාස කුලී දීමනාවක් හිමි වේ. ෆලයිට් ඔfපිසර් සිට ගෲප් කැප්ටන් සහ ඊට ඉහළ නිලයන් සඳහා මසකට රු. 1,500-රු. 3,850 දක්වා,

16. විටින් විට සංශෝධනය කරනු ලැබූ සහ 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂිත දීමනා සංග්‍රහය අනුව විශ්‍රාම වැටුප් පාරිතෝෂිත දීමනා ගෙවනු ලැබේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලට සියළුම නිලධාරීන් දායකයන් වේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලේ දායක මුදල් 1970 රෙගුලාසි අනුව ය.

17. ඉල්ලුම්කරුවන්ට උපදෙස් :-

(අ) පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව ඉල්ලුම්පතේ සියළුම කොටු හැකි පමණ විස්තර හා පැහැදිලිව සම්පූර්ණ කළ යුතුය. ඉල්ලුම්පත් 2006 අප්‍රේල් මස 26 වැනි දින මධ්‍යාහ්න 12.00 හෝ ඊට පෙර ලැබෙන සේ, "ප්‍රධාන ආධුනිකයින් බඳවා ගැනීමේ නිලධාරී, ආධුනිකයින් බඳවා ගැනීමේ කාර්යාලය, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ඒකළ, කොටුගොඩ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහාලන කවරයේ "ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ.................. ශාඛාවේ අධිකාරියක් සඳහා ඉල්ලුම්පත" යනුවෙන් සඳහන් විය යුතුය. ඉල්ලුම්පත් බාර ගන්නා අවසාන දිනට හා වේලාවට පසුව සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවන ඉල්ලුම්පත් සලකා බලනු නොලැබේ.

(ආ) රාජ්‍ය සේවයේ/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්හි සේවයෙහි නිරත වූවන් ස්වකීය ඉල්ලුම්පත් ඒ ඒ දෙපාර්තමේන්තු/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතන මගින් ඉදිරිපත් කළ යුතුය. යම් හෙයකින් අයදුම්කරුවකු තෝරා ගතහොත් තම කාර්යයෙන් නිදහස් කරන බවට සේවා යෝජකයා විසින් ලිපියක් මගින් දැනුම්දිය යුතුය.

(ඇ) ඉල්ලුම්පත් සමඟ අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකපත් වල පිටපත් ඉදිරිපත් කළ යුතුය :
(i) උප්පැන්න සහතිකය,
(ii) ලබා ඇති උසස්ම අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික,
(iii) ඉල්ලුම්කරු පෞද්ගලිකව දන්නා වගකිව යුතු පුද්ගලයන් යටත් පිරිසෙයින් දෙදෙනෙකුගෙන් ලබාගත් චරිත සහතික,
(iv) ක්‍රීඩා, ශිෂ්‍ය භට පුහුණු ආදිය සනාථ කරන සහතික,
(v) ඉල්ලුම්පතේ යම් යම් හිමිකම් කර ඇතොත් ඒවා සනාථ කරන සහතික.

මෙම සහතිකවල මුල්පිටපත් ඉදිරිපත් කළ යුත්තේ අපේක්ෂකයා සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබුවහොත් ඒ අවස්ථාවේදී පමණි.

18. ඉල්ලුම්පතේ අසත්‍ය ප්‍රකාශයක් කර තිබේනම් එම අසත්‍යතාවය අපේක්ෂකයා තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අහිමිවීමටද, තෝරා ගනු ලැබීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු සේවයෙන් පහ කරනු ලැබීමටද යටත් වේ.

තෝරා ගැනීම, සම්මුඛ පරීක්ෂණ ආදිය.–

19. ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන අයදුම්කරුවන් මූලික තේරීම්වලට භාජනය කරනු ලැබේ. එසේ තෝරා ගනු ලබන අයදුම්කරුවන්ට ගුවන් හමුදාපති විසින් නියම කරනු ලබන පරිදි පරීක්ෂණවලට පෙනී සිටීමට සිදු වන්නේය. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය මගින් පත් කරනු ලබන තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අවසාන තේරීම කරනු ලැබේ.

20. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයින්ට සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන ස්ථානය, වේලාව සහ දිනය ලිපියකින් දැනුම් දෙනු ලැබේ. මේ සම්බන්ධයෙන් දරනු ලබන ගමන් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

21. මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවෙකු කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ඔහු විසින් ඉදිරිපත් කළ යුතුය.

22. අවසාන සම්මුඛ පරීක්ෂණයෙන් පසුව සුදුස්සන් විය හැකි අපේක්ෂකයින් ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතුය.

23. අපේක්ෂකයකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුවත්, එසේ කළ යුත්තේ ඔහුට සහතිකයක් දීමෙනි. අපේක්ෂකයෙකු තෝරා ගැනීම සඳහා කවර ආකාරයකින් හෝ පෙළඹවීම *නැතහොත්* බලපෑම් කිරීමට උත්සාහ දැරීම එම අපේක්ෂකයා නුසුදුස්සෙකු වීමට හේතු වන්නේය.

24. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අපේක්ෂකයින් වෙත ඒ බව දන්වා එවනු නොලැබේ.

ජී. ඩී. පෙරේරා,
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

මූලස්ථානය,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
තැ. පෙ. 594, කොළඹ.

### ශ්‍රී ලංකා නිත්‍ය/ස්වේච්ඡා ගුවන් හමුදාවේ ………… ශාඛාවේ අධිකාරියක් සඳහා ඉල්ලුම්පත

01. සම්පූර්ණ නම (ජාතික හැඳුනුම්පතට අනුව) : ——————.
02. ජාතික හැඳුනුම්පත් අංකය : ——————.
03. (අ) තැපැල් ලිපිනය : ——————.
(ආ) ස්ථිර ලිපිනය : ——————.
(ඇ). ස්ථිර ලිපිනයට අයත් ආසන්නම පොලිස් ස්ථානය : ——————.
(ඈ) දිස්ත්‍රික්කය : ——————.
(ඉ) ඡන්ද කොට්ඨාසය : ——————.
(ඊ)ග්‍රාම සේවක කොට්ඨාසය : ——————.
(උ) දුරකථන අංකය : ——————.
04. (අ) උපන් දිනය : ——————.
2006.06.30 වැනි දිනට වයස :
අවුරුදු : ——————, මාස : ——————, දින : ——————.
05. විවාහක/අවිවාහක බව : ——————.
06. පුරවැසි භාවය ( ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන්නේ පෙළපතින්ද, ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය හා අංකය සඳහන් කරන්න) : ——————.
07. *උස : අඩි:* ——————. *අඟල්:* ——————.
08. පාසලේ සහ/හෝ විශ්වවිද්‍යාල පිළිබඳ විස්තර :

| *පාසලේ/ විශ්වවිද්‍යාලයේ නම* | *දිනය* | | *සමත් වූ පොදු විභාග හා විෂයයන් (ශ්‍රේණි ඇතුළුව)* |
|---|---|---|---|
| | *ඇතුල් වූ* | *පිට වූ* | |
| | | | |

09. පාසලෙන්/විශ්වවිද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ රක්ෂා පිළිබඳ විස්තර :

| *සේවා යෝජකයාගේ නම හා ලිපිනය* | *රැකියාවේ ස්වභාවය* | *සේවා කාලය* | |
|---|---|---|---|
| | | *සිට* | *දක්වා* |
| | | | |

10. මව්පියන් පිළිබඳ විස්තර :

| *සම්පූර්ණ නම* | *උපන් ස්ථානය* | *රැකියාව* | *දැන් ලිපිනය* |
|---|---|---|---|
| මව | | | |
| පියා | | | |

11. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් : ——————.
12. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ටතා පිළිබඳ විස්තර (ඔබ සහභාගී වූ තරඟ හා ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා විශිෂ්ටතා දක්වන්න) : —.
13. පැසලේදී, විශ්වවිද්‍යාලයේ හෝ බාහිර සංවිධානවලදී දක්වා ඇති වෙනත් විශිෂ්ටතා (දිනයන් සමඟ විස්තර දක්වන්න) : ——————.
14. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ, ශිෂ්‍ය භට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ හෝ ඇති පෙර සේවය : ——————.
15. සිවිල් හෝ යුධ උසාවියකදී වරදිකරු වී හෝ ඇඟ බැඳ තිබේ ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න : ——————.
16. ඉල්ලුම්පතෙහි අසත්‍ය ප්‍රකාශයක් කර තිබේ නම් අසත්‍යතාවය අපේක්ෂකයා තෝරා ගැනීමට පෙර හෙළිදරව් වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අහිමිවීමටද, තෝරාගනු ලැබීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු සේවයෙන් පහු කරනු ලැබීමටද යටත් වේ.
17. රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය අංශයෙහි/මණ්ඩලයක/සංස්ථාවක (මහ බැංකුව, ජනසතු බැංකු, විශ්වවිද්‍යාල, රජය විසින් පාලනය කරන සිවිල් ව්‍යාපාර සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එම සේවය අවසන් කිරීමට හේතු : ——————.
18. චරිත සහතික පිළිබඳ විස්තර :

| *නම* | *පදවිය* | *තැපැල් ලිපිනය* |
|---|---|---|
| | | |

19. ඉල්ලුම්කරු විසින් අත්සන් කළයුතු ප්‍රකාශනය:
පූර්වෝක්ත ප්‍රශ්නවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළවූ ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවේ අධිකාරී සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයන් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙත හා ඒ අයට අදාළ වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

——————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය : ——————.

03-22

---

## ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාව

### ගුවන් භටයින් සඳහා පුරප්පාඩු

ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවේ පහත දැක්වෙන වෘත්තීන්වල ගුවන් භටයින් සඳහා පුරප්පාඩු පවතී.

1. (අ) *වෘත්තීන් සහ අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම්* :

(1) *ගුවන් යානා ඉංජිනේරු* :

(i) ගුවන් යානා යන්ත්‍ර ශිල්පී

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් ඇතුළුව ගණිතය, විද්‍යාව (1999/2000 වසරවල අයදුම්කරුවෙක් නම්, ගණිතය II, විද්‍යාව II) යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් සහ ඉන් ගණිතය හෝ විද්‍යාවට සම්මාන සාමාර්ථයක්ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

(2) *විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු* :

(i) ගුවන් රෙදවු ශිල්පි :

(ii) විදුලි පණිවුඩ යන්ත්‍ර ශිල්පි :

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් ඇතුළුව ගණිතය, විද්‍යාව (1999/2000 වසරවල අයදුම්කරුවෙක් නම් ගණිතය II, විද්‍යාව II) යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් සහ ඉන් ගණිතය හෝ විද්‍යාවට සම්මාන සාමාර්ථයක් ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

(iii) දුරකථන ක්‍රියාකරු :

(iv) ගුවන් විදුලි සන්නිවේදන ශිල්පි :

(v) පරිඝණක කාර්මික ශිල්පි :

සිංහල/දෙමළ, සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයන් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබිය යුතුයි. (1999/2000 වසරවල අයදුම්කරුවෙකු විෂයයන් හය සඳහා ගණිතය, විද්‍යාව ඇතුලත් වන්නේ නම් ඒ සඳහා ගණිතය II, විද්‍යාව II) යන විෂයයන් ඊට ඇතුලත් විය යුතුයි.)

(3) *සාමාන්‍ය ඉංජිනේරු* :

(i) අවි ආයුධ ශිල්පි :

(ii) සාමාන්‍ය යාන්ත්‍රික ශිල්පි :

(iii) රථ වාහන ශිල්පි :

(iv) ගුවන් යානා ගිනියම් පැස්සුම්කරු :

සිංහල/දෙමළ, සහ ඉංග්‍රීසි භාෂාවන් ඇතුළුව ගණිතය, විද්‍යාව(1999/2000 වසරවල අයදුම්කරුවෙක් නම් ගණිතය II, විද්‍යාව II) යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් සහ ඉන් ගණිතය හෝ විද්‍යාවට සම්මාන සාමාර්ථයක්ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

(iv) ප්‍රවාහන ක්‍රියාකරු :

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස. (සාමන්‍ය පෙළ) විභාගය සමත්ව තිබිය යුතු අතර රියදුරු බලපත්‍රයද අනිවාර්යයෙන්ම ලබා තිබිය යුතුයි. (1999/2000 වසරවල අයදුම්කරුවෙකු විෂයයන් හය සඳහා ගණිතය, විද්‍යාව ඇතුලත් වන්නේ නම් ඒ සඳහා ගණිතය II, විද්‍යාව II යන විෂයයන් ඊට ඇතුලත් විය යුතුයි.)

(4) *සිවිල් ඉංජිනේරු* :

(i) විදුලි වැඩකරු :

(ii) යන්ත්‍රාගාර ක්‍රියාකරු :

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් ඇතුළුව ගණිතය, විද්‍යාව (1999/2000 වසරවල අයදුම්කරුවෙක් නම් ගණිතය II, විද්‍යාව II) යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් සහ ඉන් ගණිතය හෝ විද්‍යාවට සම්මාන සාමාර්ථයක්ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබිය යුතුයි.

(iii) පෙදරේරු :

(iv) පයිප්පකරු :

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබිය යුතු යි. (1999/2000 වසරවල අයදුම්කරුවෙකු විෂයයන් හය සඳහා ගණිතය, විද්‍යාව ඇතුලත් වන්නේ නම් ඒ සඳහා ගණිතය II, විද්‍යාව II යන විෂයයන් ඊට ඇතුලත් විය යුතුයි.)

(5) *සැපයීම්* :

(i) සැපයුම්කරු :

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් සහ ගණිතය/විද්‍යාව/වාණිජ්‍ය හා ගිණුම් (1999/2000 වසරවල අයදුම්කරුවෙක් නම් ගණිතය II, විද්‍යාව II) යන විෂයයන්ගෙන් එක් විෂයයක් සඳහා සම්මාන සාමාර්ථයක්ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

(ii) භෝජනාගාර භාරකරු :

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයන් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබිය යුතුයි. (1999/2000 වසරවල අයදුම්කරුවෙකු විෂයයන් හය සඳහා ගණිතය, විද්‍යාව ඇතුලත් වන්නේ නම් ඒ සඳහා ගණිතය II, විද්‍යාව II යන විෂයයන් ඊට ඇතුලත් විය යුතුයි.)

(iii) සලාක සහකරු :

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබිය යුතුයි. (1999/2000 වසරවල අයදුම්කරුවෙකු විෂයයන් හය සඳහා ගණිතය, විද්‍යාව ඇතුලත් වන්නේ නම් ඒ සඳහා ගණිතය II, විද්‍යාව II යන විෂයයන් ඊට ඇතුලත් විය යුතුයි.)

(6) *පරිපාලන* :

(i) ලිපිකරු පොදු රාජකාරි:

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් සහ ගණිතය/විද්‍යාව/වාණිජ්‍ය හා ගිණුම් (1999/2000 වසරවල අයදුම්කරුවෙක් නම් ගණිතය II, විද්‍යාව II) යන විෂයන්ගෙන් එක් විෂයක් සඳහා සම්මාන සාමාර්ථයක්ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. පරිගණක පිළිබඳ දැනුම විශේෂ සුදුසුකමක් වේ.

(ii) ගිණුම් ලිපිකරු :

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් සහ ගණිතය/වාණිජ්‍ය හා ගිණුම් (1999/2000 වසරවල අයදුම්කරුවෙක් නම් ගණිතය II) යන විෂයන්ගෙන් එක් විෂයක් සඳහා සම්මාන සාමාර්ථයක්ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. (1999/2000 වසරවල අයදුම්කරුවෙක් නම් විෂයයන් හය සඳහා විද්‍යාව ඇතුලත් වන්නේ නම් ඒ සඳහා විද්‍යාව II ඊට ඇතුලත් විය යුතුයි.)

(7) *මෙහෙයුම්* :

(i) මෙහෙයුම් ගුවන් :

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහ ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබිය යුතුයි. (1999/2000 වසරවල අයදුම්කරුවෙකු විෂයයන් හය සඳහා ගණිතය, විද්‍යාව ඇතුලත් වන්නේ නම් ඒ සඳහා ගණිතය II, විද්‍යාව II යන විෂයයන් ඊට ඇතුලත් විය යුතුයි.)

(ii) *අවිකරු* .:

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබිය යුතුයි. (1999/2000 වසරවල අයදුම්කරුවෙක් නම් විෂයයන් හය සඳහා ගණිතය හෝ විද්‍යාව ඇතුලත් වන්නේ නම් ඒ සඳහා ගණිතය II, විද්‍යාව II යන විෂයයන් ඊට ඇතුලත් විය යුතුයි.)

(8) *පොලිස්* :

(i) පොලිස් භට :

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයන් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබිය යුතුයි. (1999/2000 වසරවල අයදුම්කරුවෙකු විෂයයන් හය සඳහා ගණිතය, විද්‍යාව ඇතුලත් වන්නේ නම් ඒ සඳහා ගණිතය II, විද්‍යාව II යන විෂයයන් ඊට ඇතුලත් විය යුතුයි.)

*(ආ) අනෙකුත් සුදුසුකම්* .— ඉහත සඳහන් සුදුසුකම්වලට අමතරව ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවට බඳවා ගැනීම සඳහා අපේක්ෂකයින් පහත සඳහන් පොදු කොන්දේසි සපුරාලිය යුතුයි :

*නිත්‍ය ගුවන් භටයින් සඳහා* :

(1) *පුරවැසිභාවය*.– ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුයි.

(2) *වයස*.– 2006 ජූනි මස 30 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු වූද අවුරුදු 23 ට නොවැඩි අයෙකු විය යුතුයි.

(3) *උස*.–අඩි 5 අහල් 4 කට නොඅඩු විය යුතුයි.

(4) *බර*.– ශරීර ස්කන්ධ දර්ශකය $\frac{\text{බර (කි. ග්‍රෑම්)}}{\text{උස (මී)}^2} < 25$

(5) *පපුව*.– අඟල් 32 කට නොඅඩු විය යුතුයි.

(6) *වර්ණ දෘෂ්ටිය*.– CP2

(7) *දෘෂ්ටි තීක්ෂණත්වය*.– වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් රහිත)

(8) *සිවිල් තත්ත්වය*.– අවිවාහක විය යුතුයි. (ගුවන් හමුදාවට බැඳී වසර දෙකක් ගතවන තුරුත් මූලික වෘත්තීය පුහුණු පාඨමාලාව හදාරා වසරක් ගතවනතුරුත් මෙම අවස්ථා දෙකෙහි පසුව එළඹෙන අවස්ථාවට අනුව විවාහ වීමට ගුවන් භටයින්ට අවසර දෙනු ලැබේ.)

02. පළමුවන ඡේදයේ "අ" හි දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් හෝ ඒ හා සමාන සුදුසුකම් හෝ පළමුවන ඡේදයේ "ආ" හි දක්වා ඇති අවශ්‍යතාවයන් හෝ සපුරා ගනු නොලබන අපේක්ෂකයන් ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස හා ඇස් පරීක්ෂා කරනු ලැබේ. *ගැසට් පත්‍රයේ* ඉල්ලා ඇති මිම්වලට අනුව උස හා ඇස් පෙනීම නොමැති අයදුම්කරුවන් පළමු සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ.

03. ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශිෂ්ටතා ලබා ඇතොත් ඒ ගැන නිසි සැලකිල්ලක් දක්වනු ලැබේ.

04. *සේවා කොන්දේසි* :

*(අ)* ගුවන් භටයින් සේවයට බැඳුනු දා සිට ගුවන් හමුදා පනතට, ගුවන් හමුදා රෙගුලාසිවලට සහ ගුවන් හමුදා අණපනත්වලට යටත් විය යුතුයි.

*(ආ)* තෝරාගනු ලබන සියලුම වෘත්තීන්වල අදාළ ගුවන් භටයින්ට මූලික සටන් පුහුණුවත්, ඉන් පසුව වෘත්තීය පුහුණුවත් ලබා දෙන අතර, ඔවුන් ශ්‍රී ලංකාවේ ඕනෑම ස්ථානයක, දිවා රාත්‍රී ඉතා දුෂ්කර තත්ත්වයන්හි වුවද, ඕනෑම ආකාරයක රාජකාරියක් තම මව් රට තුළ දී හෝ විදේශයක දී ඉටුකළ යුතුයි.

05. *බඳවා ගැනීමේ කොන්දේසි* :

තෝරාගනු ලබන අපේක්ෂකයින් නිත්‍ය ගුවන් හමුදාවේ (දෙවන/තුන්වන පන්තියේ) ගුවන් භට ශ්‍රේණියට ඇතුළත් කරනු ලබන අතර ඔවුන් අඛණ්ඩව වසර 05 ක් ගුවන් හමුදාවේ සේවය කළ යුතු වේ. ඒ බවට එකඟ වන ගිවිසුමකට ඔවුන් අත්සන් කළ යුතුයි. තවද වසර 05 ක කාල සීමාව නිමවීමෙන් පසු එතැන් සිට වසර 07 ක කාල සීමාවක් සඳහා ඔවුන් නිත්‍ය උප සේවාවට කැඳවීමක් කළ අවස්ථාවකදී වාර්තා කළ යුතුයි. අවුරුදු 05 ක සේවය අවසන් වූ පසුව තවදුරටත් සේවය කිරීම සඳහා නැවත බැඳීමට සුදුසු ගුවන් භටයින්ට අවස්ථාව ඇත.

06. *රාජ්‍ය භාෂාව පිළිබඳ නියමයන්*.— තෝරා ගනු ලබන අපේක්ෂකයින් ශ්‍රී ලංකාණ්ඩුවේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව ක්‍රියාකල යුතුයි.

07. *වැටුප් හා දීමනා* :

*(අ)* වසරකට ගුවන් භටයින්ට අදාළ, ඒකාබද්ධ වැටුප් පරිමාණ පහත සඳහන් පරිදි වේ.

*ගුවන් භට* – රු. 1,04,520-7x1,320-10x1,560 = රු. 1,29,360

*නායක ගුවන් භට* – රු. 1,08,480-4x1,320-11x1,560 = රු. 1,30,920

*කෝප්‍රල්* – රු. 1,12,440-1x1,320-13x1,560 = රු. 1,34,040

සැරයන් – රු. 1,15,320-10x1,560-2 x 2,460– 1 x 3,480 = රු. 1,39,320

*බලපත්‍ර සැරයන්* – රු. 1,18,440-8 x 1,560-2 x 2,460-3 x3,480 = රු. 1,46,280.

*බලලත් නිලධාරී* – රු. 1,24,680-4 x 1,560- 2 x 2,460-9 x 3,480 = රු. 1,67,160.

*(ආ) දීමනා* :

(1) අතුරු දීමනා I මසකට රු. 1,000 ක් ගෙවනු ලැබේ.

(2) අතුරු දීමනා II මසකට රු. 1,200 ක් ගෙවනු ලැබේ.

(3) ජීවනාධාර දීමනාව මසකට රු. 1,000 ක් ගෙවනු ලැබේ.

(4) *දුෂ්කර දීමනා* මසකට රු. 600 ක් ගෙවනු ලැබේ.

(5) ක්‍රියාත්මක සේවයේ සේවය කරන්නන් හට මසකට රු. 1,900 ක් ගෙවනු ලැබේ.

(6) විශේෂ දීමනාව මසකට රු. 2,400 යාපන අර්ධද්වීපයේ සේවය කරන්නන් සඳහා ගෙවනු ලැබේ. (රාජකාරී දිනකට රු. 80 බැගින්)

(7) *දිරි දීමනා* .— සේවා කාලය වසර 5 සම්පූර්ණ කිරීමෙන් පසුව මෙම දීමනාව ගෙවනු ලැබේ. (මසකට රු. 250 සිට රු.850 දක්වා)

(8) *ආහාර දීමනා* .— පිටත වාසය කරන ගුවන් භටයින්ට මසකට රු. 5649.75 බැගින් ගෙවනු ලබන අතර කඳවුරු තුල වාසය කරන ගුවන් භටයින්ට නොමිලේ ආහාර සපයනු ලැබේ.

(9) *නේවාසික පහසුකම්* .— කඳවුරු තුළ වාසය කරන ගුවන් භටයින්ට නොමිලේ සපයනු ලැබේ.

(10) *ගමනාගමනය* .— වසරකට නිවාඩු දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් (03) (ගුවන් භටයා/භාර්යාව/ළමයින්ට) ඊට අමතරව කඳවුරු තුළ සිටින ගුවන් භටයින්ට මසකට එක් නිවාඩු බලපත්‍රයක් හෝ ලංගම බස් ගාස්තුව හෝ දෙනු ලැබේ.

(11) *වික්ෂේපණ දීමනා* .— මව් කඳවුරුවලින් වෙනත් ස්ථානයක රාජකාරි සඳහා යවනු ලැබූ විට මෙම දීමනාව ගෙවනු ලැබේ. (ගෙවීම් ප්‍රමාණය විවාහක/අවිවාහක බව අනුව වෙනස් වේ.)

(12) *සුදුසුකම් වැටුප්* .— ගුවන් හමුදාවට ප්‍රයෝජනවත් වූ විශේෂ පාඨමාලාවක් හදාරා ඇති හෝ විශේෂ සුදුසුකම් ඇති පුද්ගලයින්ට මෙම දීමනාව ගෙවනු ලැබේ. (මසකට උපරිම රු. 637.50).

(13) *යහපත් කල්ක්‍රියා ලාංඡන දීමනා* .— මෙම දීමනාව ගෙවනු ලබන්නේ තම හැසිරීම හා සාමාන්‍ය විනය ඉතා උසස් අන්දමින් පවත්වාගෙන යනු ලබන තැනැත්තන්ටය. (මසකට රු. 30 සිට රු. 204 දක්වා).

(14) *නිළ ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව*.— මසකට රු. 170 ක් ගෙවනු ලැබේ.

(15) *නැවත සේවයට බැඳීමේ වැටුප්*.— නැවත සේවයට බැඳෙන ගුවන් භටයින්ට මසකට රු. 300 බැගින් දීමනාවකට හිමිකම් ලැබේ.

(16) *වෛද්‍ය පහසුකම්*.—ගුවන් හමුදාව මගින් සෑම භටයෙකුටම නොමිලේ වෛද්‍ය පහසුකම් සපයන අතර විවාහක නම් ඔහුගේ පවුලේ අයට නොමිලේ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ.

(17) කඳවුරුවල සිට සැතපුම් 30 ක (කි. මී. 48 ක) අරයක් තුළ පදිංචි කඳවුරෙන් පිටත වාසය කරන ගුවන් භටයින් සඳහා තම වාසස්ථානයේ සිට කඳවුරු වෙත ලංගම බස් මගින් නොමිලේ ගමන් කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලැබේ.

(18) රජයේ නිවාසයක වාසය නොකරන විවාහක ගුවන් භටයින්ට මසකට රු. 1,100 සිට රු. 3,000 දක්වා ගෙවල් කුලී දීමනාවක් හිමි වේ.

(19) *උපදේශක දීමනාව*.— මසකට රු. 425 සිට රු. 510 දක්වා දීමනාවක් හිමි වේ.

(20) *වෙනත් දීමනා*.– (වෙන්ව සිටීමේ හා විදේශ ගතවීම් ආදිය) ශ්‍රී ලංකා ගුවන් හමුදා වැටුප් සංග්‍රහයට අනුව මෙම දීමනා ගෙවනු ලැබේ.

(21) වරින් වර සංශෝධනය කරනු ලැබූ හා 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහයට අනුව විශ්‍රාම වැටුප්/පාරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලට සියලු ගුවන් භටයින් දායක විය යුතුයි. අරමුදලට ගෙවිය යුතු දායක මුදල්වල අනුප්‍රමාණය 1970 වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදල් රෙගුලාසි අනුව වේ.

08. *ඉල්ලුම්කරුට උපදෙස්* :

(අ) පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතුයි. ඉල්ලුම්පතේ සියලුම හිස්තැන් හැකි පමණ විස්තර සහිතව හා පැහැදිළිව තම අත් අකුරින් සම්පූර්ණ කළ යුතුයි. ඉල්ලුම්පත් 2006 අප්‍රේල් මස 26 වන දින දහවල් 12.00 ට පෙර ලැබෙන සේ "ආධුනිකයින් බඳවාගැනීමේ නිළධාරි", ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ඒකළ, කොටුගොඩ, යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. (ලියාපදිංචි තැපෑලෙන් එවනු නොලබන ඉල්ලුම්පත් බාර ගනු නොලැබේ.) අයදුම්පත් බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ "ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් භටයින් සඳහා ඉල්ලුම්පත" යනුවෙන් සඳහන්කළ යුතුයි. එක් අයදුම්කරුවෙක් එක් වෘත්තියකට පමණක් ඉල්ලුම්කල යුතු අතර වෘත්තීන් කීපයකට ඉදිරිපත් කරන ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට හා වේලාවට පසුව කොටුගොඩ, ඒකල, ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුර වෙත ලැබුණා වූ ද මේ නිවේදනයේ අවශ්‍යතාවලට අනුකූල නොවන්නා වූ ද ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

*(ආ)* රජයේ සේවයේ/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්හි සේවයේ නිරත වූවන් ස්වකීය ඉල්ලුම්පත් ඒ ඒ දෙපාර්තමේන්තු/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුයි. තවද යම් හෙයකින් එම ඉල්ලුම්කරු තෝරාගනු ලැබුවහොත් ඔහු මුදවා හරිනු ලබන බවට ආයතන ප්‍රධානියාගේ සහතිකයක් ද ඒ සමග තිබිය යුතුයි.

*(ඇ)* සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන හෝ ඉල්ලා සිටින අවස්ථාවක අපේක්ෂකයින් විසින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුයි.

(1) උප්පැන්න සහතිකයේ මුල් පිටපත (අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කළ සහතිකය හා උප්පැන්න සහතිකයෙන් උපුටා ගත් සටහන භාරගනු නොලැබේ.)

(2) අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් ඇති බව ඔප්පු කිරීමට සහතික.

(3) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/කාර්මික පුහුණුව සහ හෝ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික.

(4) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්. මින් එකක් අවසන් වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ ප්‍රධානාචාර්යතුමාගෙන් විය යුතු අතර, අනෙක අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටි වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දැනට සේවා යෝජකයාගෙන් (දැනට සේවයේ යෙදී ඇත්නම් විය යුතුය.)

(5) ක්‍රීඩා, ශිෂ්‍යභට යනාදිය පිළිබඳ සහතික.

(ඈ) නියම කරනු ලැබූ විට ලියකියවිලි ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

(ඉ) කිසිඳු ලියකියවිලි හෝ සහතිකවල මුල් පිටපත් ඉල්ලුම්පත් සමග නොඑවිය යුතුයි.

(ඊ) ඉල්ලුම්පත සමග සහතිකවල මුල් පිටපත් එවා, ඒවා නැති වුවහොත් ගුවන් හමුදාව ඊට වගකියනු නොලැබේ.

09. සම්මුඛ පරීක්ෂණයන්ට සුදුසු යැයි සළකනු ලබන අපේක්ෂකයින් ඔවුන්ගේම වියදමින් ගුවන් හමුදා බඳවා ගැනීමේ මණ්ඩලය ඉදිරියෙහි සම්මුඛ පරීක්ෂණයන්ට පෙනී සිටිය යුතු වේ. සම්මුඛ පරීක්ෂණ කොළඹ, කොග්ගල, වීරවිල සහ අනුරාධපුරය පිහිටි ගුවන් හමුදා කඳවුරුවල පැවැත්වෙන බැවින් එම කඳවුරුවලින් තමන් සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට කැමති කඳවුර අයදුම්පතේ සඳහන් කළ යුතුය. සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනය සහ වේලාව පෞද්ගලිකව දන්වනු ලැබේ.

10. සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරු කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම ඔහුගේ ජාතික හැඳුම්පත ඉදිරිපත් කළ යුතුයි. ජාතික හැඳුනුම්පත නොමැති අයදුම්කරුවන් විසින් වෙනත් පිළිගනු ලැබූ අනන්‍යතා සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි. එසේ වුවද ජාතික හැඳුනුම්පත නොමැති අයදුම්කරුවන් සේවයට බඳවා ගනු නොලැබේ.

11. අවසාන සම්මුඛ පරීක්ෂණයෙන් පසුව සුදුසු වන අපේක්ෂකයින් ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියෙහි පෙනී සිටිය යුතුයි. සම්මුඛ පරීක්ෂණ වලින් ලබාගන්නා ලකුණුවල අගය අනුව අපේක්ෂකයින් ලැයිස්තුගත කරන අතර වෘත්තීය පුරප්පාඩු සඳහා අපේක්ෂකයින් තෝරාගනු ලබන්නේ ලබාගත් ලකුණුවල ඉහළ මට්ටමේ සිටයි.

12. අයදුම්කරුවෙකු නිර්දේශ කිරීමට කැමති ඕනෑම අයෙකු එසේ කල යුත්තේ ඔහුට චරිත සහතිකයක් දීමෙනි. යම් අපේක්ෂකයෙකු තෝරා ගැනීමට කවරාකාරයකින් හෝ පෙළඹවීමක් කිරීම, එසේ නැතහොත් එහිලා බලපෑමට උත්සාහ කිරීම ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු වීමට හේතු වන්නේය.

13. ඉල්ලුම් පත්‍රයෙහි අසත්‍ය ප්‍රකාශයක් කර තිබී, එම අසත්‍යතාවය අපේක්ෂකයා තෝරා ගැනීමට පෙර හෙළිදරව් වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අහිමි කිරීමට ද, තෝරා ගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත් වේ.

14. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කරුවන්ට ඒ බව දන්වා එවනු නොලැබේ.

ජී. ඩී. පෙරේරා,
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාපති.

මූලස්ථානය,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
තැ. පෙ. 594,
කොළඹ.

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් භටයින් සඳහා අයදුම්පත

*සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට කැමති ගුවන් හමුදා කඳවුර ................*

*(ශ්‍රී ලංකා ගුවන් හමුදාව කොළඹ, කොග්ගල, වීරවිල සහ අනුරාධපුර, යන කඳවුරු අතුරින් එකක් සඳහන් කරන්න)*

01. සම්පූර්ණ නම : ——————.
(ජාතික හැඳුනුම්පතට අනුව)

02. ජාතික හැඳුනුම්පත් අංකය : ——————.

03. ඉල්ලුම් කරනු ලබන වෘත්තිය : ——————.

04. තැපැල් ලිපිනය (ලිපි එවිය යුතු ලිපිනය) : ——————.

05. ස්ථිර ලිපිනය : ——————.

06. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය : ——————.

07. දිස්ත්‍රික්කය : ——————.

08. මැතිවරණ කොට්ඨාසය : ——————.

09. ග්‍රාම නිලධාරි කොට්ඨාසය : ——————.

10. දුරකථන අංකය : ——————.

11. උපන් දිනය : ——————.
(2006 ජූනි 30 දිනට වයස :
අවුරුදු : ——————, මාස :——————, දින : ——————.)

12. විවාහක/අවිවාහක බව : ——————.

13. උස : —— අඩි : ——, අඟල් : ——.

14. අ.පො.ස. (සා/පෙළ) විභාගය :

| *අවුරුද්ද* | *විභාග අංකය* | *සමත්වූ විෂයන්* | *ලැබූ ශ්‍රේණිය* |
|---|---|---|---|
| | | | |

15. අ.පො.ස. (උ/පෙළ) විභාගය :

| *අවුරුද්ද* | *විභාග අංකය* | *සමත්වූ විෂයන්* | *ලැබූ ශ්‍රේණිය* |
|---|---|---|---|
| | | | |

16. තනතුර සඳහා විශේෂ සුදුසුකම් (උදාහරණ වශයෙන් කාර්මික පුහුණුව, පළපුරුද්ද ආදිය) : ——————.

17. ක්‍රීඩා අතින් ලබා ඇති විශිෂ්ටතා පිළිබඳ විස්තර : ——————.

18. පාසලේදී හෝ බාහිර සංවිධානවලදී ලබා ඇති වෙනත් විශිෂ්ටතා : ——————.

19. මීට පෙර සන්නද්ධ සේවා හෝ පොලිස් සේවයට ඉල්ලුම් කර ඇත්නම් ඒ පිළිබඳ විස්තර : ——————.

20. සිවිල් හෝ යුද්ධ අධිකරණයේදී වැරදිකරු වී ඇති හෝ ඇහ බැඳ හෝ තිබේද? එසේ නම් විස්තර සඳහන් කරන්න. : —————.

21. චරිත සහතික පිළිබඳ විස්තර :

| නම | පදවි නාමය | ලිපිනය |
| --- | --- | --- |
| | | |

22. ඉල්ලුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

පූර්වෝක්ත ප්‍රකාශවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ උපරිම දැනුමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වූ ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවට බඳවා ගැනීම සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙල හා ඒ අයට අදාළ වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

——————,
දිනය : ——————. ඉල්ලුම්කරුගේ අත්සන.

04-24

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

## බඩු බාහිරාදිය විකිණීම්

## බඩු බාහිරාදිය විකිණීම්

### මහාධිකරණය - කෑගල්ල

කෑගල්ල අධිකරණ සංකීර්ණයේ ගොඩනැගිලිවලින් ඉවත් කරන ලද හා ආයතනය භාර මෙහි පහත උපලේඛනයේ දැක්වෙන භාණ්ඩ 2006.04.20 වෙනි දින පෙ.ව. 10.30 ට කෑගල්ල මහාධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. වෙන්දේසියට නියමිත භාණ්ඩ එදින ම වෙන්දේසියට පෙර පරීක්ෂා කර බැලිය හැකිය.

03. සියලුම භාණ්ඩ සම්බන්ධයෙන් වන අවසාන තීරණය කෑගල්ල මහාධිකරණ විනිසුරු තුමිය සතුය.

04. වෙන්දේසියේදී මිළදී ගන්නා භාණ්ඩ සඳහා එම අවස්ථාවේදීම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත්කර ගත යුතුය. සියලුම ගෙවීම් මුදලින් කල යුතු අතර, චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

05. භාණ්ඩ මිළදී ගන්නා පුද්ගලයන් තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

සිලානි කරුණාරත්න,
මහාධිකරණ විනිසුරු,
කෑගල්ල.

2006 මාර්තු මස 02 වැනි දින,
කෑගල්ල,
මහාධිකරණයේ දී ය.

#### උපලේඛනය

| | | |
| --- | --- | --- |
| 01. | දොර උළුවහු | 07 |
| 02. | ජනේල උළුවහු | 02 |
| 03. | ජනේල පියන් | 04 |
| 04. | දොර පියන් 08 හා වීදුරු කැඩී ඇති දොර පියන් | 11 |
| 05. | වීදුරු කැඩී ඇති ජනේල පියන් | 08 |
| 06. | වීදුරු රහිත ජනේල පියන් | 04 |
| 07. | දිරා ගිය උළුවහු කඳන් | 10 |
| 08. | පැතලි උලු ලොට් | 01 |
| 09. | වැහි පීලි ලොට් | 01 |
| 10. | ඇස්බැස්ටොස් සීට් ලොට් | 01 |
| 11. | පැතලි උළු 2500 පමණ හා මුදුන් උළු | 115 පමණ |
| 12. | උළු | 2600 පමණ |
| 13. | 1500-1600 දැල් ගැසූ රාමු | 01 |
| 14. | මි.මී. 1400x1500 දැල් ගැසූ රාමු | 01 |
| 15. | මි.මී. 1600x2280 දැල් ගැසූ රාමු | 01 |
| 16. | මි.මී. 850x2800 උළුවස්ස | 01 |
| 17. | මි.මී. 750x1800 දොර සමඟ උළුවස්ස | 01 |
| 18. | මි.මී. 700x1950 දොර සමඟ උළුවස්ස | 01 |
| 19. | මි.මී. 600x1000 ජනේල (දැල්ගැසූ) | 02 |
| 20. | මි.මී. 660x2000 දොර පියන් | 01 |
| 21. | මි.මී. 750x2000 දොර පියන් | 01 |
| 22. | ස්විච් | 15 |
| 23. | 5 (ඇමපියර්) ප්ලග් බේස් | 06 |
| 24. | 15 (ඇම්පියර්) ප්ලග් බේස් | 01 |
| 25. | බෙල් ස්විච් | 01 |
| 26. | ඩී බෝඩ් | 02 |
| 27. | 30 (ඇම්පියර්) මේන් ස්විච් | 01 |
| 28. | බේකර් 3 බොක්ස් | 01 |
| 29. | වයර් උර (කුඩා කැබලි ) | 01 |
| 30. | 450 x 450 එක්ස්හෝස් ෆෑන් | 01 |
| 31. | රෙගියුලේටර් | 16 |
| 32. | සිවිලින් ෆෑන් (අබලන් ) | 10 |
| 33. | ටියුබ් ලයිට් සෙට් (අබලන් ඒවාද සමඟ ) | 21 |
| 34. | ඇම්පියර් 60 ත්‍රී ජේස් මේන් ස්විච් | 01 |
| 35. | සිවිලින් ෆෑන් | 06 |
| 36. | 1′ x 1′ එක්සුෂ් ෆෑන් | 02 |
| 37. | 1 ගැන්ග් ස්විච් | 21 |
| 38. | 2 ගැන්ග් ස්විච් | 05 |
| 39. | 3 ගැන්ග් ස්විච් | 02 |
| 40. | 4 ගැන්ග් ස්විච් | 02 |
| 41. | 5 ගැන්ග් ස්විච් | 02 |
| 42. | ඇම්පියර් 5 ප්ලග් | 04 |
| 43. | 4′ සිංගල් ටියුබ් ලයිට් සෙට් | 05 |
| 44. | රෙගියුලේටර් | 10 |
| 45. | ඇම්පියර් 30 මේන් ස්වීච් | 04 |
| 46. | ඇම්පියර් 30 ට්‍රිප් ස්වීච් | 03 |
| 47. | පියුස් බොක්ස් | 02 |
| 48. | 250 ඩී. බී. පෙට්ටිය | 01 |
| 49. | වයර් කැලි උර | 04 |
| 50. | 4′ සිංගල් ටියුබ් ලයිට් (කේස් පමණක් ) | 23 |
| 51. | සිවිලින් ෆෑන් | 05 |
| 52. | 1 ගැන්ග් ස්වීච් | 07 |
| 53. | 2 ගැන්ග් ස්වීච් | 03 |
| 54. | 3 ගැන්ග් ස්වීච් | 02 |
| 55. | 4 ගැන්ස් ස්වීච් | 01 |
| 56. | 5 ගැන්ස් ස්වීච් | 01 |
| 57. | ඇම්පියර් 5 ප්ලග් | 06 |
| 58. | 4′ සිංගල් ටියුබ් ලයිට් සෙට් | 06 |
| 59. | රෙගියුලේටර් | 08 |
| 60. | ඇම්පියර් 30 ට්‍රිප් ස්වීච් | 02 |
| 61. | බේකර් | 04 |
| 62. | 250 ඩී බෝඩ් | 02 |
| 63. | වයර් කැලි උර | 02 |
| 64. | 3″ x 4″ x 10 ලී | 06 |
| 65. | 4″ x 4′ x 10′ .6′ ලී | 01 |
| 66. | උළුවහු කඳන් | 02 |
| 67. | 3′ x 6′ x 6′ පිට් පැනෙල් දොර පළු | 01 |
| 68. | 4′ x 6′ x 6′′ දැල් සහිත රාමු | 01 |
| 69. | 4′ x 6′ x 10″ දැල් සහිත රාමු | 02 |
| 70. | දිරා ගිය දොර උළුවහු | 01 |
| 71. | 3″ x 4″ x 11′ ලී | 01 |
| 72. | 2′ x 3″ x 8″ ලී | 01 |
| 73. | 5′ x 6′ x 7′ (දිරා ඇත. ) ලී | 01 |
| 74. | 2′ . 6″ x 5 . 9″ කැඩී ඇති කලම්ප දොර | 01 |
| 75. | 2′ . 6′ x 6′ . 3′ කැඩී ඇති කලම්ප දොර | 01 |
| 76. | වීදුරු කැඩී ඇති ජනෙල් රාමු ( 4′ x 4′ . .6′ ) | 02 |
| 77. | 2′ . 6″ x 6′ දොර පියන් | 01 |
| 78. | 6′ x 6″ 7′ . 6′ ලීකනු | 05 |
| 79. | 3′ x 2″ x10′ . 9′ දැල් | 01 |
| 80. | 9402361 ඔලිවේට්ටි සිංහල යතුරුලියන | 01 |
| 81. | 9080920 එම | 01 |
| 82. | 9080599 එම | 01 |
| 83. | (ෆැක්ස් යන්ත්‍ර (ෂැම්සුන්) | 01 |
| 84. | රෝනියෝ යන්ත්‍ර (ගෙස්ටෙනර්) | 01 |
| 85. | පරිඝනක (අයි. බී.එම්. මොඩල් අංක6282-68 ඒ (90එච්8සීඑච්.අයි.) | 01 |

03-645

## වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 6/29160/ටී6/349.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ* 2002.08.09 දින *ගැසට් පත්‍රයේ* සහ 2005.07.05 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, පානදුර, ඩයස් ගොඩනැගිල්ලේ හි බලයලත් වෙන්දේසිකාර එච්. හිල්ටන් පෙරේරා මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.05.20 වැනි දින පෙරවරු 9.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, තල්පිටි දෙබැද්ද, පානදුර පට්ටිය උතුර පිහිටි දොඹගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එල්. පී. එච්. ද සිල්වා විසින් සැකසුණු 1995.11.11 දින හා අංක 4356 දරන පිඹුරේ කැබලි අංක ජී (මෙය බලයලත් මිනින්දෝරු කේ. එස්. ඩබ්ලිව්. පීරිස් විසින් සැකසුණු 1959.02.20 දින හා අංක 1478 දරන පිඹුරේ කැබලි අංක ජී ලෙස ද දැක්වේ.) ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 4.56 ක්වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ.

මෙම ඉඩම් කොටස පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 196/235 යටතේ ලියාපදිංචි කොට ඇත.

තවද, එකී අංක 1478 දරන පිඹුරේ කැබලි අංක එක්ස්, වයි සහ ආර් මතින් ඇති මාර්ග අයිතිය ද සමග වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන* සාමාන්‍යාධිකාරී.

2006 මාර්තු මස 17 වැනි දින,
ගාලු පාරේ අංක 269,
කොළඹ 3.

03-735/22

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 6/35376/එල්6/227.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ* 2005.01.07 දින *ගැසට් පත්‍රයේ* සහ 2005.02.28 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, පානදුර, ඩයස් ගොඩනැගිල්ලේ හි බලයලත් වෙන්දේසිකාර එච්. හිල්ටන් පෙරේරා මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.05.20 වැනි දින පස්වරු 2.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ, තලගල පිහිටි කුඹුකේවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඒ. හෙට්ටිගේ විසින් සැකසුණු 1997.12.20 දින හා අංක 2326 දරන පිඹුරේ කැබලි අංක 34 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 15.25 ක්වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ.

මෙම ඉඩම කොටස පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 160/204 යටතේ ලියාපදිංචි කොට ඇත.

තවද, එකී අංක 2326 දරන පිඹුරේ කැබලි අංක 13 සහ 45 දරන බිම් කොටස් මතින් සහ හරහා ඇති මාර්ග අයිතිය ද සමග වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන* සාමාන්‍යාධිකාරී.

2006 මාර්තු මස 17 වැනි දින,
ගාලු පාරේ අංක 269,
කොළඹ 3.

03-735/21

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 6/36074/පී6/714.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ* 2005.09.16 දින *ගැසට් පත්‍රයේ* සහ 2005.10.31 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, පානදුර, ඩයස් ගොඩනැගිල්ලේ හි බලයලත් වෙන්දේසිකාර එච්. ගිල්ටන් පෙරේරා මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.05.20 වැනි දින මධ්‍යාහ්න 12.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ, කුඹුකෙ පිහිටි කහටගහහේන නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩී. එච්. ඇතුලත්මුදලි විසින් සැකසුණු 1998.05.11 දින හා අංක 3326 දරන පිඹුරේ කැබලි අංක 4 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 15 ක්වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ.

මෙම ඉඩම් කොටස පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 171/207 යටතේ ලියාපදිංචි කොට ඇත.

තවද, ඉහත කී පිඹුරේ කැබලි අංක 13 මතින් ඇති මාර්ග අයිතිය ද සමග වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන* සාමාන්‍යාධිකාරී.

2006 මාර්තු මස 17 වැනි දින,
ගාලු පාරේ අංක 269, කොළඹ 3.

03-735/20

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 6/39370/එච්6/919.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර

ගනු ලැබුවාවූ ද, *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ* 2005.07.08 දින *ගැසට් පත්‍රයේ* සහ 2005.10.24 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වි යහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, පානදුර, ඩයස් ගොඩනැගිල්ලේ හි බලයලත් වෙන්දේසිකාර එච්. ගිල්ටන් පෙරේරා මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.05.20 වැනි දින පස්වරු 4.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුණ දකුණ, මග්ගොන බැද්දේ, බේරුවල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ මුංහේන පිහිටි සිංහලදෙනියලන්ද සහ සිංහල දෙනියකැලේ නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු වයි. ජී. ද සිල්වා විසින් සැකසූණු 1998.08.20 දින හා අංක 820 දරන පිඹුරේ කැබලි අංක 39 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 10 ක්වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ.

මෙම ඉඩම කොටස කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එච් 246/52 යටතේ ලියාපදිංචි කොට ඇත.

තවද, එකී අංක 820 දරන පිඹුරේ කැබලි අංක13 (පාරක් සඳහා වෙන් කරන ලද බිම් කොටස) මතින් ඇති මාර්ග අයිතිය ද සමග වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන* සාමාන්‍යාධිකාරි.

2006 මාර්තු මස 17 වැනි දින,
ගාලු පාරේ අංක 269,
කොළඹ 3.
03-735/17

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 2/66918/ඒ2/945.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ* 2003.07.11 දින *ගැසට් පත්‍රයේ* සහ 2004.11.15 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වි යහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, ගම්පහ උසාවිය පාරේ සණස චතුරශ්‍රයේ අංක 15 හි බලයලත් වෙන්දේසිකාර ටී. එම්. එස්. පීරිස් මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.05.18 වැනි දින පෙරවරු 9.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, මහර ප්‍රාදේශීය සභා සීමාවන් තුළ පින්නමැද පිහිටි ජම්බුගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු වී. එෆ්. ජේ. පෙරේරා විසින් සැකසුනු 1998.05.14 දින හා අංක 13873 දරන පිඹුරේ කැබලි අංක සී 4 ඒ ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0 රූ. 0 පර්. 4.38 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ.

මෙම ඉඩම් කොටස ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 430/275 යටතේ ලියාපදිංචි කොට ඇත.

තවද, ඉහත කී පිඹුරේ කැබලි අංක සී 4 ඩී මතින් ඇති මාර්ග අයිතිය සහ බලයලත් මිනින්දෝරු ජී. ජයකොඩි විසින් සැකසුණු 1992.08.03 දින හා අංක 3363 දරන පිඹුරේ කැබලි අංක සී 7 මතින් දැක්වෙන මාර්ග අයිතිය ද සමග වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන* සාමාන්‍යාධිකාරි.

2006 මාර්තු මස 17 වැනි දින,
ගාලු පාරේ අංක 269,
කොළඹ 3.
03-735/8

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 2/70842/බී2/888.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ* 2004.01.02 දින *ගැසට් පත්‍රයේ* සහ 2005.01.03 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වි යහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, ගම්පහ, උසාවිය පාරේ, සණස චතුරශ්‍රයේ අංක 15 හි බලයලත් වෙන්දේසිකාර ටී. එම්. එස්. පීරිස් මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.05.18 වැනි දින පස්වරු 4.00ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව මහ නගර සභා සීමාවන් තුළ කට්ටුව ග්‍රාමයේ පිහිටි පල්ලන්චේන වත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එස්. එස්. පෙරේරා විසින් සැකසුණු 1996.09.18 දින හා අංක 3302 දරන පිඹුරේ කැබලි අංක 65 ඒ ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0 රූ. 0 පර්. 7ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි ගොඩනැගිලි ඇතුළු සියලුම දේත් සමග වේ.

මෙම ඉඩම් කොටස මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 810/284 යටතේ ලියාපදිංචි කොට ඇත.

තවද, පිඹුරු අංක 3153 ඒ හි සඳහන් කැබලි අංක 13 හා පිඹුරු අංක 3302 හි සඳහන් කැබලි අංක 62, 19 සහ 13 ඒ යන බිම් කොටස් මතින් හා හරහා ඇති මාර්ග අයිතිය ද සමග වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩ බලන* සාමාන්‍යාධිකාරි.

2006 මාර්තු මස 17වැනි දින,
ගාලු පාරේ අංක 269,
කොළඹ 3.
03-735/23

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : පීපී/02/00700/සී2/212.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ* 2004.06.11 දින *ගැසට් පත්‍රයේ* සහ 2005.02.11 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වි යහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, ගම්පහ, උසාවිය පාරේ, සණස චතුරශ්‍රයේ අංක 15 හි බලයලත් වෙන්දේසිකාර ටී. එම්. එස්. පීරිස් මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.05.18 වැනි දින පෙරවරු 10.30ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ හොරගොල්ල ග්‍රාමයේ (නමුත් හම්බාගම ලෙස ලියාපදිංචි වී ඇත) හේන පාරේ පිහිටි දෙල්ලහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඒ. ඒ. ජී. ඒ. රංජිත් විසින් සැකසුණු 2000.01.16 දින හා අංක 295 දරන පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0 රූ. 0 පර්. 12.5 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියළුම දේත් සමග වේ.

මෙම ඉඩම් කොටස ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 429/176 යටතේ ලියාපදිංචි කොට ඇත.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩ බලන* සාමාන්‍යාධිකාරි.

2006 මාර්තු මස 17වැනි දින,
ගාලු පාරේ අංක 269,
කොළඹ 3.
03-735/19

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : පීපී/2/01777/කේ2/686.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ* 2005.04.21 දින *ගැසට් පත්‍රයේ* සහ 2005.07.06 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වි යහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, ගම්පහ, උසාවිය පාරේ, සණස චතුරශ්‍රයේ අංක 15 හි බලයලත් වෙන්දේසිකාර ටී. එම්. එස්. පීරිස් මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.05.18 වැනි දින මධ්‍යාහ්න 12.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ නයිවල පිහිටි හූරිගහලන්ද නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. පී. ආර්. පතිරාජ විසින් සැකසුණු 2003.02.03 දින හා අංක 470 දරන පිඹුරේ කැබලි අංක 1 ඒ ලෙස (මෙම ඉඩම 2002.10.28 දින නැවතත් බෙදා වෙන් කරන ලදී.) දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0 රූ. 1 පර්. 35ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ.

මෙම ඉඩම් කොටස ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 316/147 යටතේ ලියාපදිංචි කොට ඇත.

තවද, එකී අංක 470 දරන පිඹුරේ කැබලි අංක 1 බී මතින් ඇති මාර්ග අයිතිය ද සමග වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩ බලන* සාමාන්‍යාධිකාරි.

2006 මාර්තු මස 17වැනි දින,
ගාලු පාරේ අංක 269,
කොළඹ 3.
03-735/18

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 2/71819/සී2/163.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ* 2005.10.28 දින *ගැසට් පත්‍රයේ* සහ 2005.12.27 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වි යහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, ගම්පහ, උසාවිය පාරේ, සණස චතුරශ්‍රයේ අංක 15 හි බලයලත් වෙන්දේසිකාර ටී. එම්. එස්. පීරිස් මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.05.18 වැනි දින පස්වරු 2.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, දිවුලපිටිය ප්‍රාදේශීය සභා සීමාවන් තුළ පහළ මඩම්පැල්ල පිහිටි දෙල්ගහවත්ත, දවටගහවත්ත, දෙල්ගහවත්ත හෙවත් දවටගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එල්. කේ. සී. එන්. ඇපාසිංහ විසින් සැකසුණු 1999.06.23 දින හා අංක 1167 දරන පිඹුරේ කැබලි අංක 5 (මෙය බලයලත් මිනින්දෝරු එල්. කේ. සී. එන්. ඇපාසිංහ විසින් සැකසුණු 1999.06.23 දින හා අංක 1151 දරන පිඹුරේ කැබැලි අංක 1 හි අනු බෙදුමකි) ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0 රූ. 0 පර්. 13.10 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ.

මෙම ඉඩම් කොටස මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 819/264 යටතේ ලියාපදිංචි කොට ඇත.

තවද, ඉහත කී අංක 1167 දරන පිඹුරේ කැබලි අංක 4 (පාරක් සඳහා වෙන් කරන ලද බිම් කොටස) මතින් ඇති මාර්ග අයිතිය ද සමග වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩ බලන* සාමාන්‍යාධිකාරි.

2006 මාර්තු මස 17 වැනි දින,
ගාලු පාරේ අංක 269,
කොළඹ 3.

03-735/16

---

## මහජන බැංකුව - කැළණිය ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

කැළණිය, ඊරියවැටිය හි පදිංචියට හෝ ව්‍යාපාරික කටයුතු සඳහා සුදුසු පරිසරයක පිහිටි වාණිජ ගොඩනැගිල්ලක් සහිත රූඩ් එකයි පර්චස් එකයි දශම හතයි පහ (අ. 0, රූ. 1, පර්. 1.75) ක ඉඩම මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින්, 2006.04.28 වැනි දින පෙ. ව. 11.00ට ප්‍රසිද්ධ වෙන්දේසියේ දේපල පිහිටි ස්ථානයේ දී විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 1998.03.27 දින ද, ඩේලිනිව්ස්, දිනමිණ සහ තිනකරන් පුවත්පත් වල 1998.03.09 දින ද, පල කර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසීම.*–කොළඹ - නුවර පාරේ කොළඹ සිට පැමිණෙන විට කිරිබත්ගොඩ නගරයෙන් වමට ඇති ඊරියවැටිය පාරේ මී. 400ක් පමණ ගියපසු පාරේ වම්පස මෙම දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*–වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැනුම් මිලෙන් 10%ක්.
2. පලාත් අධිකාරියේ බදු සඳහා පලාත් අධිකාරියට 1%ක්.
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්.
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක්.
5. විකුණුම් වියදම සමඟ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල.
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැනුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුලත මුදුන්ගොඩ, බැලුම්මහර, නුවර පාර, අංක 131, මහජන බැංකුව, බටහිර කලාප 111 කාර්යාලයේ සහකාර සාමාන්‍යාධිකාරි වෙත ගෙවිය යුතුය.

දුරකථන අංකය : 033-2222325, 033-2225008, 033-2226741

ෆැක්ස් අංකය : 033-2226165

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කල මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ටී. එම්. එස්. පීරිස්,
බලය ලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් සහ බ්‍රෝකර්.

අංක 15, සණස චතුරශ්‍රය,
උසාවිය පාර,
ගම්පහ.
දුරකථන අංක : 071-2765469
033-2231926

03-637

---

## පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් ලිමිටඩ්

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශෙෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකිණීමයි

**පදිංචියට සුදුසු වටිනා දේපලක් වෙන්දේසියේ විකිණීමයි**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩ විල්ලි හත්පත්තු, තිරගඩාහයේ කෝරළේ තිරාගම ග්‍රාමයේ පිහිටි බලයලත් මිනින්දෝරු ඊ. ඒ. ජී. එදිරිසිංහ විසින් සාදන ලද 2002.09.19 දින හා 202128 අංක දරණ පිඹුරේ ලොට් අංක 01 වශයෙන් නිරූපිත කිරිවානකැටියේහේන දැන් වත්ත යනුවෙන් හඳුන්වන ලද බෙදා වෙන් කළ ඉඩම් කොටස.

ඉඩම ප්‍රමාණයෙන් අ. 01, රූ. 0, පර්චස් 17.8

එහි පිහිටි වැව්ලි, ගොඩනැගිලි සහ සියළු දේ සමග

*ඉඩමට යන මාර්ගය.*— කුරුණෑගල සිට කොළඹ ප්‍රධාන මාර්ගයේ කි. මී. 6 1/2 දම්බොක්ක දක්වා ගමන්කර වමට හැරී රඹුක්කන පාරේ කි. මී. 2 ක් ගමන්කොට නාගලාගමුව හන්දිය තිරාගමට ලහාවී, පල්ලියට ඉදිරිපිට ගම්මානයට යන ප්‍රාදේශීය සභා පාරේ ගමන් කර බොරළු පාරට යාබදව වමේ ප්‍රධාන හන්දියේ සිට මීටර් 100 ක නොඅඩු දුරින් පිහිටි ඉඩම පෙ. ව. 11.00 ට පිහිටි සථානයේදී

ජේ. සී. කොම් ඉන්fපාමේෂන් ටෙක්නෝලොජි ආයතනයේ අයිතිකරු ජයබාහු මුදියන්සේලාගේ සුනිල් බණ්ඩාර ජයබාහු විසින් දේපල පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් ලිමිටඩ් හි (කලින් පැන් ඒෂියා බැංකින් ලිමිටඩ්) උකස් කරන ලදී. සීමාසහිත පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් විසින් අප වෙත පවරන ලද බලතල අනුව 2006 අප්‍රේල් 27 බ්‍රහස්පතින්දා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය .*— මිල තීන්දු වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් වටිනාකම් මුදලින් ගෙවීය යුතුය.

1. ගැණුම් මිළෙන් 25%,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක් වන පළාත් අධිකාරි බදු,
3. විකුණුම් මිලෙන් 2. 1/2% (සියයට දෙකහමාරක පමණක්) වන වෙන්දේසිකරුගේ කොමිස් මුදල,
4. රු. 45,000 ක් නොඉක්මවන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැයෙන් 50% ක්,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500 ක්,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000 ක්
7. ගැණුම් මිල මත එකතු අගය මත බද්ද (වැට්) 15%.

ගැණුම් මිලෙන් ඉතිරි 75% වෙන්දේසි දින සිට දින තිහක් (30) ඇතුළත ගෙවිය යුතුය. යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2005.12.13 දින දරණ සිලෝන්

ඩේලි නිව්ස්, ලක්බිම හා සුඩර් ඔලි පුවත්පත් හා 2005.12.30 දි දරණ *රජයේ ගැසට් පත්‍රයද* බලන්න.

වැඩිදුර විස්තර ලබාගැනීමත්, හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල ලිපිලේඛණ පරීක්ෂා කර බැලීමත් කොළඹ 3, ගාලු පාරේ, අංක 450 හි, සීමාසහිත පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් ලිමිටඩ් කළමණාකරු - නීති වෙතින් සිදුකළ හැකිය. දුරකථන අංක 2565573, 2565565

ෂොක්මන් සහ සමරවික්‍රම,
ශ්‍රී ලංකාවේ පිළිගත් පුරෝගාමී වරලත් වෙන්දේසිකරුවෝ,
සහ තක්සේරුකරුවෝ.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන : 081-2227593
දුරකථන /ෆැක්ස් : 081-2224371

*නගර කාර්යාලය :*
අංක 55ඒ, ධර්මපාල මාවත,
කොළඹ 03.
දුරකථන : 01-2441761
දුරකථන /ෆැක්ස් : 2448526
ඊ-මේල් :samera@sri.lanka.net

03-696

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ
53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 6/34959/පී6/286.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ* 2003.07.04 දින *ගැසට් පත්‍රයේ* සහ 2004.11.15 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොලිය, වි යහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, පානදුර, ඩයස් ගොඩනැගිල්ලේ හි බලයලත් වෙන්දේසිකාර එච්. ගිල්ටන් පෙරේරා මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.05.20 වැනි දින පෙරවරු 10.30ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, තල්පිට දෙබැද්ද, පානදුර නගර සභා සීමාවන් තුළ නල්ලුරුව, ජයන්ති මාවතේ, වරිපනම් අංක 25/12 දරන ස්ථානයේ පිහිටි මුදිල්ලගහවත්ත සහ පන්නපහළ එරමුදුගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එල්. ඩබ්. එල්. ද සිල්වා විසින් සැකසුණු 1986.05.21 දින හා අංක 5414 දරන පිඹුරේ කැබලි අංක 6 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0 රූ, 0 පර්. 14ක් වූ බෙදා වෙන් කරන ද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ.

මෙම ඉඩම් කොටස පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ්. 177/153 යටතේ ලියාපදිංචි කොට ඇත.

තවද, එකී අංක 5414 දරන පිඹුරේ කැබලි අංක 8ඒ, 4ඒ සහ 4 (පාරවල් සඳහා වෙන් කරන ලද) බිම් කොටස් මතින් හා හරහා ඇති මාර්ග අයිතිය ද සමග වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩ බලන සාමාන්‍යාධිකාරී.*

2006 මාර්තු මස 17 වැනි දින,
ගාලු පාරේ අංක 269,
කොළඹ 3.

03-735/15

---

## ප්‍රසිද්ධ වෙන්දේසියක්

රුපියල් දොලොස් ලක්ෂ හැත්තෑ හත් දහස් අටසිය පනහයි ශත අනූ අට (රු. 1,277,850.98) ක මුදලක් සහ එම මුදල මත දැනට සියයට තිස් දෙකක් (32%) ක් වූ එකී මුදල මත දැනට සියයට හයයි දශම නමයයි පහක් (6.95%) වන ව්‍යාපාරික පිරිවැටුම් බදු හා වෙනත් ව්‍යවස්ථාපිත අයකිරීම් ද වර්ෂ 1998 ක් වූ මැයි මස 16 වන දින සිට තීන්දු ප්‍රකාශයේ දිනය තෙක් වර්ෂයකට සියයට තිස් දෙකක් (32%) අනුප්‍රමාණයෙන් අනුව වූ පොළියක් ද ඉන් අනතුරුව තීන්දු ප්‍රකාශයේ මුළු මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් කරනු ලබන තෙක් ඒ මුදල මත එම අනුප්‍රමාණයට අනුව වූ පොළියක් ද නඩු ගාස්තු සහ වෙන්දේසිකරුගේ ගාස්තු ද අයකර ගැනීම පිණිස (1) ජාඇල, දකුණු කුඩහකපොළ අංක 112 දරන ස්ථානයේ පිහිටි ටී. යූ. එන් ඉන්ටනැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ (2) ජා-ඇළ, දකුණු කුඩහකපොළ අංක 112 දරන ස්ථානයේ පදිංචි කිරිපිටිගේ බැසිල් හෙක්ටර් පිලිප් පෙරේරා යන අයවලුන්ට විරුද්ධව කොළඹ 03 ශාන්ත මයිකල් පාරේ, අංක 28 දරන ස්ථානයේ පිහිටි මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ලිමිටඩ් යන ආයතනය විසින් කොළඹ දිසා අධිකරණයේ අංක 16958/එම්බී දරන නඩුවෙන් මා වෙත පවරන ලද කොමිසම මත පහත සඳහන් උපලේඛනයේ සඳහන් දේපල වර්ෂ 2006ක් වූ අප්‍රේල් මස 21 වැනි දින පෙරවරු 11.00ට අදාළ දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසන් වූ විගස ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවෙලේ ම වෙන්දේසිකරු වෙත ගෙවා සිටිය යුතුය. (1) ගැණුම් මිලෙන් 25%ක් ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද, (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2%ක් ද, (4) වෙන්දේසි සඳහා දරන්නට වූ වියදම් ද, (5) වෙන්දේසි කොන්දේසි සහතික කිරීමේ ගාස්තු වශයෙන් රු. 2,000 (6) ලිපිකරු හා ගෝෂක ගාස්තු වශයෙන් රු. 1,000ක මුදලක් ද වන අතර ගැණුම් මිලේ පරිශේෂය වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත කොළඹ දිසා අධිකරණයේ මෙම නඩුවේ බැරට තැන්පත් කළ යුතුය.

දේපළ ළඟා වීමේ ක්‍රමය.– කොළඹ සිට ජාඇල හරහා නාරම්මල දක්වා ගොස් නාරම්මල කුරුණෑගල පාරේ පිහිටි කළුගමුව හංදිය පසුකර සැතපුම් 3/4ක් පමණ ගිය පසුව හමුවන 13/1 දරන බෝක්කුව පසුකර යාර 50ක් පමණ ඉදිරියට ගිය පසුව නාරම්මල - කුරුණෑගල පාරේ දකුණු පසින් මෙම දේපල පිහිටා ඇත.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදිහත් පත්තුවේ මැදි උඩකහ කෝරළේ කලගමුවෙහි පිහිටා ඇත්තාවූ ද, උතුරට: නාරම්මල සිට කුරුණෑගල දක්වා වූ මහා මාර්ගයෙන් ද නැගෙනහිරට: බලයලත් මිනින්දෝරු ජේ. වින්සන්ට් පෙරේරා මහතා විසින් සාදන ලද අංක 1800 හා 1959.04.29 වැනි දින දරන පිඹුරේ "බී" බිම් කැබැල්ලේ ඉතිරි කොටසින් ද දකුණට: හේරත් අප්පුහිමිලාගේ දැන් ඩී. එම්. පියසිංහගේ උරුමක්කාරයන්ගේ ඉඩමෙන් හා බස්නාහිරට විජේසිංහ මුදලාලිට අයත් එකී ඉඩමේ "ඒ " බිම් කැබැල්ලෙන් මායිම් වූ ද කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 726/246 යටතේ ලියාපදිංචි කර ඇත්තාවූ ද, ගල් මොරතුගොල යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙන් ඉහත කී "බී" බිම් කැබැල්ල ප්‍රමාණයෙන් අක්කර එකක් (අ. 1 රූ. 0 පර්. 0) වූ බෙදා වෙන් කරන ලද මුළු බස්නාහිර කොටස වේ.

ඉහත සඳහන් ඉඩම පහත සඳහන් පරිදි ද විස්තර කර ඇත :

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේව මැදිහත් පත්තුවේ මැදි උඩකහ කෝරළේ කලගමුව ගම් සභා සීමාව ඇතුලත කළගමුවේ පිහිටා ඇත්තාවූ ද උතුරට: මහා මාර්ගයෙන් ද, නැගෙනහිරට: මේ ඉඩමේ "ඩී 2" බිම් කැබැල්ලෙන් ද දකුණට හේරත් අප්පුහිමිලාගේ උරුමක්කාරයන්ගේ ඉඩමෙන් හා බස්නාහිරට බලයලත් මිනින්දෝරු ජේ. වින්සන්ට් පෙරේරා මහතා විසින් සාදන ලද අංක 1800 හා 1959.04.29 වැනි දින දරන පිඹුරේ "ඒ" බිම් කැබැල්ලෙන් ද මායිම් වූ ද අංක 1800 දරන පිඹුර අනුව අක්කර එකකින් (අ. 1 රූ. 0 පර්. 0) යුක්ත වූ "ගල් මෝරතුගොල" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ජේ. එල්. චන්ද්‍රරත්න මහතා විසින් 1972 අගෝස්තු මස 02 වැනි දින කරන ලද පිටසනක් ද සහිතව බලයලත් මිනින්දෝරු ජේ. වින්සන්ට් පෙරේරා විසින් සාදන ලද ඉහත කී අංක 1800 හා 1959.04.29 වැනි දින දරන පිඹුරේ "බී" වශයෙන් සළකුණු කොට ඇති බෙදා වෙන් කරන ලද හා නිශ්චිත මුලු ඉඩම් කැබැල්ල ද වේ.

වැඩිදුර විස්තර සහ අදාල ලියවිලි පරීක්ෂා කිරීම සඳහා කොළඹ 03, ශාන්ත මයිකල් පාරේ අංක 28 දරන ස්ථානයේ 14 මහලේ පිහිටි මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ලිමිටඩ් හි කළමනාකාරිනි - නීති නීතිඥ මිහුරුම් ජයසිංහ මහත්මියගෙන් විමසන්න. දුරකථන අංක : 4711711.

ජී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක : 2873656,
ෆැක්ස් : 2871184, ජංගම 0777-672082.

03-729

---

## සීමාසහිත සෙලාන් බැංකුව – කෝපරේට් බැංකිං ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහ නගර සභා සීමාව තුළ කෙසෙල්වත්ත වෝඩ් අංක 18 හි පිහිටි 1999 දෙසැම්බර් මස 14 දිනැති අංක 424 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ඕල්කොට් මාවත වරිපනම් අංක 343 දරන (1994 සැප්තැම්බර් මස 24 දිනැති අංක 606 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ඒ කැබැල්ලෙහි නැවත මැනීමක් සහ අතුරු බෙදීමක් වන) කැබලි අංක 1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස තුළ පර්චස් හතයි දශම දෙකයි බිංදුවක් (අ. 0 රූ. 0 පර්. 7.20) විශාල ඉඩම.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සහ මහ නගර සභා සීමාව තුළ කෙසෙල්වත්ත වෝඩ් අංක 18 හි පිහිටි 1999 දෙසැම්බර් මස 14 දිනැති අංක 424 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ඕල්කොට් මාවත වරිපනම් අංක 343 දරන (1994 සැප්තැම්බර් මස 24 දිනැති අංක 606 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ඒ කැබැල්ලෙහි නැවත මැනීමක් සහ අතුරු බෙදීමක් වන) කැබලි අංක 2 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස තුළ පර්චස් හයක් (අ. 0 රූ, 0 පර්. 6) විශාල ඉඩම.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සහ මහ නගර සභා සීමාව තුළ කෙසෙල්වත්ත වෝඩ් 18 හි පිහිටි 1999 දෙසැම්බර් මස 14 දිනැති අංක 424 දරන සැලැස්මේ පෙන්නුම් කරන ලබන ඕල්කොට් මාවත වරිපනම් අංක 343 දරන (1994 සැප්තැම්බර් මස 24 දිනැති අංක 606 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ඒ කැබැල්ලෙහි නැවත මැනීමක් සහ අතුරු බෙදීමක් වන) කැබලි අංක 3 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස තුළ පර්චස් හයක් (අ. 0 රූ. 0 පර්. 6) විශාල ඉඩම.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සහ මහ නගර සභා සීමාව තුළ කෙසෙල්වත්ත වෝඩ් අංක 18 හි පිහිටි 1999 දෙසැම්බර් මස 14 දිනැති අංක 424 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ඕල්කොට් මාවත වරිපනම් අංක 343 දරන (1994 සැප්තැම්බර් මස 24 දිනැති අංක 606 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ඒ කැබැල්ලෙහි නැවත මැනීමක් සහ අතුරු බෙදීමක් වන) කැබලි අංක 4 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස තුළ පර්චස් හයක් (අ. 0 රූ, 0 පර්. 6) විශාල ඉඩම.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සහ මහ නගර සභා සීමාව තුළ කෙසෙල්වත්ත වෝඩ් අංක 18 හි පිහිටි 1999 දෙසැම්බර් මස 14 දිනැති අංක 424 දරන සැලැස්මේ පෙන්නුම් කරන ලබන ඕල්කොට් මාවත වරිපනම් අංක 343 දරන (1994 සැප්තැම්බර් මස 24 දිනැති අංක 606 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ඒ කැබැල්ලෙහි නැවත මැනීමක් සහ අතුරු බෙදීමක් වන) කැබලි අංක 5 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස තුළ පර්චස් හයක් (අ. 0 රූ. 0 පර්. 6) විශාල ඉඩම.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සහ මහ නගර සභා සීමාව තුළ කෙසෙල්වත්ත වෝඩ් 18 හි පිහිටි 1999 දෙසැම්බර් මස 14 දිනැති අංක 424 දරන සැලැස්මේ පෙන්නුම් කරන ලබන ඕල්කොට් මාවත වරිපනම් අංක 343 දරන (1994 සැප්තැම්බර් මස 24 දිනැති අංක 606 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ඒ කැබැල්ලෙහි නැවත මැනීමක් සහ අතුරු බෙදීමක් වන) කැබලි අංක 6 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස තුළ පර්චස් හයක් (අ. 0 රූ. 0 පර්. 6) විශාල ඉඩම.

බස්නාහිර පලාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සහ මහ නගර සභා සීමාව තුළ කෙසෙල්වත්ත වෝඩ් අංක 18 හි පිහිටි 1999 දෙසැම්බර් මස 14 දිනැති අංක 424 දරන සැලැස්මේ පෙන්නුම් කරන ලබන ඕල්කොට් මාවත වරිපනම් අංක 343 දරන (1994 සැප්තැම්බර් මස 24 දිනැති අංක 606 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ඒ කැබැල්ලෙහි නැවත මැනීමක් සහ අතුරු බෙදීමක් වන) කැබලි අංක 14 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස තුළ පර්චස් හයක් (අ. 0 රූ. 0 පර්. 6) විශාල ඉඩම.

බස්නාහිර පලාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සහ මහ නගර සභා සීමාව තුළ කෙසෙල්වත්ත වෝඩ් අංක 18 හි පිහිටි 1999 දෙසැම්බර් මස 14 දිනැති අංක 424 දරන සැලැස්මේ පෙන්නුම් කරන ලබන ඕල්කොට් මාවත වරිපනම් අංක 343 දරන (1994 සැප්තැම්බර් මස 24 දිනැති අංක 606 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ඒ කැබැල්ලෙහි නැවත මැනීමක් සහ අතුරු බෙදීමක් වන) කැබලි අංක 15 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස තුළ පර්චස් හයක් (අ. 0 රූ. 0 පර්. 6) විශාල ඉඩම.

බස්නාහිර පලාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සහ මහ නගර සභා සීමාව තුළ කෙසෙල්වත්ත වෝඩ් අංක 18 හි පිහිටි 1999 දෙසැම්බර් මස 14 දිනැති අංක 424 දරන සැලැස්මේ පෙන්නුම් කරන ලබන ඕල්කොට් මාවත වරිපනම් අංක 343 දරන (1994 සැප්තැම්බර් මස 24 දිනැති අංක 606 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ඒ කැබැල්ලෙහි නැවත මැනීමක් සහ අතුරු බෙදීමක් වන) කැබලි අංක 16 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස තුළ පර්චස් හයක් (අ. 0 රූ. 0 පර්. 6) විශාල ඉඩම.

බස්නාහිර පලාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සහ මහ නගර සභා සීමාව තුළ කෙසෙල්වත්ත වෝඩ් අංක 18 හි පිහිටි 1999 දෙසැම්බර් මස 14 දිනැති අංක 424 දරන සැලැස්මේ පෙන්නුම් කරන ලබන ඕල්කොට් මාවත වරිපනම් අංක 343 දරන (1994 සැප්තැම්බර් මස 24 දිනැති අංක 606 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ඒ කැබැල්ලෙහි නැවත මැනීමක් සහ අතුරු බෙදීමක් වන) කැබලි අංක 17 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස තුළ පර්චස් හයක් (අ. 0 රූ. 0 පර්. 6) විශාල ඉඩම.

බස්නාහිර පලාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සහ මහ නගර සභා සීමාව තුළ කෙසෙල්වත්ත වෝඩ් අංක 18 හි පිහිටි 1999 දෙසැම්බර් මස 14 දිනැති අංක 424 දරන සැලැස්මේ පෙන්නුම් කරන ලබන ඕල්කොට් මාවත වරිපනම් අංක 343 දරන (1994 සැප්තැම්බර් මස 24 දිනැති අංක 606 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ඒ කැබැල්ලෙහි නැවත මැනීමක් සහ අතුරු බෙදීමක් වන) කැබලි අංක 18 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස තුළ පර්චස් හයක් (අ. 0 රූ. 0 පර්. 6) විශාල ඉඩම.

බස්නාහිර පලාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සහ මහ නගර සභා සීමාව තුළ කෙසෙල්වත්ත වෝඩ් අංක 18 හි පිහිටි 1999 දෙසැම්බර් මස 14 දිනැති අංක 424 දරන සැලැස්මේ පෙන්නුම් කරන ලබන ඕල්කොට් මාවත වරිපනම් අංක 343 දරන (1994 සැප්තැම්බර් මස 24 දිනැති අංක 606 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ඒ කැබැල්ලෙහි නැවත මැනීමක් සහ අතුරු බෙදීමක් වන) කැබලි අංක 19 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස තුළ පර්චස් හයක් (අ. 0 රූ. 0 පර්. 6) විශාල ඉඩම.

ඉහත සඳහන් ඉඩම් කැබලි බස්නාහිර පළාතේ කොලඹ දිස්ත්‍රික්කයේ සහ කොළඹ මහ නගර සභා සීමාව තුළ කෙසෙල්වත්ත වෝඩ් අංක 18 හි ඕල්කොට් මාවත වරිපනම් අංක 343 දරන දේපලට බලය ලත් මිනින්දෝරු බී. යූ. එස්. ප්‍රනාන්දු විසින් සාදන ලද 1999 දෙසැම්බර් මස 14 දිනැති අංක 424 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන අංක 1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසින් බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස් වන අතර (බලයලත් මිනුම්දෝරු ආර්. කරුණාරත්න විසින් සාදන ලද 1994 සැප්තැම්බර් මස 24 දිනැති අංක 606 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ඒ කැබැල්ලෙහි නැවත මැනීමක් සහ අතුරු බෙදීමක් වන) එයට මායිම් උතුරට: පාර ද, නැගෙනහිරට: ශාන්ත සෙබස්තියන් හිල් හි වරිපනම් අංක 34/10 දරන දේපළ ද, දකුණට වරාය අධිකාරියට අයිති ශාන්ත සෙබස්තියන් හිල් හි වරිපනම් අංක 75 සහ බස්නාහිරට: ඕල්කොට් මාවත ද යන මායිම් තුළ රූඩ් දෙකයි පර්චස් තිස් හතරක් (අ. 0 රූ. 02, පර්. 34) විශාල ඉඩම. මෙය කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 976/164 හි ලියාපදිංචි කර ඇත.

මෙම දේපල කොළඹ 05 ලියාපදිංචි එන් (ජීබීඑස් සීබීජී) 85 දරන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන ලංකා ට්‍රැක්ටර්ස් ලිමිටඩ් යන අය බන්ධනදායි වශයෙන් සීමාසහිත සෙලාන් බැංකුව වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

ඉහත සඳහන් දේපල 2006 අප්‍රේල් මස 26 වැනි දින පෙරවරු 10.00 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ඉඩමට පිවිසීම.*– ගැස්පහ හන්දියේ සිට මීටර් 450ක් ඕල්කට් මාවත ඔස්සේ මරදාන දෙසට පැමිණ වමට ඇත සාන්ච් ආරච්චි වත්ත පාරේ මීටර් 40ක් ගිය විට පාරේ දකුණු පස අදාල දේපල පිහිටා ඇත.

යෝජනා සම්මුති දැන්වීම රජයේ *ගැසට් පත්‍රයේ* 2006.03.10 වැනි දින ද, ලංකාදීප, ඩේලිමිරර් සහ වීරකේෂරී පත්‍රයේ 2006.03.10 වැනි දින ද පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.*– සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය. ගැනුම් මිලෙන් 10%ක් (සියයට දහයක්), පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1%ක් වන පලාත් අධිකාරි බද්ද (සියයට එකක්) වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000 ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, සියලුම ප්‍රචාරක වියදම් සහ ගැනුම් මිලෙන් ඉතිරි (සියයට අනූව) 90% විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සීමාසහිත සෙලාන් බැංකුවට ගෙවා නිම කළ යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. සහකාර සාමාන්‍යාධිකාරි (නීති) සීමාසහිත සෙලාන් බැංකුව, අංක 90, ගාලු පාර කොළඹ 03.

දුරකථන අංක : 2456285, 2456263, 2456284.

තුසිත කරුණාරත්න,
උසාවි කොමසාරිස් තක්සේරුකරු,
සහ බලයලත් වෙන්දේසිකරු.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත,
කොලොන්නාව.
දුරකථන අංක : 2696155, 2572940.

03-728

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2006 අංක 68

අංකය : ඩී/ඒඑෆ්/8.

### ශ්‍රී ලංකා ගුවන් හමුදාව

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් දක්වා ඇති දිනයන්හි සිට ස්ථිර ගුවන් කොමදෝරු නිලයට උසස් කෙරේ :–

තාවකාලික ගුවන් කොමදෝරු පොන්නදුරෙයිසාමි බාලසුන්දරම් ප්‍රේමචන්ද්‍ර ( 01318) නි.පො.රා. 2006.01.01 ;

තාවකාලික ගුවන් කොමදෝරු බටන්ගල දිසානායක රණසිංහ අතපත්තු මුදියන්සෙලාගේ යමුනා කාන්ති රත්නායක (01323) වෛද්‍ය - 2006.01.01 ;

තාවකාලික ගුවන් කොමදෝරු එල්ලාලගොඩ ගමගේ ජීවත් ප්‍රියශාන්ත ද සිල්වා (01286) කාර්/ඉංජි 2006.01.01.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්.ඩබ්.පී. ආර්.එස්.පී. පී. එස්. සී.,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 ජනවරි මස 13 වැනි දින,
කොළඹ දී ය.
03–627

---

2006 අංක 69

අංකය : ඩී/ඒඑෆ්/512.

### ශ්‍රී ලංකා ගුවන් හමුදාව

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2006 අප්‍රේල් මස 30 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නවා ඇත :–

ගෲප් කැප්ටන් රියන්සි කෝලිත ශ්‍රී නිශ්ශංක (01398)-පාලන/රෙජි.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පී.එස්.සී.,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා
සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 ජනවාරි මස 13 වැනි දින,
කොළඹ දී ය.
03-624

---

2006 අංක 70

### ශ්‍රී ලංකා ගුවන් හමුදාව

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ස්ථිර ගෲප් කැප්ටන් නිලයට උසස් කෙරේ :–

තාවකාලික ගෲප් කැප්ටන් කපිල වීදිය බණ්ඩාර ජයම්පති (01407) නි.පො.රා 2005.07.01 ;

තාවකාලික ගෲප් කැප්ටන් ක්‍රිශාන්තස් රනිල් ගුරුසිංහ (01365) නි.පො.රා. 2005.07.02 ;

තාවකාලික ගෲප් කැප්ටන් ප්‍රසන්න භාතිය රත්නායක (01291) නි.පො.රා. 2005.07.03 ;

තාවකාලික ගෲප් කැප්ටන් කොඩිතුවක්කු ආරච්චිගේ ප්‍රසාද් සේනක අගුලුගහ (01349) උපකරණ 2005.07.04 ;

තාවකාලික ගෲප් කැප්ටන් ලොකුගන් හේවගේ අජන්ත සිල්වා (01382) කාර්/ඉංජි. 2006.01.01 ;

තාවකාලික ගෲප් කැප්ටන් රොහාන් ජයලාල් පතිරගේ (01410) කාර්/සංඥා 2006.01.01 ;

තාවකාලික ගෲප් කැප්ටන් දිසානායක මුදියන්සෙලාගේ සුනිල් කරුණාරත්න (01633) වෛද්‍ය 2006.02.26.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පී.එස්.සී.,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා
සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 ජනවාරි මස 13 වැනි දින,
කොළඹ දී ය.
03-623

---

2006 අංක 71

අංකය : ඩී/ඒඑෆ්/10(ii).

### ශ්‍රී ලංකා ගුවන් හමුදාව

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ස්ථිර විං කමාන්ඩර් නිලයට උසස් කෙරේ :–

තාවකාලික විං කමාන්ඩර් හංචැල්ල මුදියන්සෙලාගේ ලලිත් හේමන්ත හුලංගමුව (01486) පාලන/රෙජි 2004.09.19 ;

තාවකාලික විං කමාන්ඩර් තිලකරත්න මුදියන්සෙලාගේ සමන් ප්‍රසන්න තිලකරත්න (01548) උපකරණ 2005.01.01 ;

තාවකාලික විං කමාන්ඩර් බන්දුල ඒකනායක (01619) කාර්/ඉංජි 2005.01.01 ;

තාවකාලික විං කමාන්ඩර් උදිත ප්‍රසන්ජිත් දන්වත්ත (01564) නි.පො.රා. 2005.04.01 ;

තාවකාලික විං කමාන්ඩර් අජිත් නිශාන්ත සුගුණපාල (01567) මෙහෙයුම්/ගුවන් 2005.05.01 ;

තාවකාලික විං කමාන්ඩර් ලයිලි දාවිඩ් ශිරාන් අබේසිංහ (01569) උපකරණ 2005.05.01 ;

තාවකාලික විං කමාන්ඩර් සමන් දිලන්ත කොටගේ (01572) පාලන/රෙජි 2005.05.01 ;

තාවකාලික විං කමාන්ඩර් මෙතින්ද්‍ර දිල්ෂාන් ජයන්ති වාසගේ (01576) පාලන/රෙජි 2005.05.01 ;

තාවකාලික විං කමාන්ඩර් වර්ණකුලසූරිය වීරකුට්ටිගේ පීටර්සන් දුමාලෝ ප්‍රනාන්දු (01577) පාලන/රෙජි 2005.05.01 ;

තාවකාලික විං කමාන්ඩර් මංජුල මහේෂ් හේමගේ (01579) පාලන/රෙජි 2005.05.01 ;

තාවකාලික විං කමාන්ඩර් සේදිගල්ලගේ සුදිල් දේවප්‍රිය පීරිස් (01581) පාලන/රෙජි 2005.05.01 ;

තාවකාලික විං කමාන්ඩර් රණසිංහ හෙට්ටිආරච්චිරාලලාගේ කමල් ප්‍රියන්ත රණසිංහ (01582) කාර්/ඉංජි 2005.05.01 ;

තාවකාලික විං කමාන්ඩර් මහිලාල් දුශ්‍යන්ත රත්නායක (01583) කාර්/ඉංජි 2005.05.01 ;

තාවකාලික විං කමාන්ඩර් වීරසිංහ මුදියන්සෙලාගේ කුරුල්ලන්මඩුවෙ සුජීව ප්‍රියන්ත වීරසිංහ (01608) උපකරණ 2005.06.01 ;

තාවකාලික විං කමාන්ඩර් තුයියදුර ප්‍රකාශ් මෙන්ඩිස් ගුණසේකර (01602) නි.පො.රා. 2005.06.01 ;

තාවකාලික විං කමාන්ඩර් ක්‍රිශාන්ත මනෝහර ජයනෙත්ති (01605) කාර්/ඉංජි 2005.06.01 ;

තාවකාලික විං කමාන්ඩර් ලක්සිරි දේශප්‍රිය ගුණවර්ධන (01603) කාර්/ඉංජි 2005.06.01 ;

තාවකාලික විං කමාන්ඩර් කාරියවසම් ගෝනාපීනුවල ගමගේ අභයනාත් චාවන් ද සිල්වා (01600) උපකරණ 2005.06.01 ;

තාවකාලික විං කමාන්ඩර් මහානාම නිශ්ශංක ජයවර්ධන (01606) පරිපාලන 2005.06.01 ;

තාවකාලික විං කමාන්ඩර් ඉරිසූරිය ආරච්චිලාගේ හේමසිරි විජේගුණවර්ධන (01613) කාර්/සංඥා 2005.06.01

තාවකාලික විං කමාන්ඩර් මෙල්වන් පෙරෙයිරා (01601) පරිපාලන 2005.06.01 ;

තාවකාලික විං කමාන්ඩර් විරේන්ද්‍ර ප්‍රසන්න බාලසූරිය (01597) පරිපාලන 2005.06.01 ;

තාවකාලික විං කමාන්ඩර් ගන්නිල අමරකෝන් මුදියන්සෙලාගේ වසන්ත අමරකෝන් (01595) කාර්/ඉංජි 2005.06.01 ;

තාවකාලික විං කමාන්ඩර් දේවරාජා මලවරගේ අජිත් (01593) පාලන/රෙජි 2005.06.01 ;

තාවකාලික විං කමාන්ඩර් මුදියන්සෙලාගේ පාලිත සෙනෙවිරත්න (01610) පාලන/රෙජි 2005.06.01 ;

තාවකාලික විං කමාන්ඩර් ජගත් රොහාන් හේමසිංහ (01585) උපකරණ 2005.06.01 ;

තාවකාලික විං කමාන්ඩර් හොල්ලුපතිරගේ දමිත් භාතිය චන්ද්‍රසේකර (01598) පරිපාලන 2005.07.01 ;

තාවකාලික විං කමාන්ඩර් සතරසිංහ ආරච්චිගේ පද්මලාල් පාලිත සතරසිංහ (01609) කාර්/ඉංජි 2005.07.01 ;

තාවකාලික විං කමාන්ඩර් ඉන්දික කමල් වීරරත්න (01611) පාලන/රෙජි 2005.07.01 ;

තාවකාලික විං කමාන්ඩර් හේමසිරි නවරත්නගේ උපුල් විජේවර්ධන (01614) පරිපාලන 2005.07.01 ;

තාවකාලික විං කමාන්ඩර් හේරත් මුදියන්සෙලාගේ බණ්ඩාර හේරත් (01604) කාර්/සංඥා 2005.07.01 ;

තාවකාලික විං කමාන්ඩර් රන්පතිදේවගේ ඉරාන් දයනාත් පිටුවල්ගොඩ (01592) පාලන/රෙජි 2005.07.10.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී.,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය
හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 ජනවාරි මස 13 වැනි දින,
කොළඹ දී.
03-628

---

2006 අංක 72

අංකය : ඩී/ඒඑෆ්/10/ii.

### ශ්‍රී ලංකා ගුවන් හමුදාව

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් දක්වා ඇති දින සිට තාවකාලික විංග් කමාන්ඩර් නිලයට උසස් කෙරේ :–

ස්කොඩ්රන් ලීඩර් කුමුදු රත්නදිවාකර එරමුදුගොල්ල (01588) උපකරණ 2004.07.01 ;

ස්කොඩ්රන් ලීඩර් ධම්මික මදුර බණ්ඩාර වැත්තෑව ( 01561) පරිපාලන 2004.09.01 ;

ස්කොඩ්රන් ලීඩර් සුසන්ත ප්‍රියලාල් පලිහවඩන (01586) උපකරණ 2004.09.01.

ස්කොඩ්රන් ලීඩර් සුමිත් රජීව අමරසිංහ (01596) උපකරණ 2004.09.01

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්.ඩබ්.පී., ආර්.එස්.පී., පී.එස්.සී.,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 පෙබරවාරි මස 21 වැනි දින,
කොළඹ දී ය.
03–633

---

2006 අංක 73

අංකය : ඩී/ඒඑෆ්/වී/64.

### ශ්‍රී ලංකා ස්වෙච්ඡා ගුවන් හමුදාව

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීම

2006 ජනවාරි මස 17 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරියාගේ ශ්‍රී ලංකා ස්වෙච්ඡා ගුවන් හමුදාවේ සේවයෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත :

| *නිලය* | *සම්පූර්ණ නම සහ සේවා අංකය* | *ශාඛාව* |
| --- | --- | --- |
| බලසෘණ නායක | ජනක තුෂාර ඇතුලත්මුදලි (ස්/0285) | කාර්මික ඉංජිනේරු |

ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්.ඩබ්.පී. ආර්.එස්.පී. පී. එස්.සී.,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2005 ජනවරි මස 17 වැනි දින,
කොළඹ දී ය.
03–625

---

2006 අංක 74

අංකය : ඩී/ඒඑෆ්/වී/63.

### ශ්‍රී ලංකා ස්වෙච්ඡා ගුවන් හමුදාව

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීම

2005 දෙසැම්බර් මස 31 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරියාගේ ශ්‍රී ලංකා ස්වෙච්ඡා ගුවන් හමුදාවේ සේවයෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත :–

| *නිලය* | *සම්පූර්ණ නම සහ සේවා අංකය* | *ශාඛාව* |
| --- | --- | --- |
| *බලපංති ලුතිනන්* | අඹේගොඩ ලියන ආරච්චිගේ රන්කෙත් මියුරු විජේරත්න (ස්/0471) | ගු.තො. නි |

ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්.ඩබ්.පී., ආර්.එස්.පී., පී.එස්.සී.,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 ජනවාරි මස 17 වැනි දින,
කොළඹ දී ය.
03–626

---

2006 අංක 75

අංකය : ඩී/ඒඑෆ්/525.

### ශ්‍රී ලංකා ස්වෙච්ඡා ගුවන් හමුදාව

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීම

2006 පෙබරවාරි 10 වැනි දින පහත නම සඳහන් නිලධාරියාගේ ශ්‍රී ලංකා ස්වෙච්ඡා ගුවන් හමුදාවේ සේවයෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත :

| *නිලය* | *සම්පූර්ණ නම සහ සේවා අංකය* | *ශාඛාව* |
| --- | --- | --- |
| බලපංති ලුතිනන් | ලාල් කුමාරසිරි දොලුවීර ( ස්/0357) | උපකරණ |

ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්.ඩබ්.පී., ආර්.එස්.පී., පී.එස්.සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 පෙබරවාරි මස 21 වැනි දින,
කොළඹ දී ය.
03–629

# වෙනත් පත්කිරීම් ආදිය

2006 අංක 77

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව – ස්වෙච්ඡා බලසේනාව**

යුද්ධ හමුදාධිපතිතුමා විසින් අනුමත කරන ලද නිලයෙහි ස්ථිර කිරීමක්

පහත නම සඳහන් නිලධාරී 1998 දෙසැම්බර් මස 19 වැනි දින සිට කපිතන් නිලයෙහි ස්ථිර කිරීම අනුමත කරමි.

නි/3826 තාවකාලික කපිතන් අතපත්තු මුදලිගේ සරත් කුමාර අතපත්තු ශ්‍රීලසසබ.

ජී. එස්. සී. ෆොන්සේකා
ආර්ඩබ්පී, ආර්එස්පී, ආර්සීඩීඑස්, පීඑස්සී,
ලුතිනන් ජනරාල්,
යුද්ධ හමුදාධිපති.

03-618

2006 අංක 76

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

යුද්ධ හමුදාධිපති විසින් අනුමත කරන ලද නිල උසස් කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් දක්වා ඇති දිනවල සිට තාවකාලික කපිතන් (උපකරණ පාලක) වරුන් වශයෙන් උසස් කිරීම අනුමත කර තිබේ :–

1. නි/62766 ලුතිනන් (උපකරණ පාලක) දූවගේ රත්නපාල ප්‍රනාන්දු ශ්‍රීලපාහ - 2004 ජුනි 01 ;
2. නි/64280 ලුතිනන් (උපකරණ පාලක) සමරවීර මුදලිගේ වීරසිංහ ශ්‍රීලයුවෙබ - 2004 ජුනි 01 ;
3. නි/64374 ලුතිනන් (උපකරණ පාලක) රත්නායක මුදියන්සේලාගේ රත්නායක ගරෙ - 2004 සැප්තැම්බර් 07

ජී. එස්. සී. ෆොන්සේකා, ආර්ඩබ්පී, ආර්එස්පී, ආර්සීඩීඑස්, පීඑස්සී,
ලුතිනන් ජනරාල්,
යුද්ධ හමුදාධිපති.

2006 ජනවාරි මස 04 වැනි දින,
යුද්ධ හමුදා මූලස්ථානය,
කොළඹ.
03-681

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : කේ/18/5093/කේවයි 3/772.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.07.15 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

"1. මාතලේ ප්‍රසිද්ධ නොතාරිස් ටී.එම්. වරුසවිතාන විසින් සහතික කරන ලද, 2002.06.10 දින හා අංක 3776 දරන උකස් බැඳුම්කරය මත අය වියයුතු මුදල් ගෙවීම, දෙහිවල පදිංචි, වර්ණකුලසූරිය අදිරිස්ට සෙම්බකුට්ටිගේ නිරංජන වර්ණකුලසූරිය හා මනිවෙල් දූරගේ ඉන්ද්‍රානි සිල්වා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2005.06.19 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් හාරලක්ෂ පන් දහස් අටසිය හතලිස් තුනයි ශත විසිඅටක (රු. 4,05,843.28) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 3776 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය හතලිහයි ශත පනස් හතර (රු. 140.54) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, ගම්පහ, උසාවිය පාර, ස. ණ. ස චතුරශ්‍රය, අංක 15හි බලයලත් වෙන්දේසිකාර ටී. එම්. එස්. පීරිස් මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.".

### උපලේඛනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය සභා සීමාව තුළ කොරොස්ස ග්‍රාමයේ පිහිටි දෙල්විට සිට කටුපිලගොල්ල හන්දිය දක්වා දිවෙන ප්‍රධාන මාර්ගයේ පිහිටි පතින්ගිගොල්ල සහ වේරගොල්ල ලෙස හඳුන්වනු ලබන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ජී. එස්. ගලගෙදර විසින් 1997.01.23 වන දිනැති (1996.12.30 දින මනින ලදුව හා 1997.01.10 දින සිට 15 දින දක්වා කැබලි කරන ලද) හා අංක 5384 දරන පිඹුරේ කැබලි අංක 133, 134, 135ඒ, 135බී, 139 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 3, පර්. 11 ක් වූ ඒකාබද්ධ බිම් කොටස් හා ඒ මත පිහිටි සියලු දේත් සමඟ වේ.

ඉහත කී කැබලි අංක 133, 134, 135ඒ, 135බී හා 139 ලෙස දක්වා ඇති බිම් කොටස් ජී. එස්. ගලගෙදර මිනින්දෝරුතැනගේ 1996.12.30 වෙනි දින හා අංක 5373 දරන පිඹුරේ කැබලි අංක 1 හා 2 ලෙස දක්වා ඇති බිම් කොටස්වල නැවත මැනීමක් වේ.

තව ද, එකී පිඹුරු අංක 5384 හි කැබලි අංක 138 (අඩි 20ක් පළල පාර ) මතින් ඇති මාර්ග අයිතිය ද සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන* සාමාන්‍යාධිකාරී.

2006 මාර්තු මස 17 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.
03-735/10

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : ජීපී/02/01612/කේ2/310.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.08.22 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

"1. ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එල්.සිල්වා විසින් සහතික කරන ලද, 2002.11.26 දින හා අංක 1499 දරන උකස් බැඳුම්කරය මත අය වියයුතු මුදල් ගෙවීම, වැලිවේරිය, පදිංචි හබරකඩගේ අයිරාංගනී පෙරේරා සහ ගාර්දි හේවගේ රංජිත් පෙරේරා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2005.07.25 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් හාරලක්ෂ තුන්දහස් පන්සිය තිස්පහයි ශත පහක (රු. 4,03,535.05) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 1499 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය හතලිස් එකයි ශත නවය (ර. 141. 09) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, ගම්පහ, උසාවිය පාර, ස. ණ. ස. චතුරශ්‍රය, අංක 15හි බලයලත් වෙන්දේසිකාර ටී. එම්. එස්. පීරිස් මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.".

### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ප්‍රාදේශීය සභාවේ හෙනරත්ගොඩ උප කාර්යාල සීමාව තුල වැලිවේරිය නැගෙනහිර පිහිටි කුරුගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එල්. ජේ. ලියනගේ විසින් 2001.12.01 දින සකසන ලද අංක 8640 දරන මිනුම් පිඹුරේ කැබලි අංක 1 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, ප.11 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන* සාමාන්‍යාධිකාරී.

2006 මාර්තු මස 17 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.
03-735/1

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 9/65074/ඉසඩ්9/635.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.09.08 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

"1. තංගල්ල ප්‍රසිද්ධ නොතාරිස් එච්. එන්. පී. නිශාන්ත විසින් සහතික කරන ලද, 1999.03.03 දින හා අංක 364 දරන උකස් බැඳුම්කරය මත අය වියයුතු මුදල් ගෙවීම, දික්වැල්ල පදිංචි පලවින්නගේ සජ්ජිත ජිනතුංග යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2005.07.31 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් දෙලක්ෂ හතලිස් හත්දහස් නවසිය තිස් දෙකයි ශත අසූ එකක (රු. 2,47,932.81) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 364 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් හැත්තෑ හතයි ශත හැත්තෑ හය (රු. 77.76) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කොළඹ 12, අළුත්කඩේ වීදිය, අංක 99, සේන හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම හි බලයලත් වෙන්දේසිකාර ටී. සී. සේනානායක මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.".

### උපලේඛනය

මාතර දිස්ත්‍රික්කයේ, දික්වැල්ල ප්‍රාදේශීය සභා සීමාවේ දික්වැල්ල පිහිටි මහවෙල පාර, වරිපනම් අංක 89/4 පතහිවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ලක්ෂ්මන් සේරසිංහ විසින් සකසන ලද 1997.04.07 දින සහ අංක 121 දරන පිඹුරේ කැබලි අංක 2 ලෙස දක්වා ඇති (එකී කැබලි අංක 2 බලයලත් මිනින්දෝරු ටී.සී. ඩී. අබේගුණවර්ධන විසින් සකසන ලද 1947.02.20 දිනැති අංක 1013 දරන පිඹුරේ නැවත මැණුමකි) ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, ප. 38.25ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන* සාමාන්‍යාධිකාරී.

2006 මාර්තු මස 17 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.
03-735/4

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 12/60993/ඩී12/222.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2002.06.27 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

"1. බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් අයි. එම්. පී. ආනන්ද විසින් සහතික කරන ලද, 1997.07.14 දින හා අංක 5190 දරන උකස් බැඳුම්කරය මත අය වියයුතු මුදල් ගෙවීම, වැලිමඩ පදිංචි කොන්ඩසිංහ රාජමන්ත්‍රීලාගේ ආනන්ද රාජමන්ත්‍රී යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2002.04.30 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් එක්ලක්ෂ අනූතුන්දහස් දෙසිය තිස් නවයයි ශත අනූ එකක (රු. 1,93,239.91) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 5190 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් හැත්තෑ තුනයි ශත පනහ (රු. 73.50) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, බදුල්ල, කළුගල්පිටිය, අංක 48/1හි බලයලත් වෙන්දේසිකාර ඩබ්ලිව්. ජයතිලක මහතාට බලය පැවරිය යුතු වන්නේය.".

### උපලේඛනය

බදුල්ල දිස්ත්‍රික්කයේ, වැලිමඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ දඹවින්නේ පිහිටි බන්නැක්ගෙදරවත්ත පරණ වලව්වේවත්ත , කම්මල්වත්ත පීලිකැලේවත්ත, අලුත්වලව්වත්ත *හෙවත්* ළිඳවත්ත, කොස්වත්ත, හීන්නාරන්ගහකොරටුව නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එච්.එම්. සමරනායක විසින් පිළියෙල කරන ලද 1996.08.23 දින දරන අංක 524 දරන පිඹුරේ කැබලි අංක 3 සහ පීල්ලෙකැලේවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එච්. එම්. සමරනායක විසින් සකසන ලද 1996.09.16 දින හා අංක 553 දරන පිඹුරේ කැබලි අංක 1 වශයෙන් දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, ප. 20.2ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස් සහ ඒ මත පිහිටි සියලු දේත් සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන* සාමාන්‍යාධිකාරී.

2006 මාර්තු මස 17 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.
03-735/3

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුනු යෝජනාව

ණය අංකය : 9/68216/ඉසඩ්/9/675.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2002.08.14 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

"1. මාතර ප්‍රසිද්ධ නොතාරිස් සී. ඩබ්ලිව්. ගුණවර්ධන විසින් සහතික කරන ලද, 1999.10.26 දින හා අංක 16790 දරන උකස් බැඳුම්කරය මත අය වියයුතු මුදල් ගෙවීම, තිහගොඩ පදිංචි සුසන්ත රංජිත් ජයවික්‍රම *හෙවත්* ජයවික්‍රම කන්කානම් ආරච්චිගේ රංජිත් සහ කෝදාගොඩ ආරච්චිගේ චූලා පද්මිණී යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2002.07.07 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් දෙලක්ෂ දෙදහස් අටසියපනස් නවයයි ශත විසි නවයක (රු. 2,02,859.29) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 16790 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් අසූපහයි ශත හතලිස් නවය (රු. 85.49) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, මාතර, කොටුව, විල්fප්‍රඩ් ගුණසේකර මාවත, අංක 39 හි බලයලත් වෙන්දේසිකාර එම්. එච්. පී. සිරිවර්ධන මහතාට බලය පැවරිය යුතු වන්නේය.".

### උපලේඛනය

මාතර දිස්ත්‍රික්කයේ, තිහගොඩ ප්‍රාදේශීය සභා සීමාවේ නායිම්බල ග්‍රාමයේ පිහිටි මද්දුමගේවත්ත *හෙවත්* දෙල්ගහමද්දුමගේවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු සී. එස්. ජයවර්ධන විසින් සකසන ලද 1997.02.27 දින සහ අංක 5609 දරන මිණුම් පිඹුරේ කැබලි අංක බී ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 2, ප. 11.45 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 මාර්තු මස 17 වැනි දින,
අංක 269, ගාලු පාර, කොළඹ 03.
03-735/12

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 18/66592/වයි18/644.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.11.03 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

"1. කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් වී. අමරසේකර විසින් සහතික කරන ලද, 1999.08.18 දින හා අංක 6648 දරන උකස් බැඳුම්කරය මත අය වියයුතු මුදල් ගෙවීම, සෝලේපුර පදිංචි ඉලංගකෝන් මුදියන්සේලාගේ කරුණාරත්න යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2005.09.30 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් දෙලක්ෂ අසූදෙදහස් දෙසිය දාහතරයි ශත හැටක (රු. 2,82,214.60) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 6648 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය දෙකයි ශත හැටතුන (රු.102.63) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කෝට්ටේ, පිටකෝට්ටේ, අංක 474, මහානාම ඩ්‍රයිව් හි බලයලත් වෙන්දේසිකාර ආර්. එස්. මහානාම මහතාට බලය පැවරිය යුතු වන්නේය.".

### උපලේඛනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පැරකුම්පුර ගමේ පිහිටි රාජාංගන වම් ඉවුරු යාය, 3, පෝරම්වත්ත නමැති ඉඩමේ බී. ජී. බන්දුතිලක බලයලත් මිනින්දෝරුතැන විසින් මැන සකසන ද 1998.07.14 දින හා අංක 4069/98 දරන පිඹුරේ ප්‍රකාර බෙදා වෙන් කරන ලද කැබලි අංක 1 දරන ප්‍රමාණයෙන් අ. 1, රූ. 0, පර්. 3ක් වූ බිම් කොටස වේ.

තවද, එකී අංක 4069/98 පිඹුරේ පෙන්නුම් කරනු ලබන මාර්ග අයිතීන් ද සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 මාර්තු මස 17 වැනි දින,
අංක 269, ගාලු පාර, කොළඹ 03.
03-735/13

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 1/4073/සීඑම්2/362.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2004.01.29 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. සී. බී. ජෝෂප් විසින් සහතික කරන ලද, 1984.12.17 දින හා අංක 677 දරන උකස් බැඳුම්කරය මත අය වියයුතු මුදල් ගෙවීම, රත්මලාන පදිංචි මනන්ඩයස් මුදලිගේ චූලා ලක්කන සෙනරත් ඩයස් යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2003.12.31 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් පහලොස් ලක්ෂ පනස් දෙදහස් තුන්සීයයි ශත අනූහතක (රු.1,552,300.97) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 677 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය හතලිස් දෙකයි ශත තුනක (රු. 142.03) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, පන්නිපිටිය, හයිලෙවල් පාර, අංක 145 හි බලයලත් වෙන්දේසිකාර එම්. සමරනායක මහතාට බලය පැවරිය යුතු වන්නේය.

### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාවේ රත්මලාන පිහිටි දැන් රත්මලාන පළවන පටුමග වරිපනම් අංක 27ඒ දරන ආණ්ඩුවේ කුරුඳුවත්ත ලෙස හඳුන්වනු ලබන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු බී.එච්. ඒ. ද සිල්වා විසින් 1984.11.20 දින සකසන ලද අංක 350 දරන මිණුම් පිඹුරේ කැබලි අංක බී 10බී ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 26.6 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 මාර්තු මස 17 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.
03-735/14

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 2/61395/එන්2/964, 2/74271/කේ2/464.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2004.09.10 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. මාසිංහ සහ ටී. ඩබ්. කරුණාරත්න විසින් සහතික කරන ලද, 1997.03.18 සහ 2003.04.03 දින හා අංක 115 සහ 5627 දරන උකස් බැඳුම්කරය මත අය වියයුතු මුදල් ගෙවීම, කඩවත, පදිංචි මලල බණ්ඩාරලාගේ ගීතිකා ලක්ෂමී නානායක්කාර (විවාහයට පෙර රත්නතිලක) සහ අඹගහදූවගේ දොන් කිංස්ලි ඩයස් නානායක්කාර යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද,2004.08.24 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් පන්ලක්ෂ අසූ හයදහස් හයසිය දාහතයි ශත දොළහක (රු. 5,86,617.12) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 115 සහ 5627 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් දෙසිය හතලිස් හයයි ශත දෙකක (රු. 246.02) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, ගම්පහ, උසාවිය පාර, සණස චතුරශ්‍රය, අංක 15හි බලයලත් වෙන්දේසිකාර ටී.එම්.එස්. පීරිස් මහතාට බලය පැවරිය යුතු වන්නේය.

### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, නාරංවල (උප කාර්යාලය) මහර ප්‍රාදේශීය සභා සීමාව තුළ ගෝනහේන පිහිටි ගෝනහේන වත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු කේ. ඒ. පි. කස්තුරිරත්න විසින් 1989.09.09 වන දින සහ අංක 2555/ඩී දරන පිඹුරේ කැබලි අංක 17 ප්‍රකාර මැන සකසන ලද ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 10.4ක් වූ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස සහ ඊට අයිති සියලු දේත් සමඟ වේ.

තවද, එකී පිඹුරු අංක 2555/බී දරණ පිඹුරේ දැක්වෙන කැබලි අංක 23, 21 සහ 22 දරන ඉඩම් කැබලි මතින් පිහිටා ඇති මාර්ග අයිතීන් ද සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 මාර්තු මස 17 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.
03-735/7

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 9/63582/ඉසඩ් 9/489

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.10.19 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ආර්. ධර්මවර්ධන විසින් සහතික කරන ලද, 1997.12.30 දින හා අංක 577 දරන උකස් බැඳුම්කරය මත අය වියයුතු මුදල් ගෙවීම, ඌරුබොක්ක,පදිංචි තල්පාවිල කන්කානම්ගේ අනිල් ප්‍රභාත් යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2005.09.13 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් තුන්ලක්ෂ අනූනවදහස් එකසිය පනස් නවයයි ශත විසි එක (රු. 3,99,159.21) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 577 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් අසූපහයි ශත පනස් පහක (රු. 85.55) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කොළඹ 12, අළුත්කඩේ වීදිය, අංක 99, හි බලයලත් වෙන්දේසිකාර ටී.සී. සේනානායක මහතාට බලය පැවරිය යුතු වන්නේය.

### උපලේඛනය

මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත් සතර මාතර ප්‍රාදේශීය සභා සීමාවේ තල්පාවිල පිහිටි කළුවාගහහේන නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ෆෙඩ් විජයවීර විසින් මැන සකසන ලද 1977.11.17 දින සහ අංක 2133ඒ දරණ පිඹුරේ ප්‍රකාර බෙදා වෙන් කරන ලද ප්‍රමාණයෙන් අ. 0, රූ. 3, පර්. 12 කින් යුත් කැබලි අංක 2 දරන බිම් කොටස සහ ඊට අයිති සියලු දේත් සමඟ වේ.

තවද, එකී පිඹුරේ සඳහන් කැබලි අංක 2බී (අඩි 10 පළල ) සහ කැබලි අංක 2ඒ දරන (අඩි 7ක් පළල ) බිම් කොටස් මතින් දක්වා ඇති මාර්ග අයිතීන්ද සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 මාර්තු මස 17 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.
03-735/11

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 6/42560/එච්6/631

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005..08.22 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. කළුතර ප්‍රසිද්ධ නොතාරිස් පී. ඩී. හෙට්ටිආරච්චි විසින් සහතික කරන ලද, 2001.10.19 දින හා අංක 1662 දරන උකස් බැඳුම්කරය මත අය වියයුතු මුදල් ගෙවීම, දොඩන්ගොඩ පදිංචි, ජාමුනි නිශාන්ත සිල්වා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2005.07.25 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් එක්ලක්ෂ හැටහයදහස් හත්සිය හැටහතයි ශත විසිදෙකක (රු. 1,66,767.22) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 1662 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් හැටතුනයි ශත දාසයක් (රු 63.16) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, පානදුර, ඩයස් ගොඩනැගිල්ලේ හි බලයලත් වෙන්දේසිකාර එච්. ගිල්ටන් පෙරේරා මහතාට බලය පැවරිය යුතු වන්නේය.

### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර උතුර තොටමුණේ කළුතර බැද්ද, කළුතර ප්‍රාදේශීය සභා සීමාවේ පලාතොට ග්‍රාමයේ පිහිටි ගොඩපොරගහහේන නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු වයි. පී. ද. සිල්වා විසින් සකසන ලද 2000.09.30 දිනැති හා අංක 931 බී දරණ මිනුම් පිඹුරේ (එකී කැබලි අංක 12 බලයලත් මිනින්දෝරු වයි. පී. ද. සිල්වා විසින් 2000.08.31 දිනැති හා අංක 931 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 1 හි උප බෙදුමකි) කැබලි අංක 12 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 10 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමඟ වේ.

තවද, එකී අංක 931 බී මිණුම් පිඹුරේ දැක්වෙන මාර්ග අයිතීන් සහ බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. සිල්වා විසින් 1945.08.20 දිනැති හා පිඹුරු අංක 1495 හි දැක්වෙන මාර්ග අයිතිය ද සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 මාර්තු මස 17 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.
03-735/9

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 10/74877/ඩී10/651

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.11.03 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. තංගල්ල ප්‍රසිද්ධ නොතාරිස් ඒ. පී. එස්. ආර්. ගුණසේකර විසින් සහතික කරන ලද, 2004.03.27 දින හා අංක 9752 දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම, හුංගම පදිංචි, අබේසිං වීරවර්න සමන් ප්‍රියංකර *හෙවත්* සමන් ප්‍රියංකර වීරවර්න *හෙවත්* අබේසිංහ වීරවර්න සමන් ප්‍රියංකර යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2005.09.30 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් හාරලක්ෂ හැත්තෑ හයදහස් එකසිය පනහයි ශත හැට අටක (රු. 4,76,150.68) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 9752 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය තිස් නවයයි ශත හැත්තෑ දෙකක (රු.139.72) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, ගම්පහ, උසාවිය පාර, සණස චතුරශ්‍රය, අංක 15හි බලයලත් වෙන්දේසිකාර ටී. එම්. එස්.පීරිස් මහතාට බලය පැවරිය යුතු වන්නේය.

### උපලේඛනය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අම්බලන්තොට ප්‍රාදේශීය සභා සීමාවේ, කිවුල ග්‍රාමයේ පිහිටි කිවුලකැලේ නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඊ, එම්. ප්‍රේමසිරි විසින් සකසන ලද 1996.12.17 දිනැති හා 1029 දරන මිනුම් පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 1, රූ. 0, පර්. 0 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 මාර්තු මස 17 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.
03-735/6

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 6/40023/එච්6/031

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.10.19 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. ඩබ්. එස්. එස්. වීරසිංහ විසින් සහතික කරන ලද, 2000.10.08 දින හා අංක 1076 දරන උකස් බැඳුම්කරය මත අය වියයුතු මුදල් ගෙවීම, පිලියන්දල පදිංචි ගීකියනගේ දොන් ඉන්දික හරිශ්චන්ද්‍ර යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2005.09.21 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් දෙලක්ෂ තිස් දෙදහස් නවසිය විසි තුනයි ශත අසූවක (රු. 2,32,923.80) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 1076 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් අසූ හතයි ශත හතරක (රු. 87.04) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, පානදුර, ඩයස් ගොඩනැගිල්ලේ හි බලයලත් වෙන්දේසිකාර එච්. ගිල්ටන් පෙරේරා මහතාට බලය පැවරිය යුතු වන්නේය.

### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ, පළන්නොරුව ග්‍රාමයේ පිහිටි ගොඩපොරගහවත්ත නමැති ඉඩමෙන් මිනින්දෝරු කේ. කන්නන්ගර විසින් මැන සකසන ලද 1998.11.21 දින හා අංක 1084ඒ/1998 දරන පිඹුරේ කැබලි අංක 3 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 12 ක් වූ බෙදා වෙන් කල බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමඟ වේ.

තවද, එකී පිඹුරේ කැබලි අංක 4 මතින් ඇති මාර්ග අයිතිය ද සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
වැඩබලන සාමාන්‍යාධිකාරී.

2006 මාර්තු මස 17 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.
03-735/2

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 2/64955/ඒ2/688

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.11.03 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. වෙන්නප්පුව ප්‍රසිද්ධ නොතාරිස් එච්. ජේ. ඩී.ෆොන්සේකා විසින් සහතික කරන ලද, 1998.11.01 දින හා අංක 14306 දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම, වැල්ලවගෙදර පදිංචි හඳුන්කුට්ටි පතිරන්නැහැලාගේ ලූෂන් දනේශ් නුවන්සිරි සහ හඳුන්කුට්ටි පතිරන්නැහැලාගේ හේමවර්ධන සහ ජයසේකර මුදලිගේ අමරාවතී යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2005.10.06 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් දොළොස් ලක්ෂ වි සිපන්දහස් දෙසීය විසිපහයි ශත හතලිස් හතක (රු. 12,25, 225.47) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 14306 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් හාරසිය පනස් පහක (රු 455.00) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, මීගමුව ප්‍රනාන්දු මාවත, අංක 22හි බලයලත් වෙන්දේසිකාර ඩබ්ලිව්. පී. සී. පෙරේරා මහතාට බලය පැවරිය යුතු වන්නේය.

### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, දිවුලපිටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ (කෙහෙල්ඇල්ල උප කාර්යාලයේ) මූකලන්ගෙදර පිහිටි දන්ගහකරුඅඳ කුඹුර නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ටී. සී. එස්. ප්‍රනාන්දු විසින් සකසන ලද 1978.10.04 දිනැති හා අංක 195/1978 දරන මිණුම් පිඹුරේ ප්‍රකාර බෙදා වෙන් කරන ලද ප්‍රමාණයෙන් අ. 2, රූ. 0, ප. 37.50 ක් වූ බිම් කොටස සහ ඊට අයිති සියලු දේත් සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
වැඩබලන සාමාන්‍යාධිකාරී.

2006 මාර්තු මස 17 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.
03-735/5

---

## මහජන බැංකුව - ගාල්ල මහවීදිය (169)

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වන වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වන වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.09.20 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

"ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඒ. ඩී. එම්. පීරිස් විසින් සහතික කරන ලද 1999.11.26 දිනැති අංක 2588 දරන උකස්ප්‍රකාර ගෙවීම, උඩුවැල්ල දූරගේ පත්මා ජයන්ති සහ යක්ගහ හේවගේ රත්නසිරි යන අයවලුන් විසින් පැහැර හැර ඇති බැවි න් ද, එකී උකස්කරයන් යටතේ දැනට රුපියල් දෙලක්ෂ තිස්දහස් දෙසිය හැත්තෑවයි ශත අනූවක(රු.2,30,270.90) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින්ද, 2004.12..23 දින සිට වර්ෂයකට 25% බැගින් රුපියල් දෙලක්ෂ තිස්දහස් දෙසිය හැත්තෑවයි ශත අනූවක(රු.2,30,270.90) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29 එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් දෙලක්ෂ තිස්දහස් දෙසිය හැත්තෑවයි ශත අනූවක(රු.2,30,270.90) මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද විසින් එකී අංක 2588 දරන උකස්කරයන් යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.".

### දේපළ පිළිබඳ විස්තර

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතරතුල කිතුලම්පිටිය පිහිටි දෙල්ගහවත්ත, බෙදාවෙන් කළ අංක 4 දරන කැබැල්ල යලි බෙදූ ඒ අක්ෂරය දරන කැබැල්ලට බලයලත් මිනින්දෝරු ජී. එච්. ජී. ඒ. ඒ. ද සිල්වා මහතා විසින් 1985.11.16 දින මැන සාදන ලද අංක 541 දරණ පිඹුර ප්‍රකාර මායිම් උතුරු-නැගෙනහිරට : ගම්සභා පාරද, දකුණු-නැගෙනහිරට : මෙම ඉඩමේ කැබලි අංක 5 ද, දකුණු-බටහිරට : අමුකනත්ත සහ උතුරු-බටහිරට : මෙම ඉඩමේ ලොට් අංක 3 ද යන මෙකී මායිම් තුල පිහිටි පර්චස් දහතුනක් විශාල (අ. 0, රූ. 0, පර්. 13) ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි වැව්ලි ඇතුළු සියලු දේද වේ.

එහි අංක ඒ දරණ කැබැල්ල පහත සඳහන් පරිදි නැවත විස්තර කර ඇත.

ඉහත කී කිතුලම්පිටිය පිහිටි දෙල්ගහවත්ත නැමති ඉඩමේ කැබලි අංක 4 ට මායිම්, උතුරට : මෙම ඉඩමේ කැබලි අංක 2, නැගෙනහිරට : මෙම ඉඩමේ කැබලි අංක 5, දකුණට : තම්බුඅප්පුහාමිගේ අමුකනත්ත සහ බටහිරට : මෙම ඉඩමේ කැබලි අංක 3 යන මායිම්තුල වූ පර්චස් දහතුනයි දශම හයයි තුනයි (අක්කර 0, රූඩ් 0, පර්චස් 13.63) විශාල ඉඩම ද වේ.

මෙය ඉඩම ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඒ 546/09 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
ප්‍රාදේශීය කළමනාකරු,
ගාල්ල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය.
නො. 22, පහළ ඩික්සන් පාර,
ගාල්ල.
03-708

---

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව-කටුනායක ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්ති යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2006.02.23 දින පවත්වන ලද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් රංගනී ද අල්විස් විසින් සහතික කරන ලද්දාවූ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දාවූ ද 2004.06.23 දින හා අංක 1146 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල ගෙවීම වීරගොඩ කපුගේ ප්‍රින්සි තමාරා පුෂ්පමාලී යන අය ණයකරු හැටියට, පැහැර ඇති හෙයින් එකි බැඳුම්කරය යටතේ රුපියල් එකොලොස් ලක්ෂ හැට අටදහස් හත්සිය හතලිස් හතයි ශත හැටක (රු. 11,68,747.60) මුදලක් 2005.06.30 දින වන විට සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 11,68,747.60ක මුදලට 2005.07.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1146 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද, දේපළ සහ පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එන්. එච්. පී. එෆ්. ආරියරත්න මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (වි ශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, රාගම් පත්තුවේ, කටානේ, ජා-ඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, කොටුගොඩ, කුරුඳුවත්තේ, ඒකල පිහිටි 'ඕටිස්' ඉඩම නමින් හඳුන්වන ලබන ඉඩමට බලයලත් මානක එම්. ටී. රත්නායක විසින් මැන සාදන ලද 2001.09.20 දිනැති අංක 1863 දරන පිඹුර ප්‍රකාර ලොට් ජී25 ලෙස බෙදා වෙන් කරන ලද ඉඩම උතුරට : බලයලත් මානක එම්. ටී. රත්නායක විසින් 2001.01.22 දින මැන සාදන ලද 1818 දරන පිඹුර ප්‍රකාර ලොට් ආර් 60 ද, නැගෙනහිරට : මෙම පිඹුරේ ලොට් ජී24 ද, දකුණට : බලයලත් මානක එම්. ටී. රත්නායක විසින් 2001.01.22 දිනැති 1818 දරන පිඹුර ප්‍රකාරව ලොට් ආර් 61 (මීටර් 6ක් පළල පාරක් සඳහා වෙන් කරනලද ඉඩම) සහ බටහිරට : මෙම පිඹුරේම ලොට් ජී. 26 ද, මායිම් වූ පර්චස් හතයි දශම හතයි හයයි පහ (අ. 0, රූ. 0, පර්. 7.765)ක් විශාලත්වය ඇති ඉඩම සහ ඊට අයත් ගහකොළ ආදී සියලු දේත් සමඟ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 183/201හි ලියාපදිංචි කර ඇත.

ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඩී. අල්විස් විසින් 2004.06.23 දින ලියා සහතික කරන ලද අංක 1146 දරන බැඳුම්කරයට අනුව මාර්ග අයිතිය ද සමඟ වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති),
මණ්ඩලයේ ලේකම්.

03-734

මුද්‍රණය හා බෙදාහැරීම සීමාසහිත ශ්‍රී ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසිනි.
www.documents.gov.lk

# ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

## ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය

(1984 අංක 18 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද්දකි)

### ශ්‍රී ලංකා ලංකා මුද්‍රණ ආයතනය

(ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය)

**ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය මෙහෙයවන පරිඝනක අකුරු ඇමිණීමේ සහ පරිඝනක මුද්‍රණය පිළිබඳ පාඨමලාව**

### Certificate Course in Computer Typesetting & Desk Top Publishing

ශ්‍රී ලංකාවේ මුද්‍රණ හා ග්‍රැෆික් ක්ෂේත්‍රයන්ට අදාල පාඨමාලා හඳුන්වාදීමේ අද්විතීය ස්ථානයක් ලබා සිටින ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය එම ක්ෂේත්‍රයට අදාල දැනුම, හැකියා, දක්ෂතා සහ විශේෂඥතා ඥානය ප්‍රවර්ධනය කිරීම සඳහා කැපවී කටයුතු කරයි.

වර්ෂ 1984දී පාර්ලිමේන්තු ආඥාපනතක් මගින් ස්ථාපනය කරන ලද මෙම ආයතනය මුද්‍රණ හා ග්‍රැෆික් ක්ෂේත්‍රයට අදාල පහත සඳහන් පාඨමාලාව අප්‍රේල් අග භාගයේදී ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත.

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය මගින් පවත්වනු ලබන මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර එය ග්‍රැෆික් ක්ෂේත්‍රයේ පවතින් ඉහල රැකියා ඉල්ලුමට සරිලන පාඨමාලා අන්තර්ගතයකින් සකසා ඇත.

මෙම පාඨමාලාව ග්‍රැෆික්, ප්‍රචාරක, මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට ඇතුළත්වීමට බලාපොරොත්තු වන නවකයන් සඳහා විශේෂයෙන් සැකසුණු පාඨමාලාවකි. පරිගණක ආධාරයෙන් අකුරු ඇමිණීම පිළිබඳව පුළුල් අවබෝධයක් මින් ලබාදෙන අතර මුල සිටම පරිගණක භාවිතය සහ මෘදුකාංග අධ්‍යයනය (Computers and Software applications) පිළිබඳව මනා දැනුමක් හා සිත්තම් නිර්මාණය පිළිබඳ මූලික අවබෝධයක් ද ලබාදෙන අතර, මෙම පාඨමාලාව අනෙකුත් ග්‍රැෆික්ස් පාඨමාලා, හැදෑරීමට අවශ්‍ය පූර්ණ දැනුම හා අවබෝධය ලබාදෙයි.

පාඨමාලා කාලය - මාස 05යි
මාධ්‍යය - සිංහල/ඉංග්‍රීසි

### පාඨමාලා අන්තර්ගතය
### Course Contents

**Introduction to Computers**
(Hardware & Software for Desktop Publishing)
Basics of Computers
Introduction to Windows Operating System

**Keyboard Training & Fonts**
Exposure/Training to the Keyboard (Typing Speed for Sinhala, English and Tamil Language)
Introduction to font families

**Word Processing using MS Word**
Creating, Saving, Open new documents and templates, font styles effects and leading, Paragraph specifications, Tables and Tabs, letter formats, Mail merge and create layouts using MS Word.

**Page make-up methods —Adobe PageMaker**
Using the Menus, Creating a Publication, Formating text, Adding Graphic Elements, Typing text in Page Maker, Managing PM files, Setting up the Page layout, Manipulating Pages Printing from page maker, Using the text tools, Working with text blocks, Using story editor, Formatting Paragraphs, Setting Tabs and Indents, Creating Style Sheets, Importing and flowing text, Drawing and Importing Graphics, Working with Colour, Using the Table Editor, Setting up Master Pages and creating templates.

**Page Make-up methods using QuarkXpress**
Basic of QuarkXpress, Creating, Opening and Saving Documents, Importing and Editing Text, Formating Text and Using Style Sheets, Importing and Editing Graphics, Using Colour, Managing Long Documents and Printing.

***Note*** : Additionally Tamil Language classes will be held free of charge on Saturdays (1.30 p. m. to 4.30 p. m.)15 Hrs.

මෙම පාඨමාලාවන්ට ඇතුළත්වීමට ඇති ඉඩකඩ සීමාසහිත නිසා සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව තෝරාගනු ලබන අපේක්ෂකයන්ට පමණක් පාඨමාලාව හැදෑරීමට අවස්ථාවක් ලැබේ. පාඨමාලා සාර්ථකව නිම කරන සිසුන්ට රජය පිළිගත් සහතිකයක් පිරිනැමේ.

*විමසීම්* :

ලේඛකාධිකාරී.
ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08
ටෙලිෆෝන් : 2686162/2679791
ෆැක්ස් : 2686162
ඊ මේල් : silopreg@sltnet.lk